71 වන කාණ්ඩය
27 වන කලාපය

සෙනසුරාදා
1967 ජූනි 3

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 4349]

වරප්‍රසාද ප්‍රශ්නය : ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත් කෙටුම්පත පිළිබඳව ලංකා ගුවන් විදුලි සංස්ථාව කළ ප්‍රවෘත්ති ප්‍රකාශය [තී. 4390]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා [තී. 4391]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 71
இல. 27

சனிக்கிழமை
3 ஜூன், 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 4349]

சிறப்புரிமை வினா : இந்திய-இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) மசோதா பற்றி இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனச் செய்தி : ஒலிபரப்பு [ப. 4390]

தனியங்கத்தினர் பிரேரணைகள் [ப. 4391]

---

Volume 71
No. 27

Saturday,
3rd June 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 4349]

QUESTION OF PRIVILEGE : C.B.C. NEWS BROADCAST ON INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) BILL [Col. 4390]

PRIVATE MEMBERS' MOTIONS [Col. 4391]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

---

**1967 ජූනි 3 වන සෙනසුරාදා**

சனிக்கிழமை, ஜூன் 3 1967

*Saturday, 3rd June 1967*

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [සී. එස්. ෂර්ලි කොරයා මයා.] මූලාසනාරූඪ විය.**

சபை பி. ப. 2 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### සොලිසිටර් ජනරාල් : රාජ්‍ය භාෂා දැනුම

சொலிஸிட்டர் ஜெனரல் : அரசகரும மொழித் தேர்ச்சி

SOLICITOR-GENERAL : PROFICIENCY IN OFFICIAL LANGUAGE

1. ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)

(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறாதுவ)

(Mr. Prins Gunasekera—Habaraduwa)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ලංකාවේ සොලිසිටර් ජනරාල් ධුරයට එංගලන්තයේ සිට නිලධාරියෙකු කැඳවා ගත්තේද ? (ආ) මේ සොලිසිටර් ජනරාල්වරයාගේ සේවය ලබා ගත්තේ ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලවද ? (ඉ) මේ සොලිසිටර් ජනරාල්වරයාට අධිකරණය හමුවේ රාජ්‍ය භාෂාව භාවිතය කරමින් සිය රාජකාරි ඉටුකළ හැකිද ? (ඊ) අද ඔහුට එසේ කළ නොහැකි නම්, රාජ්‍ය භාෂාවෙන් සිය රාජකාරි ඉටු කිරීමට ඔහු සමත්වනුයේ කවදාද ? (උ) මින් මතුවත් අධිකරණ හෝ නීති කටයුතු උදෙසා නව පත්වීම් දීමේදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව ක්‍රියා කිරීමට ප්‍රතිඥාවක් දෙනවාද ?

நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) இலங்கை சொலிஸிட்டர் ஜெனரல் பதவிக்கு இங்கிலாந்திலிருந்து ஓர் உத்தியோகத்தர் வரவழைக்கப்பட்டாரா? (ஆ) இலங்கை அரசாங்கத்தின் அரசகருமமொழிக் கொள்கைக்கு அமையவா இந்த சொலிஸிட்டர் ஜெனரலின் சேவை பெற்றுக்கொள்ளப்பட்டது? (இ) இந்த சொலிஸிட்டர் ஜெனரலுக்கு நீதி மன்றத்தின் முன் அரசகரும மொழியில் தமது கடமைகளைச் செய்ய இயலுமா? (ஈ) இன்று அவருக்கு அப்படிச் செய்யமுடியாவிட்டால் எத்தினத்தில் அவரால் அரசகருமமொழியில் தமது கடமைகளைச் செய்யமுடியும்? (உ) இனிமேலாவது நீதி பரிபாலனம் அல்லது சட்டம் சம்பந்தப்பட்ட நியமனங்கள் செய்யப்படும்போது அரசகருமமொழிக் கொள்கைக்கமையவே செய்யப்படுமென அவர் வாக்குறுதி அளிப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Justice : (*a*) Was an officer got down from England for the post of Solicitor-General of Ceylon ? (*b*) Were the services of this Solicitor-General obtained in accordance with the Official Language policy of the Government ? (*c*) Will this Solicitor-General be able to perform his official duties in the courts in the Official Language ? (*d*) If he is not able to do so now, when will he be able to perform his official duties in the Official Language ? (*e*) Will he give an undertaking that at least in the future, when new appointments are made to posts which carry judicial or legal functions, the Official Language policy will be adhered to ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති—අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting—on behalf of the Parliamentary Secretary to the Minister of Justice)

(*a*) Mr. Walter Jayawardena gave up his practice at the Bar in England to take up his appointment as Solicitor-General of Ceylon. (*b*) Yes. (*c*) Yes. (*d*) & (*e*) Mr. Jayawardena possesses a good knowledge of the official language. While at school he passed with credit in Sinhala at the Cambridge Junior and Senior School Certificate Examinations and thereafter pursued his Sinhala studies at the Kotahena Privena. The terms of his present appointment are strictly in accordance with the regulations framed under the Official Language policy.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

සොලිසිටර් ජනරාල් ධුරයෙ වැඩ බාරගත් පසු එතුමට ශ්‍රෙෂ්ඨාධිකරණය ඉදිරියෙදි රාජ්‍ය භාෂාවෙන් නඩුවක් තර්ක කරන්ට පුළුවන් ද බැරිද ?

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

එහෙම ප්‍රශ්නයක් මෙතන නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

මේ සොලිසිටර් ජනරාල්වරයාට අධිකරණය හමුවේ රාජ්‍ය භාෂාව භාවිතය කරමින් සිය රාජකාරි ඉටු කළ හැකිදැයි මෙම ප්‍රශ්නය තෙවන කොටසින් අසා තිබෙනව.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

ඊට "ඔව්" යනුවෙන් පිළිතුරු සපයා තිබෙනව.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Question No. 3.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolla—Minister of Education and Cultural Affairs)

I wish to ask for four months time to answer the question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## ධීවර සංස්ථාව : මාළු ගබඩා කිරීම

## கடற்றொழில் கூட்டுத்தாபனம் : மீனை நீடித்துவைத் திருத்தல்

## FISHERIES CORPORATION : STORAGE OF FISH

**4. බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ධීවර සංස්ථාව මඟින් අල්ලනු ලබන මාළු කල් තබා ගැනීම පිණිස ශීත ගබඩා කොපමණ තිබේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවා ප්‍රමාණවත්ද? (ආ) අලුතින් ශීත ගබඩා කීයක් පිහිටුවීමට අදහස් කරනු ලැබේද? (ඉ) එම ගබඩා කවර ස්ථානවල පිහිටුවනු ලැබේද? (ඊ) මාළු කල් තබා ගැනීම පිණිස 1966 වර්ෂය තුළ පෞද්ගලික සමාගම්වලට වැය කළ මුදල කොපමණද? (උ) එම සමාගම් මොනවා දැයි එතුමා සඳහන් කරනවාද? (ඌ) කොළඹ මට්ටක්කුලියේ ඕෂන් සහ ෆූඩ්ස් සමාගමයට භාර දෙනු ලබන විවිධ වර්ගවල මාළු වෙනුවට ආපසු ලැබෙන්නේ ගල් මාළු බවත්, එමගින් සංස්ථාවට මහත් අලාභයක් සිදුවන බවත් එතුමා දන්නවාද? (එ) එසේ නම්, එය වැළැක්වීමට එතුමා ක්‍රියා කරනවාද? (ඔ) නො එසේ නම්, ඒ ගැන පරීක්ෂණයක් පවත්වනවාද?

*கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) கடற்றொழில் கூட்டுத்தாபனத்தின் மூலம் பிடிக்கப்படும் மீனை நீடித்து வைத்திருப்பதற்காக எத்தனை குளிரூட்டிய களஞ்சியங்கள் இருக்கின்றன? (ஆ) புதிதாக எத்தனை குளிரூட்டிய களஞ்சியங்களை அமைக்க உத்தேசிக்கப்படுகிறது? (இ) அக்களஞ்சியங்கள் எவ்விடங்களில் அமைக்கப்படும்? (ஈ) மீனை நீடித்து வைத்திருப்பதற்கு 1966 ஆம் ஆண்டு தனியார் கொம்பனிகளுக்குச் செலுத்தப்பட்ட பணம் எவ்வளவு? (உ) அக்கொம்பனிகள் எவையென அவர் குறிப்பிடுவாரா? (ஊ) கொழும்பு மட்டக்குழி ஓஷன், பூட்ஸ் கொம்பனியிடம் கையளிக்கப்படும் பலஇன மீன்களுக்குப் பதிலாக திரும்பக்கிடைப்பது விளை மீன் என்பதையும், இதன் மூலம் கூட்டுத்தாபனத்திற்கு பெரிய நட்டம் ஏற்படுகிறதென்பதையும் அவர் அறிவாரா? (எ) அவ்வாறெனில், அதைத் தடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஏ) இன்றேல், அதைப்பற்றி விசாரணை நடத்துவாரா?*

asked the Minister of Industries and Fisheries: (*a*) How many cold rooms are there for storing fish brought in by the Fisheries Corporation? (*b*) How many new cold rooms are to be established? (*c*) Where will they be sited? (*d*) How much was paid to private companies in 1966 for the refrigeration of fish? (*e*) Will he state the names of these companies? (*f*) Is he aware that whereas various kinds of fish are entrusted to Ocean and Foods Co., Mattakkuliya, Colombo, what the corporation gets back is only mullet and that an immense loss is thereby caused to the corporation? (*g*) If so, will he take steps to prevent it? (*h*) If not, will he hold an inquiry into this?

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

(*a*) There is one cold storage plant at Mutwal with 300 tons deep frozen fish storage and 50 tons fresh fish on ice holding capacity. (*b*) and (*c*) The Fisheries Corporation has a programme for the construction of a number of fisheries harbours along the coast line. Every harbour so constructed will have shore facilities provided. These shore facilities include the construction of storage for frozen fish. The following fisheries harbours are under constuction: Beruwala, Mirissa, Tangalle. The constuction of a harbour at Myliddy will commence shortly. In addition an additional storage plant with a capacity of 100 tons for deep freezing is under construction at Mutwal. 2,400 tons deep frozen fish storage capacity and 200 tons fresh fish on ice storage capacity will be provided at the Galle Fisheries Harbour. The contract for this construction has already been signed. In addition, applications from the private sector for setting up ice plants in fishing areas are also being considered. (*d*) Rs. 36,878.50 was paid to private companies in 1966 for the refrigeration of fish. (*e*) The companies were—Ocean Foods and Trade, Mattakkuliya and Ceylon Cold Stores. (*f*) All fish that was entrusted to both Ocean Foods and Trade as well as to Ceylon Cold Stores was taken back both in quantity and variety. (*g*) Does not arise. (*h*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

## එච්. යූ. නන්දසේන මහතා, ටයර් සවිකරන්නා, ලං. ග. ම., මාතර

*திரு. எச். யூ. நந்தசேன, ரயர் பொருத்துநர்: இ. போ. ச., மாத்தறை*

MR. H. U. NANDASENA, TYRE-FITTER, C.T.B., MATARA

5. තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංගම, මාතර ඩිපෝවේ ටයර් සවිකරන්නකු වශයෙන් සේවයේ යෙදී සිටියදී ටයරයක් පිපිරී තුවාල ලැබූ එච්. යූ. නන්දසේන මහතා සේවයෙන් ඉවත් කරනු ලැබ සිටින බව එතුමා දන්නවාද? (ආ) ඔහුට එම අනතුර සිදු වූයේ කවදාද? (ඉ) අනතුර සිදුවීමෙන් පසු ලංගමය ඔහු වෙනුවෙන් ගත් සහන දායක පියවර මොනවාදැයි එතුමා සඳහන් කරනවාද? (ඊ) අනතුර සිදුවී අවුරුද්දකට වැඩිකලක් ගතවන තුරු ඔහුට වන්දි මුදලක් දීමට බැරි තරම් දුබල තත්වයකට ලංගම නීති අංශය වැටීමට හේතුව එතුමා පැහැදිලි කරනවාද? (උ) නන්දසේන මහතා දැනට ඉතා අමාරුවෙන් ජීවත්වන හෙයින් ඔහුට හිමි වන්දි මුදල වහාම ලබා දීමටත්, සැහැල්លු රැකියාවක් ලබා දීමටත් එතුමා ක්‍රියා කරනවාද? (ඌ) එසේ නම්, ඒ කවදාද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைப் போக்குவரத்துச் சபையின் மாத்தறை டிப்போவில் ரயர் பொருத்தும் சேவையிலிருந்தபொழுது ஒரு ரயர் வெடித்துக் காயமடைந்த திரு. எச். யூ. நந்தசேன சேவையிலிருந்து அகற்றப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) இந்த விபத்து சம்பவித்ததெப்பொழுது? (இ) விபத்து சம்பவித்த பின், இ. போ. ச., அவருக்கு நிவாரணமளிக்க எடுத்துக்கொண்ட நடவடிக்கைகள் யாவை என்பதை அவர் அறியத்தருவாரா? (ஈ) விபத்து சம்பவித்து ஒரு வருடத்துக்கு மேலாகியும், அவ்வூழியருக்கு நஷ்ட ஈடு வழங்கமுடியாத மோசமான நிலைக்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் சட்டப்பிரிவு வந்திருப்பதற்கான காரணத்தை அவர் தெளிவுபடுத்துவாரா? (உ) திரு. நந்தசேன தற்பொழுது மிகவும் கஷ்டத்துடன் காலத்தைக் கழிப்பதால், அவருக்குரிய நஷ்டஈட்டுப் பணத்தை உடனடியாகப் பெற்றுக் கொடுக்கவும், சிரமமில்லாத ஒரு தொழிலைப் பெற்றுக் கொடுக்கவும் அவர் நடவடிக்கை எடுப்பாரா? (ஊ) அப்படியெனில், எப்பொழுது?*

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that Mr. H. U. Nandasena who sustained injuries, as a result of the bursting of a tyre while being employed as a tyre-fitter in the C.T.B. Depot, Matara, has been discontinued from service? (*b*) When did he meet with the accident referred to above? (*c*) Will he state what steps were taken by the C.T.B. after the accident with a view to providing him with relief? (*d*) Will he explain how the legal branch of the C.T.B. has deteriorated to a position where it has not been possible to pay the compensation due to Mr. Nandasena, although a period of over one year has elapsed since the accident occurred? (*e*) Since, Mr. Nandasena is at present living under great hardship, will he take action to pay the compensation due to Mr. Nandasena and to provide him with employment in some capacity where light work is involved? (*f*) If so, when?

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

(අ) 66.8.28 වෙනි දින සිට සෞඛ්‍ය හේතූන් පිට විශ්‍රාම ගන්වා ඇත. (ආ) 66.3.15. (ඉ) (1) නන්දසේන මහතාට 66.3.15 වෙනි දින සිට 66.9.15 දක්වා එනම්, මාස 6ක් සම්පූර්ණ පඩි සහිත අනතුරු නිවාඩු දී ඇත. (2) කම්කරු වන්දි ආඥා පනත අනුව, රු. 1,984 ක මුදලක් මෙම සේවක මහතාට ගෙවන ලදී. (3) මොහුට 67.5.17 වෙනි දින සිට කාර්යාල කම්කරුවකු වශයෙන් පත්වීමක්ද දී ඇත. (ඊ) මෙය පැන නොනඟී. හය මාසයක් ඇතුළත දී එම සේවක මහතාට වන්දි ගෙවා ඇත. (උ) "ඉ" බලනු මැනවි. (ඌ) මෙය පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## අංගොඩ දොඩන්ගහහේනේ ජාතික නිවාස යන්ට ජලය සැපයීම

தொடங்காஹேன தேசிய வீட்மைப்புத்திட்டம், அங்கொடை : தண்ணீர் விநியோகம்

## DODANGAHAHENA NATIONAL HOUSING SCHEME, ANGODA : WATER SUPPLY

7. **තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) අංගොඩ දොඩන්ගහහේනේ ජාතික නිවාසයන් හි පදිංචි කරුවනට බීමට ජලය නැති කමින් ඉමහත් පීඩා විඳින බව එතුමා දන්නවාද? (ආ) මේ ප්‍රශ්නය විසඳීම සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයක් යොදා තිබේදැයි එතුමා සඳහන් කරනවා ද? (ඉ) දොඩන්ගහහේනේ නිවාසයනට ජලය සැපයීම සඳහා කොටිකාවත්ත සුළු නගර සභාවට ආධාර මුදලක් දී තිබේ ද? (ඊ) එසේ නම්, ඒ කොපමණ ද?

தொழில், தொழில்வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) அங்கொடை தொடங்காஹேன தேசிய வீடமைப்புத் திட்டத்தில் குடியிருப்பவர்கள் குடிதண்ணீர் இல்லாமல் பெரும் கஷ்டப்படுவதை அவர் அறிவாரா? (ஆ) இப்பிரச்சினையை தீர்க்க ஏதாவது நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதை அவர் தெரிவிப்பாரா? (இ) தொடங்காஹேனயிலுள்ள வீடுகளுக்குத் தண்ணீர் விநியோகம் செய்வதற்காக கொட்டிகாவத்தைப் பட்டண சபைக்கு நிதி உதவி அளிக்கப்பட்டிருக்கிறதா? (ஈ) ஆமெனில் என்ன தொகை அளிக்கப்பட்டுள்ளது?

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that persons living in houses in the Dodangahahena National Housing Scheme, Angoda, are undergoing grave hardships due to lack of drinking water? (*b*) Will he state whether any course of action has been taken to solve this problem? (*c*) Has a grant been given to the Town Council, Kotikawatta, for the supply of water to the houses in Dodangahahena? (*d*) If so, what is the amount so granted?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) නැත, තදබල නියඟ කාලයට පමණි. (ආ) ඔව්, ජලනල මගින් වතුර සැපයීම වැනි විකල්ප යෝජනා කිහිපයක් ගැන දැනට පරීක්ෂා කර ඇති අතර ඒවා ගැන අවධානය යොමු කරගෙන යනු ලැබේ. (ඉ) නැත. (ඊ) උද්ගත නොවේ.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

මෙම නිවාස යෝජනා ක්‍රමයට ජලය සපයා ගැනීම සඳහා කොපමණ ළිං හරිගස්සා තිබෙනවද?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)
(Mr. S. de S. Jayasingha)

ඒ නිවාස යෝජනා ක්‍රමයට සෑහෙන පමණ ළිං තියෙනවා. ඉඩෝර කාලයෙදී වෙනත් ප්‍රදේශවල වාගෙම මේ ප්‍රදේශයෙ ළිංවලින් වතුර අඩුවන ස්වභාව තියෙනවා.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ළිං තියෙන ප්‍රමාණය කොපමණදැයි කියන්ට බැරිද?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)
(Mr. S. de S. Jayasingha)

සෑහෙන පමණ ළිං තියෙනවා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

ගොඩක් ගණනට ළිං තියෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගෙවල් ගණනට ළිං තියෙනවය කියන ප්‍රකාශය තමුනාන්සෙ පිළිගන්නවද ?

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

සෑහෙන පමණ ළිං තිබෙන බවයි කීවෙ.

**ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)**
(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

නිවාසයක් පාසා ළිඳක් බැගින් සාදා දීම——

**එස්. ද එස්. ජයසිංහ මයා.**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)
(Mr. S. de S. Jayasingha)

නිවාසයක් පාසා ළිඳක් හදන පිළිවෙළක් ලංකාවෙ කිසිම නිවාස යෝජනා ක්‍රමයක නැහැ. නමුත් ගෙවල පදිංචි අයට වුවමනා ප්‍රමාණයට වතුර ලබා ගැනීමට ක්‍රම සලසා තිබෙනවා. තමුන්නාන්සෙල ගෙවල් සාදන කාලෙත් එක නිවාසයකට එක ළිඳක් බැගින් සපයා දී තිබෙනවද ? නැහැ.

**ඉලංගරත්න මයා.**
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

හැම නිවාසයකටම වතුර සැපයීම පිණිස වැඩ පිළිවෙළක් යොදනවද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)
(Mr. S. de S. Jayasingha)

ඒ සඳහා පුළුවන් තරම් සුදුසු වැඩ පිළිවෙළක් යොදවනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 8.

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)
(The Hon. Dr. W. Dahanayaka—Minister of Home Affairs)

I require one month's time to answer the question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.

*Question ordered to stand down.*

## කණිෂ්ඨ සිංහල ටයිප් ගසන්නන්ගේ තනතුරු සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්

கனிட்ட சிங்களத் தட்டெழுத்தாளர் பதவிகள்: கல்வித் தராதரங்கள்

**POSTS OF JUNIOR SINHALA TYPIST: EDUCATIONAL QUALIFICATIONS**

12. **ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කණිෂ්ඨ තත්ත්වයේ සිංහල ටයිප් ගසන්නන් පත් කිරීම සඳහා 1967 මාර්තු 23 වෙනිදා රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කළ බව එතුමා දන්නවාද ? (ආ) ඒ පත්වීම් දීමට අවශ්‍ය සුදුසුකම් වශයෙන් ඒ දන්වීමේ ඇතුළත් කොන්දේසි මොනවාද ? (ඉ) ළඝු ලේඛනය හා යතුරු ලිවීමේ උපදේශකවරුන් පත්කිරීම සඳහා 1967 මාර්තු 31 වෙනිදා රජයේ ගැසට් පත්‍රයේ පළ කළ දැන්වීම අනුව සුදුසුකම් හා කොන්දේසි මොනවාද ? (ඊ) උපදේශකවරුන් සඳහා පනවන ලද කොන්දේසි වලට වඩා උසස් අධ්‍යාපන සුදුසුකම් සාමාන්‍ය කණිෂ්ඨ ටයිප් ගසන්නන්ගෙන් බලාපොරොත්තු වන බව මෙයින් පැහැදිලි නේද ? (උ) මේ විෂමතාවය නැති කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නවාද ?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) கனிஷ்ட தரத்திற்கு சிங்களத் தட்டெழுத்தாளர்களை நியமிப்பதற்கு 1967, மார்ச் 23 ஆந் தேதி அரசாங்க வர்த்தமானியில் அறிவித்தல் வெளியிட்டிருந்ததை அவர் அறிவாரா? (ஆ) அந்த நியமனங்களை அளிப்பதற்கு அவசிய மான தகுதிகளாக அந்த அறிவித்தலில் குறிப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பிட்ட நிபந்தனைகள் யாவை? (இ) சுருக்கெழுத்து, தட்டெழுத்துப் போதனாசிரியர்களின் நியமனத்திற்காக, 1967, மார்ச் 31 ஆந் தேதி அரசாங்க வர்த்தமானியில் வெளியிட்ட அறிவித்தலுக்கிணங்க தகுதிகளும், நிபந்தனைகளும் யாவை? (ஈ) போதனாசிரியர்களுக்கென விதிக்கப்பட்ட நிபந்தனைகளுக்கு மேலாக, உயர்ந்த கல்வித் தகுதிகள் சாதாரண கனிஷ்ட தட்டெழுத்தாளர்களிடமிருந்து எதிர்பார்க்கப்படுகிறதென்பது இதனால் தெளிவாகிறதல்லவா? (உ) இந்த முரண்பாட்டை அகற்றுவதற்கு அவர் அவசிய நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Finance: (*a*) Is he aware that a notification was published in the Government Gazette of 23rd March 1967 with a view to making appointments to posts of Junior Sinhala typist? (*b*) What are the qualifications required for appointment, in terms of that notification? (*c*) In terms of the Gazette notification of 31st March 1967, what are the required qualifications and conditions for the posts of Instructors in shorthand and typewriting? (*d*) Is it not clear from the above that the educational qualifications required for appointment to posts of ordinary junior typist are higher than the conditions imposed in respect of the Instructors? (*e*) Will he take action to eliminate this anomaly?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(අ) එසේය. (ආ) (1) භාෂාව (2) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වානිජ අංක ගණිතය සහ (3) තවත් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ්‍යය සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ (1) භාෂාව (2) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ (3) තවත් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ්‍යය සහිත, එක් අවස්ථාවකදී විෂයයන් පහකින් සහ තවත් අවස්ථාවකදී එක් විෂයකින් ද යන පිළිවෙලට විෂයයන් හයකින් අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථ්‍යය ලබා ඇති අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ). (ඉ) (1) සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අවස්ථාවන් දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී ඇති අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) සමග (2) ලංකා කාර්මික විද්‍යාලයේ උසස් වාණිජ සහතිකය (ලඝු ලේඛන සහ යතුරු ලියනය) සහ (3) වාණිජ සහතිකය (ගණන් තැබීම). (4) අපේක්ෂකයන්ට ප්‍රායෝගික හා/හෝ ඉගැන්වීමේ සෑහෙන පළපුරුද්දක් ද තිබිය යුතුයි. (ඊ) නැත. උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයන්ට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට වැඩි සුදුසුකම් තිබිය යුතුය. තනතුරු දෙක සමාන කළ නොහැක. ඒවා වෙනස් දෙපාර්තමේන්තු දෙකක පවතින අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද එකිනෙකට වෙනස් බඳවා ගැනීමේ පරිපාටිවලට යටත් වේ. තනතුරු දෙක දරණ දෙදෙනාගෙන් බලාපොරොත්තු වන රාජකාරි කටයුතු ද සමාන නොවේ. (උ) විෂමතාවයක් නැත. එහෙත් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ වෙනස් කිරීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්දීමක් කර නොතිබුන නිසා, සම්මාන ගැන නොසලකා, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙල) ලබා ඇති සියලුම අපේක්ෂකයන්ට විභාගයේදී තරඟ කිරීමට හැකිවන පරිදි, 1967.4.28 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකළ 1967.4.21 දිනැති නිවේදනයෙන් මුල් ගැසට් නිවේදනය සංශෝධනය කර ඇත.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

මේ විස්තර අනුව ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන සුදුසුකම ගෝලකමට අරගෙන පුහුණු කිරීමට බලාපොරොත්තු වන අයගෙන් ඉල්ලා තිබෙන සුදුසුකමට වඩා පහත් බව ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා පිළිගන්නවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විමලසේන මයා.

(திரு. விமலசேன)

(Mr. Wimalasena)

ඒක වැරදියි. "ඊ" අක්ෂරය යටතේ දී තිබෙන පිළිතුර හොඳින් කියවා බැලුවොත් අවබෝධ වෙයි, ඒ අදහස වැරදි බව.

## දඹුලු ඔය අමුණ බැඳීම

தம்புலு ஓயா அணைக்கட்டு : நிர்மாணம்

DAMBULU-OYA ANICUT : CONSTRUCTION

15. ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)

(திரு. ரீ. பி. தென்னகோன்—தம்புலு)

(Mr. T. B. Tennekoon—Dambulla)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) දඹුලු ඔය අමුණු බැඳීමට කොපමණ මුදලක් වැයකර තිබේද ? (ආ) එම අමුණු බැඳ අවසන් වූවායින් පසු ජල මට්ටමේ සිට ඉඩම්වලට අඩි විසි පහකට වඩා උස් බව දන්නේද ? (ඉ) එසේ නම් එකී ඉඩම්වලට වතුර ලබා දෙන්නේ කෙසේද ? (ඊ) මේ අමුණු බැඳීම අසාර්ථක වැඩක් බව අවුරුදු 10ක තිස්සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාර්තා කළ බව දන්නේද ? (උ) මේ අමුණු බැඳීමට උපදෙස් දුන් ඉංජිනේරුවරයා කවරෙක්ද ?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : (அ) தம்புலு ஓயா அணைக்கட்டு வேலையில் எவ்வளவு பணம் செலவு செய்யப்பட்டுள்ளது ? (ஆ) இவ்வணைக்கட்டு வேலை முடிவடைந்ததும் நீர் மட்டத்திலிருந்து 25 அடிக்கு மேலான உயரத்தில் நிலம் இருக்குமென்பதை அறிவாரா ? (இ) அப்படியாயின் அந்த நிலங்களுக்கு நீர் கொடுப்பது எங்ஙனம் ? (ஈ) இவ்வணைக்கட்டைக் கட்டுவது வீண் வேலையென 10 வருட காலமாக நீர்ப்பாசனத் திணைக்களம் அறிவித்திருப்பதை அறிவாரா ? (உ) இவ்வணைக்கட்டைக் கட்டும்படி யோசனை கூறிய இஞ்சினியர் யார் ?

asked the Minister of Land, Irrigation and Power: (a) What sum of money has been spent on the construction of the Dambulu-oya anicut ? (b) Is he aware that when this anicut is completed, the lands will be over 25 feet above the level of the water ? (c) If so, how is it proposed to supply water to these lands ? (d) Is he aware that for 10 years the Irrigation Department has reported that the construction of this anicut is a futile task ? (e) Who is the engineer responsible for recommending the construction of this anicut ?

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. சி. பி. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) මේ සඳහා අනුමත කර ඇති මුළු ඇස්තමේන්තුව රු. 35,000 ක් වන අතර බැරකම්ද ඇතුළුව අද දක්වා වියදම— රු. 25,619.19 කි. (ආ) වාරිමාර්ග පහසුකම් සැලසෙන ඉඩම් පිහිටා ඇත්තේ සැතපුම් 3 ක් ඈතින් බවත්, ඇළ මාර්ගය කඳු වැටියක් හරහා වැටී ඇති බවත් දැනගන්නට ලැබී තිබේ. අමුණේ වැඩ ආරම්භ කිරීමට පෙරාතුව ඉඩම් හිමියන් හා අත්සන් කර ගන්නා ලද ගිවිසුම අනුව—ඔවුන් විසින් ඇළ කැපීමට පොරොන්දු වී ඇත. (ඉ) ඉඩම් හිමියන් විසින් කැපීමට භාර ගන්නා ලද ඇළ මගිනි. (ඊ) නැත. (උ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවය.

ටී. බී. තෙන්නකෝන් මයා.

(திரு. ரீ. பி. தென்னகோன்)

(Mr. T. B. Tennekoon)

පිළිතුරෙහි සඳහන් වන පරිදි ඉඩම් හිමියන් ඒ ඇළ කැපීමට වූ පොරොන්දුව දැනට ඉෂ්ට කර තිබෙනවද ? නැත්නම්, මතුවට ඉෂ්ට කරනවද ?

සෙනෙවිරත්න මයා.

(திரு. செனெவிரத்ன)

(Mr. Seneviratne)

වැඩේ පටන් ගෙන තිබෙන්නෙ ඉඩම් හිමියන් සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුවයි. ඒ අනුව ඉඩම් හිමියන් ඇළ කැපිය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඒ විධියට ඇළ කැපෙනව ඇත කියා තමුන්නාන්සෙ බලාපොරොත්තු වෙනව ද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඔව්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඒ ඇළ කැපීමෙන් ඉඩම් හිමියන්ට ප්‍රයෝජනයක් නැති නිසා දැන් ඔවුන් ඇළ කපන්න අකමැති බව උප ඇමතිතුමා දන්නවද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
නෑ. ඉඩම් හිමියන් සමග ගිවිසුමක් අත්සන් කර තිබෙනව.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
තමන්ට කිසිම ප්‍රයෝජනයක් නැති නිසා ඉඩම් හිමියන් කිසිවෙක් දැන් ඒ ඇළ කපන්නට උනන්දු නැති බව ප්‍රකාශ කර තිබෙන බවත්, දැන් වතුර ගන්නට යන්නෙ කලින් බලාපොරොත්තු වුණු ඉඩම්වලට නොව ඉන් හැතැප්ම 3 ක් එහායින් පිහිටි වෙනත් ඉඩම්වලට බවත් ගරු උප ඇමතිතුමා දන්නවාද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
වාරිමාර්ග පහසුකම් සැලසෙන ඉඩම් පිහිටා ඇත්තේ හැතැප්ම 3 ක් එහායින් බව මගේ පිළිතුරෙහි සඳහන් වෙනව. අමුණ බැඳීමේ වැඩවලින් හතරෙන් තුනක් පමණයි මෙතෙක් නිම කර තිබෙන්නෙ. ඒ නිසා ඇළ කැපීමෙන් ප්‍රයෝජනයක් වන්නෙ නැහැ.



## ගරු මැක්නිෆ් හා තවත් පූජකවරයකුගේ තාවකාලික වීසා බලපත්‍ර කාලය දික් කිරීම

*வண. மெக்நிபும் இன்னொரு பாதிரியாரும் : வாச விசா நீடிப்பு*

**REV. MCNIFFE AND ANOTHER PRIEST : EXTENTION OF RESIDENCE VISA**

2. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර—ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)*
(Mr. Leslie Goonewardene—Panadura—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගරු මැක්නිෆ් පූජකවරයාට හා තවත් අයිරිෂ් ජාතික පූජකවරයකුට තාවකාලික වීසා බලපත්‍රයක් නිකුත් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙකී බලපත්‍රය දෙනු ලැබුයේ කවදාද? කොතරම් කාල සීමාවකටද? (ඉ) මෙම බලපත්‍රයේ කාල සීමාව දික්කරනු ලැබුවේද? එසේ නම් කෙතරම් කාලයකටද? (ඊ) ලංකාවේ නැවතී සිටීමේ කාල සීමාව මෙසේ දික් කරනු ලැබුවේ මක් නිසාද?

*பிரதம அமைச்சரையும் பாதுகாப்பு வெளி விவகார அமைச்சரையும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரையும் தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) வண. மெக்நிபிற்கும் இன்னுமொரு ஐயர்லாந்திய பாதிரியாருக்கும் தற்காலிக விசா அனுமதிப் பத்திரம் வழங்கப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வனுமதிப் பத்திரம் எப்பொழுது கொடுக்கப்பட்டது? அது எவ்வளவு காலத்திற்குச் செல்லுபடியாகும்? (இ) இவ்வனுமதிப் பத்திரத்தின் காலஎல்லை நீடிக்கப்பட்டதா? ஆமெனில் எவ்வளவு காலத்திற்கு? (ஈ) இவர்கள் இலங்கையில் தங்கும் காலத்தை நீடித்ததற்குக் காரணம் என்ன?*

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

that Rev. McNiffe and another Irish priest have been allowed a temporary visa permit? (b) When was this permit granted and for how long? (c) Was any extension of this permit allowed, and if so, for how long? (d) What is the reason for this extension of the period of stay in Ceylon?

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்லி சேனநாயக்க)

(The Hon. Dudley Senanayake)

(a) Rev. Charles Mc Niffe has been issued a residence visa. I am not aware of any other new immigrant Irish priest who has been issued a visa. (b) The visa was issued on 28.4.67 valid till 23.4.68. (c) No. (d) The visa was issued for purposes of study of Buddhist Philosophy, Sinhala History and Culture.

### ර. වැ. දෙ: ගල්රෝල් මිළයට ගැනීම

அரசாங்கக் கட்டடவேலைத் திணைக்களம்: நீராவி உருளைகளை வாங்குதல்

P. W. D.: PURCHASE OF STEAMROLLERS

6. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ—ඇස්. බී. යාලේගම—රත්තොට—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை—சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. S. B. Yalegama—Rattota)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් එක්සත් රාජධානියෙන් ගල්රෝල් ගෙන්වා ගැනීම සඳහා ඇණවුමක් කර තිබේ ද? (ආ) එසේ නම්, ඒ ඇණවුම ගල් රෝල් කීයක් සඳහා ද? (ඉ) ඒවා සඳහා කොපමණ මුදලක් වැය වේද? (ඊ) අවශ්‍ය ගල් රෝල් ගණන කොපමණද යන්න ටෙන්ඩර් දැන්වීමේ සඳහන් කරන ලද්දේ ද? එසේ නම්, ඒ ගණන කුමක් ද? (උ) අඩු ම ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු කවුද? (ඌ) සාර්ථක ටෙන්ඩර්කරුගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක් මීට මාස කීපයකට පෙර ලංකාවට පැමිණියේ ද? එතුමා ඔහු සමග සාකච්ඡා පැවැත්වූයේ ද?

அரசாங்கக் கட்டடவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) ஐக்கிய இராச்சியத்திலிருந்து நீராவி உருளைகளை வாங்குவதற்கு அரசாங்கக் கட்டடவேலைத் திணைக்களம் கேட்டுள்ளதா? (ஆ) ஆமெனில், எத்தனை உருளைகள் கேட்கப்பட்டுள்ளன? (இ) அவற்றின் கொள்முதல் தொகை எவ்வளவு? (ஈ) தேவையான நீராவி உருளைகளின் எண்ணிக்கை கேள்விப்பத்திர விளம்பரத்தில் குறிப்பிடப்பட்டிருந்ததா? ஆமெனில் அவ்வெண்ணிக்கை என்ன? (உ) மிகக் குறைவான கேள்விப்பத்திரம் எவருடையது? (ஊ) ஏற்றுக்கொள்ளப்பட்ட கேள்விப் பத்திரதாரரின் சிரேஷ்ட பிரதிநிதியொருவர் சில மாதங்களுக்கு முன் இலங்கைக்கு வந்தாரா? அவருடன் அவர் பேச்சு வார்த்தை ஏதும் நடத்தினரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) Has the P.W.D. given an order for steamrollers from the U.K.? (b) If so, how many steamrollers? (c) What will they cost? (d) Did the tender notice specify the number of steamrollers required, and if so, what was that number? (e) Who was the lowest tenderer? (f) Did a senior representative of the successful tenderer visit Ceylon some months ago and did he have any discussions with him?

ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)

(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டடவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)

(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

(a) Yes. (b) 50. (c) Rs. 2,054,499. (d) Ten, with provision for the Tender Board to order either more or less. The Ministry Tender Board consisted of the Permanent Secretary, the Director of Public Works and representatives of the Government

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

Stores and the Treasury. The approval of the Ministry of Planning and Economic Affairs was obtained. (e) Lowest conforming to specifications : Messrs. Aveling Barford Ltd., Invicta Works, Grantham, Lincoln-Shire, England. (f) Yes. A representative visited Ceylon, but I did not have any discussions with him regarding road rollers.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Question No. 9.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

I require one month's time to answer this question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்திற்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## මෛත්‍රීපාල හේරත් මහතාගේ මෝටර් රථය ගිනි තැබීම : වරදකරුවන්ට විරුද්ධව නඩු පැවරීම

திரு. மைத்திரிபால கேரத்தினது காரை எரித்தல்: சந்தேக நபர்களுக் கெதிராக நடவடிக்கை

**BURNING OF CAR OF MR. MAITHRIPALA HERAT : ACTION AGAINST SUSPECTS**

10. **ද සොයිසා සිරිවර්ධන මයා. (ආර්. ජේ. ජී. ද මැල් මයා—දෙවිනුවර—වෙනුවට)**

*(திரு. டி சொய்சா சிறிவர்தன—திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. R. J. G. de Mel—Devinuwara)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලිඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) දෙවිනුවර අතුරු මැතිවරණ දිනයට පෙර දිනයවූ, මාර්තු මස 15 වැනි දින දෙවිනුවර මැතිවරණ කොට්ඨාශයේ රත්මලේ දී, මෝටර් රථ දෙකකින් පැමිණි යූ. ඇන්. පී. මැරවරයින් කණ්ඩායමක්, දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල හේරත් මහතා ගමන් කරමින් සිටි ඒ මහතාට අයත් 1 ශ්‍රී 1733 දරණ ඔපල් මෝටර් රථය සම්පූර්ණයෙන්ම ගිනිබත් කළ බව එතුමා දන්නවාද? (ආ) මෙම මෝටර් රථය ගිනිතැබීම හා සම්බන්ධ මෝටර් රථ දෙක පිළිබඳව, පොලීසිය කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේ ද? (ඉ) මෙම අපරාධය කිරීමට සම්බන්ධයයි සැක කරණු ලබන පුද්ගලයාට හෝ පුද්ගලයිනට විරුද්ධව අපරාධ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ නඩු පැවරීමට පොලීසිය කුමන ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද? (ඊ) සැක කරණු ලබන පුද්ගලයින්ගේ නම් මොනවාද? (උ) පොලීසිය විසින් ප්‍රකාශ සටහන් කරගන්නා ලද සාක්ෂි කරුවන්ගේ නම් මොනවා ද? (ඌ) සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අඩංගු මෙම පොලිස් වාර්තා මේ ගරු සභාවේ දනගැනීම පිණිස එතුමා ඉදිරිපත් කරනවා ද? (එ) දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මෛත්‍රීපාල හේරත් මහතා, වලපනේ පාර්ලිමේන්තු මන්ත්‍රී වී. බී. ඇම්. හේරත් මහතා සහ ඩී. ඩී. අබේසේකර මහතා යන අයවලුන් විසින් කරණ ලද ප්‍රකාශ එතුමා ඉදිරිපත් කරනවා ද? නොඑසේ නම්, ඒ මන් ද?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரையும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரையும் தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா : (அ) தெதிகம தொகுதியில் முன்னைநாள் பாராளுமன்ற உறுப்பினரான திரு. மைத்திரிபால கேரத் பிரயாணஞ் செய்ததும் அவருக்குச் சொந்தமானதுமான ஓபல் 1ஸ்ரீ 1733 இலக்கமுடைய மோட்டார் வாகனம் தெவிநுவரை உப தேர்தல் தினத்திற்கு முந்திய நாளாகிய மார்ச் 15 ஆந் தேதியன்று தெவிநுவரைத் தொகுதியிலுள்ள இரத்துமலே என்னுமிடத்தில் இரு மோட்டார் வாகனங்களில் வந்த ஐ. தே. கட்சியின் காடையர்களாலும் குண்டர்களாலும் பூரணமாக எரிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) இந்த மோட்டார் வாகனம் எரிக்கப்பட்ட சம்பவத்தில் ஈடுபட்ட இரு மோட்டார் வாகனங்கள் பற்றி பொலிசார் எடுத்த நடவடிக்கை என்ன? (இ) இச்சம்பவத்தில் சம்பந்தப்பட்டதாகச் சந்தேகிக்கப்பட்ட நபருக்கு அல்லது நபர்கட்கெதி*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ராகக் குற்ற நடவடிக்கைகள் எடுக்க பொலிசார் என்ன செய்துள்ளனர்? (ஈ) இச் சந்தேக நபர்களின் பெயர்களென்ன? (உ) பொலிசாரால் பதியப்பட்ட வாக்குமூலங்களைக் கொடுத்த நபர்களின் பெயர்களென்ன? (ஊ) சாட்சியங் கொடுத்தோரின் கூற்றை எடுத்துரைக்கும் பொலிஸ் அறிக்கைகளை இச்சபையினர் அறியும்படி அவர் சமர்ப்பிப்பாரா? (எ) தெதிகம முன்னைநாள் பாராளுமன்ற உறுப்பினரான திரு. மைத்திரிபால கேரத் வலப்பனை பாராளுமன்ற உறுப்பினரான திரு. ரீ. பி. எம். கேரத், திரு. டி. டி. அபயசேகரா ஆகியோரின் வாக்குமூலங்களை அவர் சமர்ப்பிப்பாரா? இல்லையெனில், ஏன்?

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware that Opel Car No. 1 Sri 1733 belonging to Mr. Maithripala Herath, *ex*-M.P. for Dedigama, and in which Mr. Herath was travelling, was completely burnt by a gang of U.N.P. thugs and hooligans who came in two motor vehicles at Ratmale in the Devinuwara Electorate on 15th March, being the day before the Devinuwara by-election? (*b*) What action has been taken by the Police regarding the two motor vehicles which were involved in the burning of this car? (*c*) What action has been taken by the police to institute criminal proceedings against the person or persons alleged to have been involved in this crime? (*d*) What are the names of these suspects? (*e*) What are the names of the witnesses whose statements have been recorded by the police? (*f*) Will he table these police statements giving the statements of witnesses for the information of this House? (*g*) Will he table the statements made by Mr. Maithripala Herath, *ex*-M.P., Dedigama and Mr. T. B. M. Herath, M.P. for Walapane and also of Mr. D. D. Abeyasekera? If not, why?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

(*a*) A complaint had been made by Mr. Maithripala Herath at Dickwella Police Station on the 15th March the day before the Devinuwara by-election that Opel Car No. 1 Sri 1733 belonging to him was set on fire at Ratmale by some men who came in a jeep bearing No. 4 Sri 1824. (*b*) The complainent did not refer to two motor vehicles. Vehicle No. 4 Sri 1824 referred to in the complaint is not a jeep but a Holden car. (*c*) A full inquiry had been held into this complaint and facts have been reported to court in M. C. Matara Case No. 34688. The complainant has been noticed to appear in court on 18th June 1967. (*d*) The suspects are not known. (*e*) (1) Mr. Maithripala Herath, *ex*-M.P., Dedigama (2) Mr. Senarath Yapa (3) Mr. D. D. Abeysekera *alias* Punchi Mahatmaya of Dandeniya (4) Mr. Gunapala Abeysekera of Dandeniya (5) Mr. T. B. M. Herath, M.P. for Walapane (6) Mr. R. K. W. Ratnayake of Dickwella. (*f*) This is not possible as the matter is *sub-judice*. (*g*) This cannot be done as the matter is *sub-judice*.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

If the suspects are not known who are being charged?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Who said that anybody is being charged? What I said was that the matter has been reported to court. Why did you presume that anybody had been charged?

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Question No. 11.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

I require one month's time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## අකුරණ කොට්ඨාශයෙන් තෝරා ගන්නා ලද ශිෂ්‍ය ගුරුවරුන්

அக்குறணைத் தொகுதியிலிருந்து நியமிக்கப்பட்ட மாணவ ஆசிரியர்

**PUPIL TEACHERS RECRUITED FROM AKURANA**

13. ද සොයිසා සිරිවර්ධන මයා. (හේමචන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர் சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මෑතකදී ශිෂ්‍ය ගුරු පත්වීම් දෙනු ලැබූ අවස්ථාවේදී, ශිෂ්‍ය ගුරුවරුන් වශයෙන් එක් ඡන්ද කොට්ඨාශයකින් කී දෙනෙකු බැගින් තෝරාගන්නට යෙදුණේද? (ආ) දිවයිනේ සෑම ඡන්ද කොට්ඨාශවලින්ම තෝරා පත්කර ගනු ලැබූ මුළු සංඛ්‍යාව කොපමණද? (ඉ) ඒ අනුව අකුරණ බහු ඡන්ද කොට්ඨාශයෙන් පත්කර ගන්නට යෙදුණු ශිෂ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ගම් හා ලිපිනයන් ආදී වශයෙන් වෙන් වෙන්ව එතුමා සඳහන් කරනවාද? (ඊ) දැනට ඔවුන් සේවය කරන පාසැල් හා එක් එක් පාසැලට පත් කරණු ලැබූ සංඛ්‍යාව පත්කරනු ලැබූ දින සහිතව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරනවාද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அண்மையில் மாணவ ஆசிரியர்களுக்கு நியமனம் கிடைத்த சந்தர்ப்பத்தில், மாணவ ஆசிரியர்களாக ஒவ்வொரு தேர்தற்றொகுதியிலிருந்தும் எத்தனை பேர் தெரிவு செய்யப்பட்டனர்? (ஆ) தீவின் சகல தேர்தற்றொகுதிகளிலிருந்தும் தெரிவு செய்யப்பட்டவர்களின் மொத்த எண்ணிக்கை யாது? (இ) அதற்கிணங்க, அக்குறணை இரட்டைத் தேர்தற்றொகுதியிலிருந்து நியமிக்கப்பட்ட மாணவ ஆசிரியர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர், கிராமம், முகவரி என்பனவற்றை தனித்தனியே அவர் குறிப்பிடுவாரா? (ஈ) தற்பொழுது அவர்கள் கடமையாற்றும் பாடசாலைகள், அவ்வப் பாடசாலைகளுக்கு நியமிக்கப்பட்டவர்களின் எண்ணிக்கை, நியமனமளித்த தினம் என்பனவற்றை தனித் தனியே அவர் குறிப்பிடுவாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) How many pupil teachers were selected per electorate when pupil teachers were recruited recently? (*b*) What is the total number recruited from all electorates in the Island? (*c*) Will he state separately the number of pupil teachers recruited from the multi-member constituency of Akurana, their names, villages and addresses? (*d*) Will he state separately the schools to which they are attached at present and the number of pupil teachers appointed to each school with the dates of appointment?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

(අ) මෙම විස්තර සභාගත කරමි. (ආ) 2957. (ඉ) මෙම විස්තර සභාගත කරමි. (ඊ) මෙම විස්තර සභාගත කරමි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ශිෂ්‍ය ගුරු විභාගයේ ප්‍රතිඵල, ලකුණු ලැයිස්තු ගිනි බත් වී තිබෙනවාය කියා ප්‍රවෘත්තියක් ප්‍රවෘත්ති පත්‍රවල පළවුණා. ඒක ඇත්තක්ද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඒ අයගෙ ගෙදර ගිනි ඇවිලිලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභා මේසය මත තබන ලද විස්තර මෙසේ යි:**

சபாபீடத்தில் வைக்கப்பட்ட விபரம் வருமாறு:

*The details tabled are as follows:*

## (අ) උපලේඛනය

**ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුරු**

| | ඡන්ද කොට්ඨාශය | தேர்தல் தொகுதி | Electorate | Number recommended for appointment |
|---|---|---|---|---|
| 1. | කොළඹ උතුර | கொழும்பு வடக்கு | Colombo North .. | 11 |
| 2. | මැද | கொழும்பு மத்தி | Colombo Central .. | 15 |
| 3. | දකුණ | கொழும்பு தெற்கு | Colombo South .. | 21 |
| 4. | බොරැල්ල | பொறளை | Borella .. .. | 17 |
| 5. | දෙහිවල-ගල්කිස්ස | தெஹிவளை, கல்கிசை | Dehiwala-Mt. Lavinia | 17 |
| 6. | හෝමාගම | கோமகம | Homagama .. | 26 |
| 7. | අවිස්සාවේල්ල | அவிசாவளை | Avissawella .. | 28 |
| 8. | කැස්බෑව | கெஸ்பேவ | Kesbewa .. | 24 |
| 9. | කොට්ටාව | கொட்டாவ | Kottawa .. .. | 21 |
| 10. | මොරටුව | மொறட்டுவ | Moratuwa .. | 20 |
| 11. | කෝට්ටේ | கோட்டே | Kotte .. .. | 21 |
| 12. | කොලොන්නාව | கொலன்னாவ | Kolonnawa .. | 14 |
| 13. | **ගම්පහ** | **கம்பகா** | *Gampaha* .. | 29 |
| 14. | මහර | மகர | Mahara .. .. | 19 |
| 15. | අත්තනගල්ල | அத்தனகல | Attanagalla .. | 22 |
| 16. | ජාඇල | ஜா–எல | Ja-ela .. .. | 21 |
| 17. | වත්තල | வத்தளை | Wattala .. .. | 20 |
| 18. | මීරිගම | மிரிகம | Mirigama .. .. | 25 |
| 19. | කැළණිය | களனி | Kelaniya .. | 21 |
| 20. | කටාන | கட்டான | Katana .. .. | 19 |
| 21. | දිවුලපිටිය | திவுலுப்பிற்றிய | Divulapitiya .. | 23 |
| 22. | දොම්පෙ | டொம்பே | Dompe .. .. | 23 |
| 23. | මිනුවන්ගොඩ | மினுவாங்கொட | Minuwangoda .. | 29 |
| 24. | මීගොමුව | நீர்கொழும்பு | Negombo .. .. | 18 |
| 25. | **කළුතර** | **களுத்துறை** | *Kalutara* .. .. | 20 |
| 26. | බේරුවල | பேருவல | Beruwala .. .. | 20 |
| 27. | බණ්ඩාරගම | பண்டாரகம | Bandaragama .. | 23 |
| 28. | හොරණ | கொறண | Horana .. .. | 36 |
| 29. | මතුගම | மத்துகம | Matugama .. | 28 |
| 30. | පානදුර | பாணந்துறை | Panadura .. | 27 |
| 31. | අගලවත්ත | அகலவத்தை | Agalawatta .. | 34 |
| 32. | බුලත්සිංහල | புலத்சிங்கள | Bulathsinhala .. | 37 |
| 33. | **ගාල්ල** | **காலி** | *Galle* .. .. | 24 |
| 34. | අම්බලන්ගොඩ | அம்பலாங்கொடை | Ambalangoda .. | 20 |
| 35. | අක්මීමන | அக்மீமான | Akmeemana .. | 22 |
| 36. | බද්දේගම | பத்தேகம | Baddegama .. | 28 |
| 37. | බලපිටිය | பலப்பிட்டிய | Balapitiya .. | 21 |
| 38. | බෙන්තර-ඇල්පිටිය | பெந்தற–எல்பிட்டிய | Bentara-Elpitiya .. | 26 |
| 39. | හබරාදූව | கபறதுவ | Habaraduwa .. | 19 |
| 40. | රත්ගම | றத்கம | Ratgama .. | 25 |
| 41. | හිනිදුම | இனிதும | Hiniduma .. | 29 |
| 42. | **මාතර** | **மாத்தறை** | *Matara* .. .. | 27 |
| 43. | අකුරැස්ස | அக்குறெஸ்ஸ | Akuressa .. | 17 |
| 44. | දෙවිනුවර | தெவிநுவர | Devinuwara .. | 25 |
| 45. | කඹුරුපිටිය | கம்புறுப்பிட்டிய | Kamburupitiya .. | 19 |
| 46. | වැලිගම | வெலிகம | Weligama .. | 20 |
| 47. | දෙනියාය | தெனியாய | Deniyaya .. | 24 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| | ඡන්ද කොට්ඨාශය | தேர்தல் தொகுதி | Electorate | Number recommended for appointment |
|---|---|---|---|---|
| 48. | හක්මන | கக்மான | Hakmana | 23 |
| 49. | තිස්සමහාරාමය | திஸ்ஸ | Tissamaharamaya | 24 |
| 50. | මුල්කිරිගල | முல்கிறிகல | Mulkirigala | 23 |
| 51. | බෙලිඅත්ත | பெலியத்த | Beliatta | 25 |
| 52. | කෑගල්ල | கேகாலை | *Kegalle* | 22 |
| 53. | රඹුක්කන | றம்புக்கணை | Rambukkana | 24 |
| 54. | මාවනැල්ල | மாவனெல்ல | Mawanella | 25 |
| 55. | ගලිගමුව | கலிகமுவ | Galigamuwa | 31 |
| 56. | යටියන්තොට | எட்டியாந்தோட்டை | Yatiyantota | 24 |
| 57. | රුවන්වැල්ල | றுவான்வெல | Ruwanwella | 27 |
| 58. | දෙහිඕවිට | டெகியோவிற்ற | Dehiowita | 31 |
| 59. | දැදිගම | டெடிகம | Dedigama | 32 |
| 60. | මහනුවර | கண்டி | *Kandy* | 13 |
| 61. | අකුරණ | அக்குறுன | Akurana | 30 |
| 62. | ගලගෙදර | கலகெதற | Galagedera | 32 |
| 63. | හේවාහැට | கேவகெற்ற | Hewaheta | 29 |
| 64. | නාවලපිටිය | நாவலப்பிட்டிய | Nawalapitiya | 29 |
| 65. | මිනිපේ | மினிப்பே | Minipe | 12 |
| 66. | තෙල්දෙනිය | தெல்தெனிய | Teldeniya | 24 |
| 67. | වත්තේගම | வத்தேகம | Wattegama | 25 |
| 68. | ගම්පොල | கம்பொல | Gampola | 20 |
| 69. | උඩුනුවර | உடு–நுவர | Udu-Nuwara | 20 |
| 70. | යටිනුවර | யட்டி–நுவர | Yati-Nuwara | 23 |
| 71. | කුණ්ඩසාලේ | குண்டசாலை | Kundasale | 19 |
| 72. | සෙංකඩගල | செங்கடகல | Senkadagala | 26 |
| 73. | මාතලේ | மாத்தளை | *Matale* | 20 |
| 74. | දඹුල්ල | டம்புல்ல | Dambulla | 24 |
| 75. | ලග්ගල | லக்கல | Laggala | 18 |
| 76. | රත්තොට | றத்தோட்டை | Rattota | 24 |
| 77. | රත්නපුරය | இரத்தினபுரி | *Ratnapura* | 28 |
| 78. | කිරිඇල්ල | கிறிஎல்ல | Kiriella | 32 |
| 79. | රක්වාන | றக்வான | Rakwana | 27 |
| 80. | නිවිතිගල | நிவிற்றிகல | Nivitigala | 25 |
| 81. | පැල්මඩුල්ල | பெல்மதுல்ல | Pelmadulla | 27 |
| 82. | කලවාන | கலவான | Kalawana | 26 |
| 83. | බලන්ගොඩ | பலாங்கொட | Balangoda | 27 |
| 84. | කොලොන්න | கொலன்ன | Kolonna | 19 |
| 85. | බදුල්ල | பதுளை | *Badulla* | 26 |
| 86. | බණ්ඩාරවෙල | பண்டாரவளை | Bandarawela | 24 |
| 87. | හපුතලේ | அப்புத்தளை | Haputale | 22 |
| 88. | මහියංගනේ | மகியங்கன | Mahiyangano | 9 |
| 89. | පස්සර | பசறை | Passara | 20 |
| 90. | සොරනාතොට | சொரணதோட்டை | Soranatota | 22 |
| 91. | නුවරඑළිය | நுவரேலியா | *Nuwara Eliya* | 11 |
| 92. | හඟුරන්කෙත | ககுறன்கெற்ற | Haguranketa | 23 |
| 93. | කොත්මලේ | கொத்மலே | Kotmale | 25 |
| 94. | වලපනේ | வலப்பொன | Walapone | 19 |
| 95. | වැලිමඩ | வெலிமட | Welimada | 25 |
| 96. | ඌව පරනගම | ஊவா பரணகம | Uva Paranagama | 24 |
| 97. | මස්කෙලිය | மஸ்கெலியா | Maskeliya | 25 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | ඡන්ද කොට්ඨාශය | தேர்தல் தொகுதி | Electorate | Number recommended for appointment |
|---|---|---|---|---|
| 98. | මොණරාගල | மொனருகலை | *Moneragala* .. | 21 |
| 99. | බිබිල | பிபிலை | Bibile .. .. | 12 |
| 100. | අනුරාධපුරය | அநுராதபுரம் | *Anuradhapura* .. | 27 |
| 101. | හොරොව්පතාන | ஹொறப்பொத்தான | Horowpotana .. | 15 |
| 102. | කලාවැව | கலாவேவ | Kalawewa .. | 26 |
| 103. | කැකිරාව | கெக்கிராவ | Kekirawa .. | 26 |
| 104. | මිහින්තලේ | மிஹிந்தலை | Mihintale .. | 24 |
| 105. | මැදවච්චිය | மதவாச்சிய | Medawachchiya .. | 18 |
| 106. | කුරුණෑගල | குருநாகல் | *Kurunegala* .. | 26 |
| 107. | දොඩන්ගස්ලන්ද | தொடங்கஸ்லந்த | Dodangaslanda .. | 23 |
| 108. | හිරියාල | ஹிரியால | Hiriyala .. .. | 27 |
| 109. | කුලියාපිටිය | குளியாப்பிட்டிய | Kuliyapitiya .. | 36 |
| 110. | මාවතගම | மாவத்தகம | Mawathagama .. | 28 |
| 111. | වාරියපොල | வாரியப்பொல | Wariyapola .. | 29 |
| 112. | යාපහුව | யாப்பகுவ | Yapahuwa .. | 28 |
| 113. | දඹදෙණිය | தம்பதெனிய | Dambadeniya .. | 27 |
| 114. | කටුගම්පොල | கட்டுகம்பொல | Katugampola .. | 27 |
| 115. | පොල්ගහවෙල | பொல்காவல | Polgahawela .. | 27 |
| 116. | හලාවත | சிலாபம் | *Chilaw* .. .. | 26 |
| 117. | පුත්තලම | புத்தளம் | Puttalam.. .. | 13 |
| 118. | නාත්තන්ඩිය | நாத்தாண்டிய | Nattandiya .. | 23 |
| 119. | වෙන්නප්පුව | வென்னப்புவ | Wenappuwa .. | 29 |
| 120. | බිංගිරිය | பிங்கிரியா | Bingiriya .. | 31 |
| 121. | නිකවැරටිය | நிக்கவெரெட்டியா | Nikaweratiya .. | 29 |
| 122. | පොළොන්නරුව | பொலன்னறுவை | *Polonnaruwa* .. | 21 |
| 123. | මින්නේරිය | மின்னேரியா | Minneriya .. .. | 22 |
| 124. | අම්පාරේ | அம்பாறை | *Amparai* .. .. | 22 |
| 125. | ත්‍රිකුණාමලය | திருகோணமலை | *Trincomalee* .. | 7 |
| 126. | මුත්තූර් | மூதூர் | Muttur .. .. | 17 |
| 127. | මඩකළපුව | மட்டக்களப்பு | *Batticaloa* .. | 3 |
| 128. | පද්දිරිප්පුව | பட்டிருப்பு | Paddiruppu .. | 2 |
| 129. | යාපනය | யாழ்ப்பாணம் | *Jaffna* .. .. | 1 |
| 130. | මන්නාරම | மன்னார் | Mannar .. .. | 1 |
| 131. | වව්නියාව | வவுனியா | *Vavuniya* .. | 5 |

(ආ) උපලේඛනය

ප්‍රශ්නයේ (ඉ) කොටසට පිළිතුරු

අකුරණ බහු ඡන්ද කොට්ඨාශයෙන් පත් කරන්නට යෙදුන ශිෂ්‍යගුරුවරුන් සංඛ්‍යාව—ඔවුන්ගේ නම් ගම් හා ලිපිනයන් වෙන්වෙන් වශයෙන්

| | නම | | ගම හා ලිපිනය |
|---|---|---|---|
| 1. | එස්. කේ. බස්නායක මිය. | ... | හේනේගෙදර වත්ත, උඩුවාවල, කටුගස්තොට. |
| 2. | එන්. ඩබ්ලිව්. කරුණාවතී මිය. | ... | නාගහවත්ත, උඩුවාවල, කටුගස්තොට. |
| 3. | වි. කු. වික්‍රමසිංහ මිය. | ... | වත්තෙවලව්ව, හපුගොඩ, කටුගස්තොට. |
| 4. | කේ. ජී. නන්දසේන මයා. | ... | ඕවිස්ස, පූජාපිටිය. |
| 5. | වී. ඩී. විජේරත්න මිය. | ... | "මානෙල්", අංකුඹුර පාර, පූජාපිටිය. |
| 6. | ආර්. එම්. අභයරත්න මයා. | ... | "අභයනිවස", බෝතොට, මැදවල. |
| 7. | එන්. පී. ඩිංගිරිමැණිකා මිය. | ... | අරඹේපොල, අලවතුගොඩ. |
| 8. | ඩබ්ලිව්. ප්‍රේමරත්න මයා. | ... | පල්ලේඉහගම, මැදවල (හාරිස්පත්තුව). |
| 9. | ඒ. එම්. එම්. ගුණරත්න මැණිකේ මිය. | ... | අඹරුමුල්ල, දෙහිගම, මුරුතලාව. |
| 10. | එච්. එම්. ටිකිරිමැණිකා මිය. | ... | ගැට්ටපොල, මුරුතලාව. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| | නම | | ගම හා ලිපිනය |
|---|---|---|---|
| 11. | ඩී. එම්. කමලාකුමාරිහාමි මිය. | ... | කිරලගම, පූජාපිටිය. |
| 12. | ඒ. ආර්. ජයතුංග මයා. | ... | අංගොඩ, මැදවල (හාරිස්පත්තුව). |
| 13. | එච්. එම්. රම්බණ්ඩා මයා. | ... | බෝතොට, මැදවල (හාරිස්පත්තුව). |
| 14. | ඒ. උඩුවාවල මයා. | ... | 11, කොළඹ වීදිය, මහනුවර. |
| 15. | එන්. කේ. කපුකොටුව මෙනෙවිය | ... | ගෝනිගොඩ, මැදවල (හාරිස්පත්තුව). |
| 16. | ටී. ඊ. ආර්. කුලතුංග මයා. | ... | තිත්තපජ්ජල, වැරැල්ලගම. |
| 17. | ආර්. පී. ඒ. වරකාදෙනිය මිය. | ... | වරකාදෙනිය, පූජාපිටිය. |
| 18. | එස්. එස්. රණසිංහ මිය. | ... | 78/1, රණවන, කටුගස්තොට. |
| 19. | එම්. එම්. ප්‍රඥාසේකර බණ්ඩා මයා. | ... | රතුකොහුදිගල, වත්තේගම. |
| 20. | එච්. ඥාණවතී වෛද්‍යසේකර මිය. | ... | ''විල්සන්ස්'', උයන්වත්ත, කුරුණෑගල පාර, කටුගස්තොට. |
| 21. | එස්. රත්නායක මිය. | ... | දෙහිගම, මුරුතලාව. |
| 22. | ඩබ්ලිව්. මල්ලිකා වයලට් මිය. | ... | නුගේතැන්න, අලගොඩ, පූජාපිටිය. |
| 23. | කේ. ගුණාදර් මිය. | ... | ''ජයන්ති'', මාරතුගොඩ, පූජාපිටිය. |
| 24. | ආර්. එම්. ආර්. අභයරත්න බණ්ඩා මයා. | ... | මහකුඹුර වලව්ව, මංගලගම, මුරුතලාව. |
| 25. | අයි. කේ. මුල්ලේගම මිය. | ... | මුල්ලේගම, අඹතැන්න. |
| 26. | පී. බාලසූරිය මිය. | ... | රඹුකේවෙල, මහනුවර. |
| 27. | ආර්. සී. ජයසීලි මිය. | ... | කුළුගම්මන, මහනුවර (හරහා). |
| 28. | එම්. යුවලීනා මිය. | ... | මැදිඅරඹෙගෙදර, හරන්කහව, මහනුවර. |
| 29. | එල්. ඩී. කැතිපේආරච්චි මිය. | ... | අලවතුගොඩ. |

(இ) ஒன்றுக்கு மேற்பட்ட உறுப்பினர்களைக் கொண்ட தொகுதியான அக்குறுனவிலிருந்து நியமிக்கப்பட்ட மாணவ ஆசிரியர்களின் எண்ணிக்கை, பெயர்கள், கிராமங்கள், விலாசங்கள் ஆகிய விபரங்கள் கீழே கொடுபட்டுள்ளன :

| | பெயர் | | கிராமமும் விலாசமும் |
|---|---|---|---|
| 1. | திருமதி எஸ். கே. பஸ்ஞயக்க | .. | கெனகெதரவத்த, உடுவவல, கட்டுகாஸ்தோட்ட |
| 2. | திருமதி என். டபிள்யு. கருணவதி | .. | நாககவத்த, உடுவாவல, கட்டுகாஸ்தோட்ட |
| 3. | திருமதி டபிள்யு. கே. விக்கிரமசிங்க | .. | வட்டவலாஉவ, கப்புகொட, கட்டுகாஸ்தோட்ட |
| 4. | திரு. கே. ஜி. நந்தசேன .. | .. | ஓவிஸ்ஸ, புஜாப்பிட்டி |
| 5. | திருமதி ரீ. டி. விஜெயரட்ண | .. | " மனெல் ", அங்கும்புற ரோட், புஜாப்பிட்டிய |
| 6. | திரு. ஆர். எம். அபயரட்ண | .. | " அபயணிவாச ", பொத்தோட்ட, மெதவல |
| 7. | திருமதி என். பி. டிங்கிறிமெனிக்க | .. | ஆரம்பபொல, அளவத்துகொட |
| 8. | திரு. டபிள்யு. பிரேமரட்ண | .. | பலே-இகலகம, மெதகம (கறிஸ்பத்து) |
| 9. | திருமதி ஏ. எம். எம். குணரட்ணமெனிக்க | .. | அங்குறுமுல்ல, டெகிகம, முறுத்தலாவ |
| 10. | திருமதி எச். எம். டிக்கிறிமெனிக்க | .. | கெற்றபொல, முறுத்தலாவ |
| 11. | திருமதி டி. எம். கமலாகுமாரிகாமி | .. | கிறலகம, புஜாபிட்டிய |
| 12. | திரு. ஏ. ஆர். ஜயதுங்க .. | .. | அங்கொடை, மெதவல (கறிஸ்பத்து) |
| 13. | திரு. எச். எம். றம்பண்டா | .. | பொத்தோட்ட, மெதவல (கறிஸ்பத்து) |
| 14. | திரு. ஏ. உடுவாவல .. | .. | 11, கொழும்புத் தெரு, கண்டி |
| 15. | செல்வி என். கே. கப்புகொட்டுவ | .. | கொனிகொட, மெதவல (கறிஸ்பத்து) |
| 16. | திரு. ரி. ஈ. ஆர். குலத்துங்க | .. | தித்தபஜால, வெறலகம |
| 17. | திருமதி ஆர். பி. ஏ. வரகதெனிய | .. | வரக்கதெனிய, புஜாபிட்டிய |
| 18. | திருமதி எஸ். றணசிங்க .. | .. | 78/1, றணவான, கட்டுகாஸ்தோட்ட |
| 19. | திரு. எம். எம். பிரக்ஞசேகர பண்டா | .. | றட்டுகொகுதிகல, வத்தேகம |
| 20. | திருமதி எச். ஞானவதி வைத்தியசேகர | .. | " வில்சன்ஸ் ", உயன்வத்த, குருநாகல ரோட், கட்டு காஸ்தோட்ட |
| 21. | திருமதி எஸ். இரட்ஞயக்க | .. | தெகிகம, முறுத்தலாவ |
| 22. | திருமதி டபிள்யு. மல்லிகா வயலட் | .. | நுகெதென்ன, அளகொட, புஜாபிட்டிய |
| 23. | திருமதி கே. குணதர் .. | .. | " ஜயந்தி ", மறகொட, புஜாபிட்டிய |
| 24. | திரு. ஆர். எம். ஆர். அபயரட்ண பண்டா | .. | மககும்புற வலாஉவ, மங்கலகம, முறுத்தலாவ |
| 25. | திருமதி ஐ. கே. முல்லேகம | .. | முல்லேகம, அம்பதென்ன |
| 26. | திருமதி பி. பாலசூரிய .. | .. | றம்புக்வெல, கண்டி |
| 27. | திருமதி ஆர். சி. ஜயசீலி .. | .. | குலுகம்மான, கண்டி |
| 28. | திருமதி எம். உவலிஞ .. | .. | மெடியாறம்பெகெதர, கறங்ககவ, கண்டி |
| 29. | திருமதி எல். டி. கெதிபெராச்சி | .. | அளவத்துகொட |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

NUMBER OF PUPIL TEACHERS APPOINTED FROM AKURANA MULTI-MEMBER SEATS
THEIR NAMES, VILLAGES AND ADDRESSES ARE GIVEN BELOW

| | *Name* | *Village and Address* |
|---|---|---|
| 1. | Mrs. S. K. Basnayake | Henegedera Watta, Uduwawala, Katugastota |
| 2. | Mrs. N. W. Karunawathie | Nagahawatta, Uduwawala, Katugastota |
| 3. | Mrs. W. K. Wickremasinghe | Wattewalauwa, Hapugoda, Katugastota |
| 4. | Mr. K. G. Nandasena | Owissa, Pujapitiya |
| 5. | Mrs. T. D. Wijeratne | " Manel ", Ankumbura Road, Pujapitiya |
| 6. | Mr. R. M. Abayaratne | " Abayaniwasa ", Botota, Medawala, |
| 7. | Mrs. N. P. Dingirimenika | Arambepola, Alawatugoda |
| 8. | Mr. W. Premaratne | Palle-Ihagama, Medagama (Harispattu) |
| 9. | Mrs. A. M. M. Gunaratnemenike | Angurumulla, Dehigama, Muruthalawa |
| 10. | Mrs. H. M. Tikirimenika | Gettapola, Muruthalawa |
| 11. | Mrs. D. M. Kamalakumarihamy | Kiralagama, Pujapitiya |
| 12. | Mr. A. R. Jayatunga | Angoda, Medawala (Harispattu) |
| 13. | Mr. H. M. Rambanda | Botota, Medawala (Harispattu) |
| 14. | Mr. A. Uduwawala | 11, Colombo Street, Kandy |
| 15. | Miss N. K. Kapukotuwa | Gonigoda, Medawala, (Harispattu) |
| 16. | Mr. T. E. R. Kulatunga | Tittapajjala, Werellagama |
| 17. | Mrs. R. P. A. Warakadeniya | Warakadeniya, Pujapitiya |
| 18. | Mrs. S. S. Ranasinghe | 78/1, Ranawana, Katugastota |
| 19. | Mr. M. M. Praknasekera Banda | Ratukohudigala, Wattegama |
| 20. | Mrs. H. Gnanawathie Waidyasekera | " Vilsons ", Uyanwatta, Kurunegala Road, Katugastota |
| 21. | Mrs. S. Ratnayake | Dehigama, Muruthalawa |
| 22. | Mrs. W. Mallika Violet | Nugetenna, Alagoda, Pujapitiya |
| 23. | Mrs. K. Gunadar | " Jayanthi ", Marathugoda, Pujapitiya |
| 24. | R. M. R. Abayaratna Banda | Mahakumbura Walauwa, Mangalagama Muruthalawa |
| 25. | Mrs. I. K. Mullegama | Mullegama, Ambatenna |
| 26. | Mrs. P. Balasuriya | Rambukewela, Kandy |
| 27. | Mrs. R. C. Jayaseeli | Kulugammana, Kandy (*via*) |
| 28. | Mrs. M. Uwalina | Mediarambegedera, Harankahawa, Kandy |
| 29. | Mrs. L. D. Kethipearachchi | Alwatugoda |

ප්‍රශ්නයේ (ඊ) කොටසට පිළිතුරු

දැනට ඔවුන් සේවය කරන පාසල් හා එක් එක් පාසලට පත් කරනු ලැබූ සංඛ්‍යාව, පත් කරනු ලැබූ දින සහිතව වෙන්වෙන් වශයෙන්

| | නම | සේවය කරන පාසල | එම පාසලට පත්කළ සංඛ්‍යාව | පත්කළ දිනය |
|---|---|---|---|---|
| 1. | එස්. කේ. බස්නායක මිය. | මහ/අත්තරගම කණිෂ්ඨ වි. | 2 A | 1967.5.2 |
| 2. | එන්. ඩබ්ලිව්. කරුණාවතී මිය. | මහ/අත්තරගම කණිෂ්ඨ වි. | — | එම |
| 3. | ඩබ්. කු. වික්‍රමසිංහ මිය. | මහ/මඩදෙනිය වි. | 1 | එම |
| 4. | කේ. ජී. නන්දසේන මයා. | මහ/තිරිවානාකැටිය වි. | 4 B | එම |
| 5. | ටී. ඩී. විජේරත්න මිය. | මහ/අංකුඹුර ම. වි. | 1 | එම |
| 6. | ආර්. එම්. අබේරත්න මයා. | මහ/තිරිවානාකැටිය වි. | — | එම |
| 7. | එන්. පී. ඩිංගිරිමැණිකා මිය. | මහ/දුනුවිල රත්නපාල වි. | 4 C | එම |
| 8. | ඩබ්ලිව්. ප්‍රේමරත්න මයා. | මහ/දුනුවිල රත්නපාල වි. | — | එම |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | නම | සේවය කරන පාසල | එම පාසලට පත්කළ සංඛ්‍යාව | පත්කළ දිනය |
|---|---|---|---|---|
| 9. | ඒ. එම්. එන්. ගුණරත්න මැණිකේ මිය. | මහ/යටිහලගල උඩගම වි. | 3 D | 1967.5.2 |
| 10. | එච්. එම්. ටිකිරිමැණිකා මිය. | මහ/යටිහලගල උඩගම වි. | — | එම |
| 11. | ඩී. එම්. කමලාකුමාරිහාමි මිය. | මහ/කිරිවානාකැටිය වි. | — | එම |
| 12. | ඒ. ආර්. ජයතුංග මයා. | මහ/බටුගොඩ වි. | 1 | එම |
| 13. | එච්. එම්. රම්බන්ඩා මයා. | මහ/වටගොඩ ම. වි. | 2 E | එම |
| 14. | ඒ. උඩුවාවල මයා. | මහ/මුරුතලාව ප්‍රා. වි. | 1 | එම |
| 15. | එම්. කේ. කපුකොටුව මෙනෙ. | මහ/නුගවෙල ළදරු වි. | 1 | එම |
| 16. | ටී. ඊ. ආර්. කුලතුංග මයා. | මහ/යටහලගල පල්ලේගම වි. | 1 | එම |
| 17. | ආර්. පී. ඒ. වරකාදෙනිය මිය. | මහ/දුනුවිල රත්නපාල වි. | — | එම |
| 18. | එස්. එස්. රණසිංහ මිය. | මහ/කොණ්ඩදෙනිය වි. | 1 | එම |
| 19. | එම්. එම්. පඥසේකර බණ්ඩා මයා. | මහ/දීගල වි. | 1 | එම |
| 20. | එච්. ඥාණවතී වෛද්‍යසේකර මිය. | මහ/යටිහලගල උඩගම වි. | — | එම |
| 21. | එස්. රත්නායක මිය. | මහ/යටහලගල වි. | 1 | එම |
| 22. | ඩබ්ලිව්. එම්. මල්ලිකා වයලට් මිය. | මහ/මැදවල ම. වි. | 1 | එම |
| 23. | කේ. ගුණාදර් මිය. | මහ/මොලගොඩ පියදස්සි වි. | 1 | එම |
| 24. | ආර්. එම්. ආර්. අභයරත්න බණ්ඩා මයා. | මහ/කිරිවානාකැටිය වි. | — | එම |
| 25. | අයි. කේ. මුල්ලේගම මිය. | මහ/උඩුවාවල වි. | 1 | එම |
| 26. | පී. බාලසූරිය මිය. | මහ/අංකුඹුර උඩගම වි. | 1 | එම |
| 27. | ආර්. සී. ජයසිලි මිය. | මහ/වටගොඩ වි. | — | එම |
| 28. | එම්. යුවලිනා මිය. | මහ/දුනුවිල රත්නපාල වි. | — | එම |
| 29. | එල්. ඩී. කැනිපේආරච්චි මිය. | මහ/ඉඩමේගම වි. | 1 | එම |

— ලකුණෙන් දක්වෙන පාසැල්වලට පත්කල සංඛ්‍යාව A, B, C, D, E. සලකුණෙන් පෙන්වා ඇති පාසැල්වල අඩංගුකර ඇත.

**(ஈ) ஒவ்வொரு பாடசாலையிலும் தற்போது கடமையாற்றும் மாணவ ஆசிரியர்களின் எண்ணிக்கையும் அவர்களின் நியமனத் திகதிகளும்**

| | பெயர் | சேவை புரியும் பாடசாலை | பாடசாலைக்கு நியமிக்கப்பட்டவர்கள் எண்ணிக்கை | நியமனம் பெற்ற திகதி |
|---|---|---|---|---|
| 1. | திருமதி எஸ். கே. பஸ்ஞயக்க | க/அத்தறகம கனிட்ட வி. | 2அ | 1967.5.2 |
| 2. | திருமதி என். டபிள்யு. கருணவதி | க/அத்தறகம கனிட்ட வி. | — | ,, |
| 3. | திருமதி டபிள்யு. கே. விக்கிரமசிங்க | க/மாஉதெனிய வி. | 1 | ,, |
| 4. | திரு. கே. ஜி. நந்தசேன | க/திரிவணகெட்டிய வி. | 4ஆ | ,, |
| 5. | திருமதி ரி. டி. விஜயரட்ண | க/அங்கும்புர ம. வி. | 1 | ,, |
| 6. | திரு. ஆர். எம். அபயரட்ண | க/திவணகெட்டிய வி. | — | ,, |
| 7. | திருமதி என். பி. டிங்கிறிமெனிக்க | க/துனுவில இரட்ணபால வி. | 4இ | ,, |
| 8. | திரு. டபிள்யு. பிரேமரட்ண | க/துனுவில இரட்ணபால வி. | — | ,, |
| 9. | திருமதி ஏ. எம். எம். குணரட்ண மெனிக்க | க/யட்டிகலகல உடகம வி. | 3ஈ | ,, |
| 10. | திருமதி எச். எம். டிக்கிறிமெனிக்க | க/யட்டிகலகல உடகம வி. | — | ,, |
| 11. | திருமதி டி. எம். கமலகுமாரியாமி | க/திரிவணகெட்டிய வி. | — | ,, |
| 12. | திருமதி ஏ. எச். ஜயதுங்க | க/பத்துகொட வி. | 1 | ,, |
| 13. | திரு. எச். எம். றண்பண்டா | க/வத்தகொட ம. வி. | 2உ | ,, |
| 14. | திரு. ஏ. உடுவால | க/முறுத்தலாவ பி. வி. | 1 | ,, |
| 15. | செல்வி எம். கே. கப்புகொட்டுவ | க/குகவெல பாலர் சி. | 1 | ,, |
| 16. | திரு. ரி. ஆர். ஆர். குலதுங்க | க/யட்டிகலகல பல்லேகம வி. | 1 | ,, |
| 17. | திருமதி ஆர். பி. ஏ. வரகதெனிய | க/துனுவில இரட்ணபால வி. | — | ,, |
| 18. | திருமதி எஸ். எஸ். றணசிங்க | க/கெந்ததெனி வி. | 1 | ,, |
| 19. | திரு. எம். எச். பிரக்ஞசேகர பண்டா | க/தீகல வி. | 1 | ,, |
| 20. | திருமதி எச். ஞானவதி வைத்தியசேகர | க/யட்டிகலகல உடகம வி. | — | ,, |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | பெயர் | சேவை புரியும் பாடசாலே | பாசாலேக்கு நியமிக்கப்பட்டவர்களெண்ணிக்கை | நியமனம் பெற்ற திகதி |
|---|---|---|---|---|
| 21. | திருமதி எஸ். இரட்ணுயக்க | க/கட்டிகலகல வி. | 1 | 1967.5.2 |
| 22. | திருமதி டபிள்யு. எம். மல்லிகா வயலட் | க/மெதவல ம. வி. | 1 | ,, |
| 23. | திருமதி கே. குணுதர் | க/மெலகொட பியதசி வி. | 1 | ,, |
| 24. | திரு. ஆர். எம். ஆர். அபயரட்ண பண்டா | க/திரிவணகெட்டிய வி. | — | ,, |
| 25. | திரு. ஐ. கே. முல்லேகம | க/உடுவாவல வி. | 1 | ,, |
| 26. | திருமதி பி. பாலசூரிய | க/அங்கும்புர உடகம வி. | 1 | ,, |
| 27. | திருமதி ஆர். சி. ஜயசீலி | க/வத்தகொட வி. | — | ,, |
| 28. | திருமதி எம். உவலிணு | க/துனுவில இரட்ணபால | — | ,, |
| 29. | திருமதி எல். டி. கெதிபெராச்சி | க/இடமகம வி. | 1 | ,, |

NUMBER OF PUPIL TEACHERS NOW SERVING AT EACH OF THE SCHOOLS, AND THE DATE OF THEIR APPOINTMENTS INDIVIDUALLY

| | *Name* | *School Where Serving* | *No. Appointed to the School* | *Date of Appointment* |
|---|---|---|---|---|
| 1. | Mrs. S. K. Basnayake | K/Attaragama Junior V. | 2A | 1967.5.2 |
| 2. | Mrs. N. W. Karunawathie | K/Attaragama Junior V. | — | do. |
| 3. | Mrs. W. K. Wickremasinghe | K/Madadeniya V. | 1 | do. |
| 4. | Mr. K. G. Nandasena | K/Thriwanaketiya V. | 4B | do. |
| 5. | Mrs. T. D. Wijeratne | K/Ankumbura M.V. | 1 | do. |
| 6. | Mr. R. M. Abeyratne | K/Thiwanaketiya V. | — | do. |
| 7. | Mrs. N. P. Dingirimenika | K/Dunuwila Ratnapala V. | 4C | do. |
| 8. | Mr. W. Premaratne | K/Dunuwila Ratnapala V. | — | do. |
| 9. | Mrs. A. M. N. Gunaratnamenike | K/Yatihalagala Udagama V. | 3D | do. |
| 10. | Mrs. H. M. Tikirimenika | K/Yatihalagala Udagama V. | — | do. |
| 11. | Mrs. D. M. Kamalakumarihamy | K/Thiriwanaketiya V. | — | do. |
| 12. | Mr. A. R. Jayatunga | K/Batugoda V. | 1 | do. |
| 13. | Mr. H. M. Rambanda | K/Watagoda M. V. | 2E | do. |
| 14. | Mr. A. Uduwawala | K/Muruthalawa P.V. | 1 | do. |
| 15. | Miss M. K. Kapukotuwa | K/Nugawela Infant S. | 1 | do. |
| 16. | Mr. T. E. R. Kulatunga | K/Yatihalagala Pallegama V. | 1 | do. |
| 17. | Mrs. R. P. A. Warakadeniya | K/Dunuwila Ratnapala V. | — | do. |
| 18. | Mrs. S. S. Ranasinghe | K/Kondadeniya V. | 1 | do. |
| 19. | Mr. M. M. Praknasekera Banda | K/Deegala V. | 1 | do. |
| 20. | Mrs. H. Gnanawathie Waidyasekera | K/Yatihalagala Udagama V. | — | do. |
| 21. | Mrs. S. Ratnayake | K/Yatihalagala V- | 1 | do. |
| 22. | Mrs. W. M. Mallika Violet | K/Medawala M.V. | 1 | do. |
| 23. | Mrs. K. Gunadar | K/Molagoda Piyadassai V. | 1 | do. |
| 24. | Mr. R. M. R. Abayaratna Banda | K/Thriwanaketiya V. | — | do. |
| 25. | Mr. I. K. Mullegama | K/Uduwawala V. | 1 | do. |
| 26. | Mrs. P. Balasuriya | K/Anukumbura Udagama V. | 1 | do. |
| 27. | Mrs. R. C. Jayaseeli | K/Watagoda V. | — | do. |
| 28. | Mrs. M. Uwalina | K/Dunuwila Ratnapala | — | do. |
| 29. | Mrs. L. D. Kethipearachchi | K/Idamegama V. | 1 | do. |

The numbers appointed to the schools indicated by — sign have been included in schools shown by A.B.C.D.E.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Question No. 14.

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

I want a month's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க ஆணையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Question No. 16.

**විමලසේන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට)**

*(திரு. விமலசேன—விவசாய, உணவு அமைச்சர் சார்பாக)*

(Mr. Wimalasena—on behalf of the Minister of Agriculture and Food)

The Hon. Minister of Agriculture and Food requires two months' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

*சபை அமர்வு*

SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land Irrigation and Power and Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1967 ජූනි මස 4 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය; එදින සභා රැස්වීම පැවැත්වීමේ කාලවේලා පෝය දින සිට යෙදෙන හතරවන දිනයක මෙන් විය යුතුය."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය: ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනත් කෙටුම්පත පිළිබඳව ලංකා ගුවන් විදුලි සංස්ථාව ප්‍රචාරය කළ ප්‍රවෘත්තිය

*சிறப்புரிமை வினா: இந்திய-இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) மசோதா பற்றி இலங்கை ஒலிபரப்புக்கூட்டுத்தாபன ஒலிபரப்பு*

QUESTION OF PRIVILEGE: C.B.C. NEWS BROADCAST ON INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) BILL

**මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)**

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්ට තිබෙනව. එය ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනත් කෙටුම්පත සම්බන්ධව අද උදේ ලංකා ගුවන් විදුලි සංසථාවෙන් ප්‍රචාරය කළ ප්‍රවෘත්තියක් සම්බන්ධවයි. හතර දෙනෙකුට ලංකා පුරවැසි භාවය දෙන ගමන් හත් දෙනෙකු පිටමං කිරීමට රජය තීරණය කළාය යන්නයි ගුවන් විදුලි සංසථාවෙන් අද උදේ ප්‍රචාරය කළ ප්‍රවෘත්තියෙ සඳහන් වුණේ. ඒක ඇත්තක් නම් විරුද්ධ පක්ෂය ඉතාමත් සන්තෝෂ වෙනව. නමුත් රජය ඒ ප්‍රතිපත්තිය පිළිනොගෙන හතර දෙනෙකුට ලංකාවේ පුරවැසිභාවය දෙන විට ඉන්දියානු පුරවැසිභාවය ලබන හත් දෙනා ලංකාවේම නවතා ගැනීම ගැනයි අප තර්ක කළේ. ලංකා ගුවන් විදුලි සංසථාව මගින් මේ අන්දමේ වැරදි ප්‍රවෘත්ති ප්‍රචාරය කළ පළමුවන වතාව මේක නොවෙයි. ඔබතුමාට මතක ඇති මීට කලිනුත් දිනයක අර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබඳව සලකා බැලීමට පත් කළ කාරක සභාවෙන් අප අස් වූ පසුත් අප ඒ කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් නම් කරමින් ප්‍රවෘත්තියක් ප්‍රවෘත්ති අංශ යෙන් ප්‍රචාරය කළ බව. එම නිසා මේ කාරණය සම්බන්ධව පරීක්ෂණයක් කරන ලෙසත්, සුදුසු පරිදි කටයුතු කරන ලෙසත්, මා ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

As you have raised this as a matter of Privilege I shall ask the Clerk of the House to investigate it and take necesasry action.

## බෝපත් පිටිය ජල යෝජනා ක්‍රමය
*போபத்பிற்றிய நீர் விநியோகத் திட்டம்*
## BOPATHPITIYA WATER SUPPLY SCHEME

අ. භා. 2.24

**ඩී. පී. ආටිගල මයා.** (රත්නපුර)
*(திரு. டீ. பீ. ஆட்டிகல—இரத்தினபுரி)*
(Mr. D. P. Attygalle—Ratnapura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවසථාව ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුති වන්ත වෙනවා. යෝජනාව මෙසේයි:

"රත්නපුර නගරයේ ජල ප්‍රශ්නය ඉතා උග්‍ර එකක් බැවින් සබරගමු පළාතේම අගනුවර වන රත්නපුර නගරයට සතුටුදායක අන්දමින් ජලය සැපයීමට මෙතෙක් කිසිම සාර්ථක ක්‍රියා මාර්ග යක් අනුගමනය කර නැති හෙයින්ද,

විශේෂයෙන් රත්නපුර මහාරෝග්‍ය ශාලාවට හා ආයුර්වේද ආරෝග්‍ය ශාලාවට ජල ප්‍රශ්නය නිසා මහත් දුෂ්කරතාවයකට මුහුණ පාන්නට සිදුවී ඇති හෙයින්ද; බෝපත්පිටිය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන්—

(i) රත්නපුර ආසනයේ කුරුවිට රත්නපුර ආදී ප්‍රදේශවලට පමණක් නොව දෙහිඕවිට ආසනය, කිරිඇල්ල ආසනය ආදී ප්‍රදේශවලටද ප්‍රයෝජනය ගත හැකි හෙයින්ද,

(ii) ඇහැළියගොඩ නගරයට මෙන්ම ඇහැළිය ගොඩ ආරෝග්‍යශාලාවටද දැනට ඇති උග්‍ර ජල ප්‍රශ්නය විසඳාගත හැකි වන හෙයින්ද,

(iii) ජල විදුලිය යෝජනා ක්‍රමයක් ද ඉබේම මෙන් ක්‍රියාත්මක කළ හැකි වන අතර, එයින් විදුලි බලය නිපදවීමෙන් දැනට යෝජනා කර තිබෙන රත්නපුර ප්‍රදේශ යේ කර්මාන්ත, ව්‍යාපාර සඳහාද එමගින් මහත් ප්‍රයෝජනයක් සැලසෙන හෙයින් ද,

මෙම යෝජනාව අලුත් එකක් නොවන අතර, නීතිඥ ඒ. සී. ආටිගල මැතිතුමා රත්නපුර පළාත් ආණ්ඩු සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරද්දී කරන ලද එමෙන්ම ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටි එකක් වන හෙයින්ද, රත්නපුරේ කුරුවිට කුරුගගේ සුප්‍රසිද්ධ බෝපත් පිටිය ඇල්ල බැඳ එහි සිට රත්නපුර නගරයට ජලය සැපයීමට අප්‍රමාදව කටයුතු කළ යුතුයැයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව රත්නපුර නගරයට පමණක් නොව ඒ අවට තිබෙන බොහෝ ප්‍රදේශ වලටත් ඉතා ප්‍රයෝජනවත් යෝජනා වක් බව මේ ගරු සභාව පිළිගන්නවා ඇතැයි මා කල්පනා කරනවා. කිරිඇල්ල මැතිවරණ කොට්ඨාශයෙන් කොටසකටත්, දෙහිඕවිට මැතිවරණ කොට්ඨාශය, නිවිතිගල මැතිවරණ කොට්ඨාශය, පැල්මඩුල්ල මැති වරණ කොට්ඨාශය, ආදි ප්‍රදේශවලටත් ප්‍රයෝජනවත් වන ආකාරයට සකස් කර ගත යුතු ඉතා වැදගත් යෝජනාවක් ලෙස මෙය හඳුන්වන්නට පුළුවනි. ඒ බව මේ යෝජනාවෙම විස්තර කර තිබෙ නවා. රත්නපුර දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ අටකට බෙදා වෙන් කර තිබෙ නවා. ඒ වගේම රත්නපුර නගරය තුළ පමණක් 25,000 කට වැඩි ජනගහනයක් තිබෙනවා. ඒ නගරවාසීන්ට පමණක් නොව රත්නපුර නගරයට මුළු ලංකාවේම වෙනත් ප්‍රදේශවලින් අවුරුද්දේ නො යෙක් කාලවලදී අවුරුදුපතා පැමිණෙන අති විශාල ජනකායකට මේ යෝජනාව ක්‍රියාත්මක කළ විට විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා. නොයෙක් කාරණා සඳහා වරින් වර විශාල පිරිසක් රත්නපුරයට එනවා. අවුරුද්දක් පාසා මාස ගණනාවක් තුළ නොකඩවා විශාල ජනකායක් ශ්‍රීපාද වන්දනාවට මේ ප්‍රදේශයට පැමිණෙනවා. ඒ ජනයාටත්, සමන් දේවාලය වැඳ පුදා ගැනීමට පැමිණෙන බැතිමතුන්ටත්, මුහු ණ පාන්නට සිදු වන බලවත් කරදරයක් නම් ජල පහසුව නැතිකමයි. ඒ ප්‍රශ්නය වහාම විසඳීමටත් මෙම යෝජනාව ප්‍රයෝ ජනවත් වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බෝපත්පිටිය ජල යෝජනා ක්‍රමය

දැනට රත්නපුරා නගරයේ තිබෙන්නේ මීට අවුරුදු තිස් නවයකට උඩදී හත් අට දාහක ජනකායක් සඳහා සකස් කළ ජල සම්පාදන ක්‍රමයක් බව පළමුවෙන්ම මතක තබා ගත යුතුයි. දැන් පවතින තත්ත්වයට ඔරොත්තු දීමට එය කිසි සේත් ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ කාලයේ ඇති කළ ජල නළ පවා දැන් බොහොම පරණ නිසා දිරා ගොස් තිබෙනව. මුල් වකවාණුවේදී ලැබුණු ජල ප්‍රමාණයවත් දැන් මේ නළවලින් ලැබෙන්නෙ නැහැ. එදා ප්‍රමාණය මෙන් දෙතුන් ගුණයක් ජනගහණයක් අද තිබෙන රත්නපුරා නගරයට දළ වශයෙන් අවුරුද්දකට අඟල් 150කට වැඩි වර්ෂාපතනයක් තිබෙනව. ඒ වගේම අවුරුද්දේ මාස දොළහෙන් මාස නවයක් තිස්සෙම වර්ෂාව තිබෙනව. එපමණක් නොව ලංකාවේ ප්‍රධාන ගංගාවන් හතරින් එකක් වන කළු ගඟත් මේ ප්‍රදේශය මැදින් ගලා ගෙන යනව. මේ ප්‍රදේශය නිතරම වාගේ ජලයෙන් යට වෙනව. ඒ කොයි හැටි වෙතත්, රත්නපුර නගරවාසීන්ට බීමට පවා ජලය සපයා දීමට විධිමත් වැඩ පිළිවෙළක් මේ වන තුරු නොතිබීම ගැන කියන්නත් කනගාටුයි.

රත්නපුර නගරයට ජලය ලබා දීම සඳහා රත්නපුර නගර සභාව මඟින් නොයෙක් ව්‍යාපාර යොදා තිබෙනව. එහෙත් එයින් මුදල් නාස්ති වුණා මිස ප්‍රශ්නයට නිසි විසඳුමක් ලැබුණේ නැහැ. පයිප්ප දමා තිබෙනව. එයින් නියම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. ළිං කප්පවා තිබෙනව. කළු ගඟින් ජලය ලබා ගෙන බෙදා දීමටයි ඒවා කප්පවා තිබෙන්නෙ. ඒ සඳහා විශාල මුදලක් යොදා තිබෙනව. එයිනුත් නිසි ප්‍රයෝජනයක් ලැබී නැහැ. ඒ ළිං දැන් මැණික් පතල් බවට පරිවර්තනය වී තිබෙනව. ලොරිවලිනුත්, තාර පීප්පවලිනුත් මේ නගරයට වතුර ගෙනෙන්නට සිදු වෙනව. වතුර පීප්පයකට රුපියලක් දෙකක් හෝ ඊටත් වැඩි ප්‍රමාණයක් වැය වෙනව. මේ නගරයේ නොයෙක් උත්සව පැවැත් වෙනව. උත්සව ගණනාවක් ඇති වුණොත් එයින් එකකට පමණයි වතුර ලබාගත හැකි වන්නෙ. මෙතෙක් කල් මේ සා විශාල මහජන ධනස්කන්ධයක්

වැය කර ඇති නමුත් නියම ප්‍රයෝජනයක් රත්නපුර නගරයට ලැබී නැති නිසා රත්නපුරයටත් අවට ප්‍රදේශ රාශියකටත් ප්‍රයෝජනවත් වන මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන මේ යෝජනාව අනුමත කරන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

**එච්. කුලරත්න මයා.** (රක්වාන)
*(திரு. எச். குலரத்ன—றக்குவான)*
(Mr. H. Kularatne—Rakwana)
**විසින් ස්ථිර කරන ලදී.**

ஆமோதித்தார்.
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

අ. භා. 2.30

**පී. බී. විජයසුන්දර මයා.** (කිරිඇල්ල)
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෝපත්පිටිය ජල යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් මේ ගරු සභාව වෙත දැන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී එම යෝජනාව සම්ථිර කිරීමට මා ඉතා සතුටින් බලාපොරොත්තු වුණා. ඒ මන්ද? මේ යෝජනාව සඳහා රාජ්‍ය මන්ත්‍රණ සභාවට සහ පාර්ලිමේන්තුවට කල් දුන් තුන්වැන්නා හැටියට ඒ යෝජනාව අද දින යළිත් වරක් ඉදිරිපත් කරනු ලැබූ විට එය සම්ථිර කිරීම මගේ බලවත් සතුටට හේතු වන්නක්. පසුගිය පාර්ලිමේන්තු සැසි වාර දෙකකදීම මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට කල් දුන් නමුත් එම පාර්ලිමේන්තු සැසිවාර කල් තැබීමේ හේතුවෙන් එම යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඉබේම අහෝසි වී ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව ඇති වීමට පෙර තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී එදා 1931දී රත්නපුර මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වුණු විමලසුරේන්ද්‍ර මැතිතුමාත්, 1936 දී රත්නපුර මන්ත්‍රීවරයා වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

තේරී පත් වුණු ජයවීර කුරුප්පු මැතිතුමාත් මෙම යෝජනාව ගැන උනන්දුවක් දක්වා කටයුතු කළා. ඒ වගෙම වර්තමාන රත්නපුර මන්ත්‍රීතුමාගේ මයිලණුවන් කෙනකු වූ රත්නපුර නගර සභාවේ හිටපු සභාපති ඒ. සී. ආටිගල මැතිතුමාත් පළාත් පාලන සම්මේලනයේදී මෙම යෝජනාව ඉදිරිපත් කර බොහොම උනන්දුවෙන් කටයුතු කර තිබෙනවා. එය එසේ වුවද තවමත් මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්නට පුළුවන් වී නැහැ.

ඒ අතර අදත් මෙම ගරු සභාවේ තත්ත්වය දෙස බලන විට මෙම යෝජනාව ගැන ඒ තරම් උනන්දුවක් දක්වන බවක් පෙනෙන්නට නැහැ. මෙම යෝජනාව අමාත්‍යාංශ කීපයකටම සම්බන්ධ වෙනවා. ප්‍රධාන වශයෙන් මෙය පළාත් පාලන අමාත්‍යාංශයේ කටයුත්තක්. එහෙත් මේ අවස්ථාවේදී පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා මෙහි පෙනෙන්නට නැහැ. අද දින මෙම යෝජනාව ඉදිරිපත් කරන බව එතුමා දන්නවාදැයි මා නම් දන්නෙ නැහැ. වාරිමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමාටත් මෙම යෝජනාව යටතේ කටයුතු වගයක් කරන්නට සිදු වෙනවා. නමුත් මේ අවස්ථාවේදී එතුමාත් මෙහි නැහැ. රාජ්‍ය ඇමතිතුමාටත් මෙහි සම්බන්ධකමක් තිබෙනවා. බෝපත්පිටිය ඇල්ල දර්ශනීය ස්ථානයක් නිසා දේශ සංචාරක කටයුතු භාර වී සිටින රාජ්‍ය ඇමතිතුමාටත් මෙහි සම්බන්ධතාවක් තිබෙනවා. කෙසේ වෙතත් අද දින ඇමතිවරුන් වශයෙන් මේ ස්ථානයේ සිටින්නේ කර්මාන්ත ඇමතිතුමා පමණයි. මෙම යෝජනාව අදාළ වන අමාත්‍යාංශයක් භාර ඇමතිවරයකු මේ අවස්ථාවේදී මෙහි නොසිටීම ගැන මා කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ගැන කථා කරන විට අවුරුදු 30ක් ආපස්සට අපේ හිත ගමන් කරනවා. බෝපත්පිටිය රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි ඉතාමත්ම රමනීය ස්ථානයක්. එහි කවදාකවත් නොසිඳෙන දිය ඇල්ලක් තිබෙනවා. අවුරුද්දේ මාස දොළහ තුළ කවදාක්වත් ඒ දියඇල්ල සිඳෙන්නේ නැහැ. එසේ හෙයින් මුළු ප්‍රදේශයටම ජල සේවයක් සකස් කිරීමට එය මූලස්ථානය කර ගන්නට පුළුවනි. රත්නපුර නගරයේ "ස්විමිංපූල්" එකක් තිබුණත් ඉතාමත් රමනීය භූමි භාගයක පිහිටි බෝපත්පිටියේ ජලාශයට ගොස් නෑමේ පුරුද්දක් අප කුඩා කාලයේදී තිබුණා. අප බොහෝ විට එහි ගියේ වර්තමාන රත්නපුර ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වයෙනුයි. ඒ ස්ථානයේ හිතුවක්කාර ලෙස නෑම ගැන මාද එදා එතුමාගේ දඬුවම්වලට භාජන වුණා. කෙසේ හෝ වේවා ඒ දවස්වල පටන්ම මේ බෝපත්පිටිය ඇල්ල මූලස්ථානය කොටගෙන ජල සේවයක් ඇති කිරීම සඳහා ඒ දිස්ත්‍රික්කයේ මහජනයාත් රත්නපුර කොට්ඨාශය නියෝජනය කළ උදවියත් තුළ විශාල ආශාවක් පැවතුණා. එහෙත් තවමත් රජය මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සිතුවිල්ලක් හෝ ඇති කරගෙන නැති බව පෙනෙන්නට තිබෙනවා.

අද මේ වගේ ජලනල යෝජනා ක්‍රමයක අවශ්‍යතාව ඉතා තදින් දැනෙනා. පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරකසභා රැස්වීමේදීත් රත්නපුර ගරු මන්ත්‍රීතුමාත් මාත් දූනට කළුගඟ ඔස්සේ පැමිණ සිටින මුහුදු සර්පයන් ගැන දිසාපතිතුමාට මතක් කළා. "වාලක්කඩි" යනුවෙන් මේ සර්පයන්ට ග්‍රාමීය වශයෙන් කියනවා. ඉන්දියානු සාගරයේ සිටින මෙම සර්පයන් නාවිකයන් පවා දෂ්ට කරනවා. එසේ කළ විට මුහුදේදීම ප්‍රතිකාර නොකළහොත් මරු මුවට පත් වෙනවා. මෙම සර්පයන් කළු තරින් කළුගඟ දිගේ රත්නපුර නගරය කරා ගමන් කර තිබෙනවා. රත්නපුරය අසළ දැන් ඔවුන් බෝවෙලා. ඉංගිරියේ පටන් රත්නපුරය දක්වා කළුගඟේ නෑමට පුරුදු වී සිටි ජනතාව දැන් හුඟක් දුරට එහි නෑම නවත්තලා. නෑමට ගිය කීප දෙනකුම මෙම සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීමෙන් මිය ගොස් තිබෙනවා. මේ තත්ත්වය නිසා අද නෑමට ස්ථාන පවා සොයා ගැනීම දුෂ්කර වී තිබෙනවා. බොහෝ දෙනාට දැන් ළිං කපා ගන්නට සිදු වෙලා. සමහර උදවිය පෞද්ගලික ළිං කපාගන යනව. නමුත් එයින්වත් මේ ජල යෝජනා ක්‍රමය ඇති කිරීමේ අවශ්‍යතාව අඩු වන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ සමගම විශේෂයෙන් මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනව. රත්නපුර මහා රෝග්‍යශාලාවට වතුර සපයන්නෙ සීමා සහිත පැය ගණනක් පමණයි. සමහර අවස්ථාවලදී "රෙසවොයර්" එකේ වතුර හිඳී යාම නිසා දවසකට පැය තුන හතරකට වඩා වතුර සපයන්නට බැරි තත්ත්වයක් ඇති වෙනව. එවැනි තත්ත්වයක් තිබෙද්දීත් දොළොස් මාසය පුරාම වතුර සපයන්නට පුළුවන් මේ විශාල ජලාශය ප්‍රයෝජනයට නොගන්නෙ ඇයිද කියන එක අපට විශාල ප්‍රශ්නයක් වී තිබෙනව.

උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව ඇති කළ අවස්ථාවෙදි අප බලාපොරොත්තු වුණා, මෙවැනි යෝජනාවලට උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභා යෝජනාවලියේ සැලකිය යුතු ස්ථානයක් ලැබේය කියා. ආණ්ඩු 4ක් 5ක් මාරු වුණා. ඒ කොමිෂන් සභාවෙ නියෝජිතවරු රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධතාකාරක සභාවට ඇවිත් කියනව, රත්නපුර දිස්ත්‍රික්කයත් උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවට අයත් ප්‍රදේශයක් හැටියට ඇතුළත් කරන්නට යනවාය කියා. ඔවුන් එසේ කියා අපෙනුත්, දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙනුත් යෝජනා ලබා ගෙන කොළඹ පිහිටි ඔවුන්ගෙ කාර්යාලයට එවනව. ඒ නිසා දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ප්‍රධානීන් අපේ යෝජනා ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කරන්නෙ නැහැ. "රත්නපුර දිස්ත්‍රික්කයත් ලබන අවුරුද්දෙ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව සටහනට ගනීවි; ඒ නිසා මේ යෝජනා ප්‍රධාන කාර්යාලයට එවීමෙන් වැඩක් නැත" යන අදහසිනුයි, ඔවුන් එසේ කටයුතු කරන්නෙ. මෙවැනි ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන නිසා රත්නපුර දිස්ත්‍රික්කයට දෙපාර්තමේන්තුවලින් වැඩක් කෙරෙන්නෙත් නැහැ; අමාත්‍යාංශවලින් වැඩක් කෙරෙන්නෙත් නැහැ; උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවෙන් වැඩක් කෙරෙන්නෙත් නැහැ. ඒ කොමිෂන් සභාවෙ තීරණ රත්නපුර දිස්ත්‍රික්කයට වලංගු වන්නෙ නැහැ. ඒ නිසා බොහෝ වැඩ අතරමං වී තිබෙනව. බෝපත්පිටිය ජල යෝජනා ක්‍රමයත් එවැනි අතරමං වූ යෝජනා ක්‍රමයක් හැටියට පෙන්වා දෙන්නට පුළුවන්.

ඒ වගේම, බෝපත්පිටිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණොත් එමගින් ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් ඉෂ්ට කර ගැනීමට පුළුවන්කම ලැබෙනව. රත්නපුර නගරයට සහ අවශ්‍ය අනෙක් ස්ථානවලට ජලය සපයා ගැනීමත්, ජල විදුලි යෝජනා ක්‍රමයක් ඇති කිරීමෙන් කර්මාන්ත දියුණුවක් ඇති කිරීමත් යන දෙකයි, ඒ. ඒ ස්ථානයෙ ජල විදුලි යෝජනා ක්‍රමයක් ඇති කළොත් ඒ පළාතේ සුළු කර්මාන්ත දියුණු කරන්නටත්, ඒ වාගේම විදුලි බලය අවශ්‍ය වෙනත් කර්මාන්ත කිහිපයක්ම ආරම්භ කරන්නටත් විශාල ඉඩක් ලැබෙනව.

රත්නපුර දිස්ත්‍රික්කය ලැබිය යුතු, ඒ වගේම අප බලාපොරොත්තු වන සහනයක් ඒ ප්‍රදේශයට ලැබී නැහැ. විශේෂයෙන් නින්දගම් පනත ගැන අපි ලොකු බලාපොරෙත්තුවක් ඇති කරගන සිටිය, ඒ පනත් කෙටුම්පත රජය විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවෙදි. නමුත් එය දවසින් දවස න්‍යාය පත්‍රයේ පහළට වැටෙනව. ඒ පනත් කෙටුම්පත සම්මත කර ගත්තොත් ඒ ප්‍රදේශයේ ජනතාවට එයින් සුළු සහනයක්වත් ලැබෙනව. නමුත් නින්දගම් පනත් කෙටුම්පත බලංගොඩ අතුරු මැතිවරණ කාලයේ සටන් පාඨයකට සීමා වුණා.

මම රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් කථා කරනවා නොවෙයි. රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සිටින නමුත් අඩු ගණනේ පාර්ලිමේන්තු ලේකම්වරයෙක්වත් එම දිස්ත්‍රික්කයට ලබා ගන්නට බැරි වී තිබෙනව. මෙපමණ කාලයක් තුළ වරින් වර ඇති වුණු සෑම ආණ්ඩුවක්ම පාහේ රත්නපුර දිස්ත්‍රික්කයට ඇමති පදවියක් නැත්නම් පාර්ලිමේන්තු ලේකම් පදවියක් දුන්න. නමුත් මේ ආණ්ඩුව යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කට හඬ බොහෝ දුරට සීමා කර තිබෙනව. ඒ නිසා මා ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනව, රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්න රාශිය විසඳීම සඳහා මහන්සි වී ක්‍රියා කරන හැටියට. ඉහත සඳහන් තත්ත්වය යටතේ රත්නපුර දිස්ත්‍රික්කය අද අතරමං වී ඇති නිසා මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

යෝජනාව සම්මත කර එය ක්‍රියාත්මක කිරීමට සහයෝගය දේයයි මා බලාපොරොත්තු වෙනව.

රත්නපුර ප්‍රදේශයේ බෝපත් පිටිය ජල යෝජනා ක්‍රමයටත් වඩා පැරණි යෝජනා ක්‍රමයක් තමයි, කිරිඇල්ල ජල යෝජනා ක්‍රමය. කිරිඇල්ල ජල යෝජනා ක්‍රමය කලින් සඳහන් යෝජනා ක්‍රමයට වඩා අඩු වියදමකින් ක්‍රියාත්මක කරන්නට පුළුවන් යෝජනා ක්‍රමයක්. ඒ යෝජනා ක්‍රමය ආරම්භ වූයේ 1931 දීයි. නමුත් 1935 දී එය අඩපණ වුණා; වතුර සැපයීම ඇනහිටියා. තවමත් මේ යෝජනා ක්‍රමයේ නෂ්ටාවශේෂ වශයෙන් ජල නල තිබෙනව. නමුත් 1935 සිට මේ දක්වා වතුර නැහැ. එම නිසා මේ අතපසු වී ගිය ජල නළ යෝජනා ක්‍රම ගැනත්, මේ යෝජනා කර තිබෙන ජන නළ යෝජනා ක්‍රමය ගැනත් සැලකිල්ලක් දක්වා මේවා ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරන ලෙස ඒ ඒ අංශ භාර ඇමතිවරුන්ගෙන් ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 2.40

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ අවස්ථාවේ සභාවේ නොමැති නිසා මේ යෝජනාවට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර තිබෙන සංක්ෂිප්ත වාර්තාවක් කියවන්නට මා බලාපොරොත්තු වෙන්නෙ. ඒ මෙසේයි :

රත්නපුර නගරය මැදින් ගලා යන කළු ගඟෙන් රත්නපුරයට ජලය සැපයීම පිණිස ජලවෘද්ධි යෝජනා ක්‍රමයක් සඳහා වූ විමශීන අවසාන කර ඇත. මේ සඳහා ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තුවල සංකේත ප්‍රතිපාදනයක් ඇතුළත් කර තිබේ.

කිරිඇල්ල නගරයට ආසන්න ස්ථානයකින් ජලය ලබාගෙන කිරිඇල්ලට ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඇති කිරීමට හා අවිස්සාවේල්ලට ජලය ලබාගන්නා ස්ථානයෙන් ම ජලය ලබාගෙන දෙහිඕවිට සඳහා ජලසම්පාදන යෝජනා ක්‍රමයක් ඇති කිරීම පිණිසද විමශීන පවත්වා අවසාන කර ඇත. මේ සඳහා නළ මගින් ජලය ලබාගතහැකි සුදුසු ස්ථාන ගණනාවක්ම ඇහැලියගොඩටත්, කුරුවිටටත් ආසන්නව පිහිටා තිබේ.

බෝපත්පිටිය දිය ඇල්ල සමීක්ෂණයකට භාජන කර නොමැති අතර, එයින් ලබාගත හැකි ජළ ප්‍රමාණය කොපමණදැයි නොදනී. යෝජනාවේ සඳහන් ප්‍රදේශවලට මෙම ස්ථානයෙන් ජලය සැපයීමට හැකිකම ගැන තීරණය කිරීමට යටත් පිරිසෙයින් අවුරුද්දක්වත් විමශීන පවත්වාගෙන යා යුතුව ඇත.

බෝපත්පිටියේ දිය ඇල්ලෙන් ප්‍රධාන ඒකාබද්ධ යෝජනා ක්‍රමයක් ඇති කිරීමට වඩා, යථෝක්ත ප්‍රදේශවලට ආසන්නව පිහිටා තිබෙන ස්ථානවලින් ජලය සැපයීමේ යෝජනා ක්‍රම ඇති කිරීමෙන් තුලනාත්මකව සලකනවිට, ඒ ප්‍රදේශවල අඩුයයි සැලකිය හැකි අවශ්‍යතාවන් සපුරාලීමට හැකිවන අතර, එය ආර්ථික අතින් වඩාත් යෝග්‍ය වෙනවා ඇත. කිරිඇල්ලටත්, දෙහිඕවිට හා රත්නපුරයටත් ජලය සැපයීම පිණිස එසේ ප්‍රධාන ඒකාබද්ධ යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා තුන් දිසාවකට සැතපුම් 15 සිට සැතපුම් 20 කට ආසන්න දුර ප්‍රමාණයකට ප්‍රධාන ජලනල සැපයීමට අවශ්‍යවෙනවා ඇත. මෙම සියලුම නගර අතුරෙන්, රත්නපුරයට පමණක් ජලය සඳහා තරමක වැඩි අවශ්‍යතාවක් පවතින අතර, දිනකට වතුර ගැළුම් විසිලක්ෂයක් පමණ අවශ්‍යවෙනවා ඇත.

අ. භා. 2.43

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවෙන් කථා කළ රාජ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළා, බෝපත්පිටිය දිය ඇල්ල වැඩ පිළිවෙළ විමර්ශනය සඳහා අවුරුද්දක්වත් ගත වෙනවා කියා. මා හිතන්නෙ මේ යෝජනාව ඉදිරිපත් කරලත් අවුරුද්දකට වැඩි වන්ට ඇති කියායි. දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරකසභා ආදියේ මේවා ඉදිරිපත් කර, ඒ ස්ථානවලදී මේවා ගැන සාකච්ඡා කර, පිළිගත්තායින් පසුව තමයි, බොහෝවිට මෙවැනි ප්‍රශ්න අමාත්‍යාංශවලට ඉදිරිපත් කරන්නෙ. එවැනි ප්‍රශ්නයක් විමර්ශනය කරන්ට තව අවුරුද්දක් ගත වෙනව නම් අවුරුදු ගණනාවකට මේ ප්‍රදේශයට ජලය ලැබේදැයි කියන්ට අමාරුයි.

අපේ තිබෙන ප්‍රධාන දුර්වලකම තමයි ලංකාවේ ස්වාභාවික ධන නිධාන, ගංගා දිය ඇලි ආදිය ගැන සෑහෙන අන්දමට විධිමත් පර්යේෂණ නොකිරීම. ලෝකයේ කිසිම රටකට නැති අන්දමේ ස්වාභාවික ධන නිධානයන් අපට තිබෙන බවට තමුන්නාන්සේ දන්නවා. දිය ඇලි හා ගංගා ඉන් ප්‍රධාන තැනක් ගන්නවා. මේ රටේ මෙ තරම් ගංගාවන් හා දිය ඇලි තිබුණත් අපේ ගම්බද බොහෝ ප්‍රදේශවල මහජනයාට පානය සඳහා පිරිසිදු ජලය නොලැබෙන බව කවුරුත් දන්නා කාරණයක්. එයින් මහජන සෞඛ්‍යයට ලොකු තර්ජනයක් එල්ල වී තිබෙනවා. යම් ප්‍රදේශයකට පිරිසිදු ජලය ලැබෙන්නෙ නැත්නම් ඒ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ජීවිතයට ඒක ලොකු තර්ජනයක් වෙනවා. ඒ නිසා රටේ ජනතාවගේ ජල ප්‍රශ්නය ගැන ක්‍රියා කළ යුත්තේ පළාත් පාලන අමාත්‍යාංශය මගින් පමණක් නොවෙයි. මෙය පළාත් පාලන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය යන දෙකම සම්බන්ධ වී ක්‍රියා කළ යුතු ප්‍රශ්නයක්. ආහාර වගේම ජලයත් මහජනයාට අවශ්‍යයි. කොතරම් හොඳ ආහාර තිබුණත් හොඳ ජලය නැත්නම් නිරෝගී ජාතියක් ගොඩනගන්නට පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා දැනට පිරිසිදු ජලය නොලැබෙන නගර හා ගම්මාන සියල්ලක් ගැන සලකා බලා මුළු ලංකාවටම පොදු පිරිසිදු ජලය සැපයීමේ සැලැස්මක් ඇති කරන්නය කියා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත් රජයෙනුත් මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අපට තිබෙන ස්වාභාවික ජලමාර්ගවන් දිය ඇලි හා ගංගා පාවිච්චි කර මුළු ලංකාවටම පොදු ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඇති කළ යුතු බව මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## රත්නපුර නගරය සඳහා නිවාස යෝජනා ක්‍රම

## இரத்தினபுரிப் பட்டணத்துக்கு வீடமைப்புத் திட்டம்

## HOUSING SCHEMES FOR RATNAPURA TOWN

අ. භා. 2.45

**ආටිගල මයා.**
(திரு. ஆட்டிகல)
(Mr. Attygalle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි යෝජනාව රත්නපුර නගරය සඳහා නිවාස යෝජනා ක්‍රම ඇති කිරීම ගැනයි. යෝජනාව මෙයයි:

"රත්නපුර නගරයේ පදිංචිව සිටීමට සිදුවී තිබෙන රජයේ සේවක මහත්වරුන්ට නිවාස පහසුකම් අතින් මුහුණපාන්නට සිදුවී ඇති දුෂ්කරතාවය මගහැරවීම සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ඉතාමත්ම අවශ්‍ය වී ඇති අතර, දැනට මේ සඳහා ඇති කර තිබෙන නිවාස යෝජනා ක්‍රමය කිසිසේත් ප්‍රමාණවත් නොවන හෙයින්ද, රත්නපුර නගරය නිතර නිතර ගංවතුරෙන් යටවන නගරයක් බැවින්ද, සමහර ස්ථානවල වගුරු බිම්වල කිසිම ක්‍රමයකට නැතිව එකට යාබදව ලං ලංව පිහිටා තිබෙන නිවාස නිසා සෞඛ්‍ය තත්ත්වයට බරපතල තර්ජනයක් එල්ලවී ඇති බැවින්ද, රජයේ සේවක මහත්වරුන්ට හා පොදු මහජනයාට සුදුසු නිවාස යෝජනා ක්‍රම දෙකක් අප්‍රමාදව රත්නපුර නගරයේ ඇති කළ යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රත්නපුර නගරයේ රජයේ ආයතන රාශියක් තිබෙනවා. උසාවි දෙකක්, කච්චේරියක්, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයක්, පොලිසියක්, දේශීය ආදායම් බදු කාර්යාලයක්, සුරාබදු කාර්යාලයක්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලයක්, සෞඛ්‍ය අධිකාරී කාර්යාලයක්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක්, මිනින්දෝරු කාර්යාලයක්, පරිවාස කාර්යාලයක්, නගර සභා කාර්යාලයක්, සමුපකාර සංවර්ධන කාර්යාලයක්, ගොවිජන සේවා කාර්යාලයක්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආටිගල මයා.]

ගොවිජන සේවා ව්‍යාප්ති කාර්යාලයක්, කෞතුකාගාරයක්, රජයේ මහාරෝගය ශාලාවක්, ආයුර්වේද ආරෝග්‍යශාලාවක් ආදී වශයෙන් රජයේ ආයතන රාශියක් අද රත්නපුර නගරයේ පිහිටා තිබෙනව. ඒවායේ සේවය කරන අයට නිවාස පහසුකම් ලබාදීම අද දුෂ්කර කාර්යයක් වී තිබෙනව. විශේෂයෙන්ම පොලිසිය ආරෝග්‍යශාලාව වැනි ස්ථානවල සේවය කරන නිලධාරීන්ට නගරයෙන් හැතැප්ම පහක් හෝ හයක් ඈතින් ගම්බද ප්‍රදේශයක ජීවත්වීමට සිදු වී ඇති නිසා හරියාකාර කලට වේලාවට රාජකාරිය සඳහා පැමිණීමට අමාරුකම් ඇතිවන අවස්ථා එමට තිබෙනව. එම නිසා එම ප්‍රශ්නය වහාම විසඳිය යුතු එකක් බව මා මේ ගරු සභාවට මතක් කරන්න කැමතියි. එමෙන් ම නිතර නිතර ගංවතුරින් යටවීම නිසා කරදරයට පත් වන දුප්පත් පොදු ජනතාව වෙනුවෙන් තවත් නිවාස යෝජනා ක්‍රමයක් ඇති කළ යුතුව තිබෙනව. එම නිසා රත්නපුරයේ සේවය කරන රජයේ නිලධාරීන් වෙනුවෙන් නිවාස යෝජනා ක්‍රමයකුත් දුප්පත් පොදු ජනතාව වෙනුවෙන් තවත් නිවාස යෝජනා ක්‍රමයකුත් යනුවෙන් නිවාස යෝජනා ක්‍රම දෙකක් රත්නපුර නගරයේ ඇති කළ යුතුය යන මේ යෝජනාව මා සභාවට ඉදිරිපත් කරනව.

**කුලරත්න මයා.**
*(திரு. குலரத்ன)*
(Mr. Kularatne)
**විසින් ස්ථිර කරන ලදී.**
*ஆமோதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 2.50

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

රත්නපුර ගරු මන්ත්‍රීතුමා (ආටිගල මයා.) විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අදාලව වචන සවල්පයක් කතා කරන්ට තිබෙනව. රත්නපුර නගරයට මෙම අවහිරය බොහොම තදින් බලපානව. ඒ වාගේම අනිකුත් නගරවලටත් මෙම අවහිරය තිබෙන බව අපි දන්නව. විශේෂයෙන්ම රත්නපුරයට මෙම අවහිරය තිබෙන නිසයි, එතුමා මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ.

අපි පොලිස් දෙපාර්තමේන්තුවෙ තත්ත්වය ගැන බලමු. බොහෝ පොලිස් ස්ථාන භාරව සිටින පොලිස් පරීක්ෂකවරුත්, සාජන්ට්වරුත්, කොස්තාපල්වරුත් ආදීන් පදිංචිව සිටින්නෙ කුලී නිවාසවලයි. පොලිස් දෙපාර්තමේන්තුවට අයත් බැරැක්කවල එහෙම ඉඩ පහසුකම් නොමැති නිසා එම තත්ත්වය ඇති වෙලා තියෙනව. එම නිසා එවැනි උදවිය කුලියට අරගෙන තියෙන නිවාස හිමි ධනපති පුද්ගලයන් බොහෝ විට ඒවාට කුලී පවා අය නොකරන හෙයින් ඔවුන්ගේ වුවමනාකම් උඩ තමතමන්ගෙ රාජකාරි කටයුතු කරන්ට ඔවුන්ට සිදු වී තිබෙනව. ඒ හේතුවෙන් පොලිස් නිලධාරීන් අතින් බොහෝ දූෂණ ක්‍රියා කෙරෙන බව අපට පේනව.

රත්නපුර නගරයෙ පමණක් නොවෙයි ලංකාවෙ බොහෝ නගරවල ජීවත් වන රජයේ සේවකයන්ට නිවාස පහසුකම් නැහැ. එම නිසා බොහෝ විට ඔවුන් කරන්නෙ ඒ ප්‍රදේශයෙ යම්කිසි තත්ත්වයක් ඇති පුද්ගලයෙකුගෙ නිවාසයක බෝඩිං වීමයි. එවැනි ක්‍රමයක් ක්‍රියාවෙ යෙදෙන විට බොහෝ වැරදි ක්‍රියා සිදු වන බව අපට පේනව. අපි සිතමු, යම් කෙනෙක් අයුතු අන්දමින් රාජකාරියක් ඉටු කරවා ගැනීමට බලාපොරොත්තු වෙනවය කියා. එවැනි රාජකාරියක් සඳහා යම් නිලධාරියකු අල්ලා ගන්ට වුවමනා වූ විට බොහෝ දෙනා කරන්නෙ ඔහු නැවතී සිටින නිවාසයෙ සවාමියාට කිට්ටු කිරීමයි. සමහරවිට අර කියන නිලධාරියා නොදැනුවත්වම ඔහු පදිංචිව සිටින නිවස හිමි පුද්ගලය අර තැනැත්තගෙන් යම්කිසි අල්ලසක් ගන්ට බැරිකමක් නැහැ. වෙනත් අයුතු වැඩක් කරන්ට බැරි නැහැ. එවැනි දේ සිදු වන්ට බොහෝ විට ඉඩ තියෙනව. රජයේ සේවකයන්ට බලපාන නිවාස හිගය මේ රටේ අල්ලස් ව්‍යාපාරයට තුඩු දෙන එක්තරා කරුණක් වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සලකන්ට පුළුවනි. රත්නපුරයට මෙම තත්ත්වය විශේෂයෙන් බලපානවා. රත්නපුර නගරයෙ කාර්‍යාලවල සේවය කරන උදවියගෙන් සියයට 95ක් පමණම පදිංචිව සිටින්නෙ පුද්ගලික නිවාසවලයි.

මෙම අවස්ථාවෙදි රත්නපුර දිසාපති තුමාගෙ නිල නිවාසය ගැනත් මතක් කරන්ට ඕනෑ. රත්නපුර දිසාපතිතුමා පදිංචිව සිටින්නෙ බොහොම පැරණි නිල නිවාසයකයි. එය ශ්‍රී වික්‍රම රාජසිංහ රජ තුමාගෙ කාලෙ ඇහැලෙපොල ආදිකාරම පදිංචියට ආව ස්ථානය බව කියනවා. එම ස්ථානය තමයි, අද දිසාපති මැදුර හැටියට පාවිච්චි කරන්නෙ. එම ගොඩනැගිල්ල බොහොම දිරාපත් තත්ත්වයකට වැටී තිබෙනවා. [බාධා කිරීමක්] එය කෞතුක වස්තුවක් වශයෙන් ආරක්ෂා කරන්ට ඕනෑ තමයි. කාලයක් තිස්සෙ බොහොම අපහසුකම් මැද විවාහක දිසාපතිතුමන්ලයි එහි පදිංචිව සිටියෙ. වහින වෙලාවට බේසම් තබන්ට ඕනෑ, නිදන කාමරවලට පවා. එය පැරණි නිවාසයක් නිසා නඩත්තු කිරීමත් බොහොම අපහසුයි. නිතරම එම ස්ථානයේ සර්පයොත් ගැවසෙනවා. ලොකු පවුලක් සිටින යම්කිසි දිසාපතිවරයෙක් එහි ගියොත් ජීවිතය ගෙවන්ට වෙන්නෙ බොහොම දුෂ්කර අන්දමටයි. දැන්නම් අවිවාහක දිසාපතිවරයෙක් සිටින නිසා එතරම් ප්‍රශ්නය උග්‍ර වන්නෙ නැහැ. කෙසේ වෙතත් ඇත්ත වශයෙන්ම රත්නපුර දිසාපති නිල නිවාසය ප්‍රතිසංස්කරණය කරන්ට ඕනෑ. ආණ්ඩුවෙ අනිකුත් ප්‍රධාන දෙපාර්තමේන්තු කීපයක ශාඛා ප්‍රධානීන් පස් දෙනෙක් එක්තරා නිවසක් කුලියට ගෙන එහි නැවතී සිටින බව මා දන්නවා. තවත් බොහෝ රජයේ සේවකයන් වෙන වෙනත් තැන්වල නැවතී සිටිනවා. මෙවැනි හේතූන් කරණකොටගෙන බොහෝවිට එවැනි අයවලුන්ගෙන් ඉටු විය යුතු සේවය පවා හරියාකාර කරන්ට බැරි තත්ත්වයක් පැන නගිනවා.

රත්නපුර නගරයද සබරගමු පළාතද පාලනය කරන පාලත් පාලන කොමසාරිස්වරයා පවා බෝඩිමක බෝඩිං කාරයෙක් හැටියටයි ජීවත් වෙන්නෙ. එය ඔහුගෙ රාජකාරිය කර ගෙන යාමට පවා අපහසු තත්ත්වයක් වෙනවා. මේ ප්‍රශ්නය ගැන කල්පනා කර බලන්ට ඕනෑ. රත්නපුර නගරය නිතරම ගංවතුරෙන් යට වෙනවා. ඒ ගැන සිතා බලා ගංවතුරෙන් යට නොවන ස්ථානයක විශාල ශාලාවක් සාදන්ට ඕනෑ, ගංවතුරෙන් යට වන ප්‍රදේශවල ජීවත් වන උදවියට ගංවතුර කාලවලදී ගොස් තාවකාලිකව පදිංචි වී සිටීම පිණිස. එවැනි ශාලාවක් ගංවතුරෙන් යට නොවන ප්‍රදෙශයක බිහි කරන අතරම නිවාස යෝජනා ක්‍රම දෙකක් ද ගංවතුර මට්ටමෙන් ඉහළ ප්‍රදේශවල තනා දෙනවා ඇතැයි කියා විශ්වාස කරමින් රත්නපුර ගරු මන්ත්‍රීතුමාගෙ යෝජනාවට මගේ සම්පූර්ණ එකගත්වය ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

අ. භා. 2.55

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර නගරයට නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවේ රත්නපුර නගර යට මුහුණපාන්න වී ඇති ගංවතුර බිය ගැනත් සඳහන් කර තිබෙනවා. රත්නපුරය වගේම ගංවතුර ගැලීම් නිසා අමාරුවට පත් වන තවත් නොයෙක් ප්‍රදේශ රාශියක් තියෙනවා. එවැනි ප්‍රදේශ වල සිටින මහජනයා සඳහා උස් බිම්වල ගංවතුර ගැලීම්වලට භාජන නොවන ඉඩම්වල—නිවාස යෝජනා ඇති කිරීම ඉතාමත් අවශ්‍යයි. මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනව නම් ඇත්ත වශයෙන්ම රජයට ලොකු වාසිදායක තත්ත්වයක් ඇති වෙනවා. ගංවතුර ගැලීම නිසා විශාල වශයෙන් ගෙවල් කඩා වැටීමෙන් අසරණ බවට පත් වන මහජනයාට ඉතාම අඩු වශයෙන් රුපියල් 300 බැගින් හෝ ගෙවන්ට ආණ්ඩුවට සිදු වන බව තමුන්නාන්සෙ දන්නවා. මේ විධියට අවුරුදුපතාම කඩා වැටෙන ගෙවල් වෙනුවෙන් සහනාධාර මුදල් දෙන්න සමාජ සේවා අමාත්‍යාංශයට සිදු වී තිබෙනවා. පසුගිය දිනවලත් එවැනි ප්‍රදේශවල පදිංචි වී සිටින අයට විශාල මුදලක් ගෙවන්න සිදු වුනා. මේක අද ඊයේ ඇති වූ තත්ත්වයක් නොවෙයි; කාලාන්තරයක් තිස්සේ මේ රටේ පවතින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රත්නපුර නගරය සඳහා නිවාස යෝජනා ක්‍රම

[තුඩාවේ මයා.]

තත්ත්වයක්. ගංවතුර ගැලීම නිසා ගෙවල් කඩා වැටීමෙන් මිනිසුන් අනාථ වීම කාලාන්තරයක සිට මේ රටේ සිදු වෙනවා. කඩාවැටෙන ගෙවල් නැවත නැවතත් අළුත් වැඩියා කර ගැනීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයෙන් ගෙවන මුදල ප්‍රමාණවත් නොවන නිසා අනුන්ට ණය ගැති වීම හේතුකොටගෙනත් ගංවතුර තර්ජනයට අසු වී තිබෙන ප්‍රදේශවල මහජනයා දවසින් දවස තව තවත් අමාරු තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා මේ වාගේ ප්‍රදේශ ගැන කල්පනා කර මේ ප්‍රදේශවල සිටින මහ ජනයා සඳහා සෑහෙන උස් බිම් ප්‍රදේශවල—ගංවතුර බියෙන් තොර ප්‍රදේශවල—නිවාස යෝජනා ක්‍රම ඇති කිරීම ආණ්ඩුවේ යුතුකමක්ව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වචනය සඳහන් කරන්න තමුන්නාන්සේ මට ඉඩ දෙනවා ඇත කියා මම විශ්වාස කරනවා. මාතර නගරයේත්, මාතර නගරය අවටත් විශාල ප්‍රදේශයක් අවුරුදු පතා ජලගැලීම්වලට භාජන වන තත්ත්වයක් තියෙනවා. මේ ජලගැලීම්වලට භාජන වන ප්‍රදේශවල ජනයා සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම පිණිස මාතර නගරය ආසන්නයේ තිබෙන අක්කර 29ක පමණ ඉඩමක් ගැනීමට දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාවේදී තීරණය කළා. ඒ සඳහා දිසාපතිතුමාගෙන් අනුමැතිය ලැබුණු පසු ඒ ගැන ආණ්ඩුවට දැනුම් දුන්නා. නමුත් ඒ ඉඩම ලබා ගන්න පුළුවන් වුනේ නැහැ. අක්කර 29ක් පමණ වූ ඒ ඉඩම කොටස් කර විකිණීමට ඉඩම අයිති කරුවාට ඉඩ දීල තියෙනවා. ඒ වෙනුවට විකල්ප ඉඩමක් ගන්න වය කියා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිතුරක් දීල තියෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(උප සපානායකර් අවර්කළ්)*
(Mr. Deputy Speaker)

ඔය කාරණය ගැන කියන්න වෙනම යෝජනාවක් ගෙනෙන්න ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ වගේ ඉඩම් ගන්න ගියාම ඉඩම් අයිති කාරයන් ඒකට ඉඩ දෙන්නෙ නැති බවයි, ආණ්ඩුව ඒ ඉඩම් කාරයන්ට යට වෙන බවයි, මම කියන්නෙ. විශාල ඉඩම් අයිති කාරයන් ඒ ඉඩම් ගැනීම ගැන විරුද්ධ වී ඒවා කුඩා කැබෙලිවලට කඩා 'බ්ලැක් මාර්කට්' ගණන්වලට විකුණනවා. ඒකයි අද සිද්ධ වෙලා තියෙන්නෙ. මාතර පළාතේ තිබෙන, ගංවතුරට යට වෙන ප්‍රදේශවල මහජනයාට බෙදා දීම සඳහා සුදුසු ඉඩම් කැබෙලි කර අද පර්ච් එක රුපියල් 300, 400 වැනි ගණන්වලට විකුණනවා. රත්නපුරේ නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධයෙනුත් ඒ ප්‍රශ්නයම මතු වේය කියා මම සිතනවා. නිවාස හදන්න ඉඩම් ඕනෑ. අහසෙ නිවාස හදන්න බැහැ. නමුත් ඉඩම් අයිති කාරයො ඉඩම් දෙන්නෙ නැහැ. අමාත්‍යාංශය රවටල, එහෙම නැත්නම් අමාත්‍යාංශයත් සමග හවුල් වෙලා ඒ ඉඩම් ගැනීම වළක්වා ඒ ඉඩම් වැඩි ගණන්වලට විකුණා සල්ලි හම්බ කර ගන්නවා. මේ ආණ්ඩුව ඉඩම් අයිති කාරයන්ට ඒ සඳහා ඉඩ දී තිබෙන බව කියන්න සිදු වී තිබෙනවා. මාතර අක්කර 29යේ ඉඩම නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාට අයිති ඉඩමක්. දැන් එය කැබැලි කර විකුණන්නට හදනවා. දුප්පත් ජනතාව අවුරුදුපතා ගංවතුරට යට වී ඉතාමත් දුක්ඛිත තත්ත්වයට වැටෙනවා. එම නිසා නිවාස යෝජනා ක්‍රම ඇතිකිරීම රත්නපුරයට පමණක් නොව මුළු ලංකාවටම අවශ්‍ය වී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ඒක ඇත්ත. නමුත් ඔය කථාව මේ යෝජනාවට අදාළ නැහැ. කරුණාකර යෝජනාවට අදාළ විධියට කථා කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවට අප පක්ෂපාතයි. මා ඉල්ලා සිටින්නේ ලංකාවෙ අනෙක් ප්‍රදේශවලත් මේ ප්‍රශ්නය විසඳන ලෙසයි. ගංවතුර ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වන්නෙ රත්නපුරයෙ පමණක් නොවෙයි. එම නිසා මුළු ලංකාවෙම මේ ප්‍රශ්නය විසඳෙන අන්දමට මේ යෝජනාවට අතුරු යෝජනාවක් ඉදිරිපත් කරන්නට මම අදහස් කරනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ඒකට ඉඩ දෙන්න බෑ. ඕනෑනම්, වෙන දවසක වෙනම යෝජනාවක් ගේන්න පුළුවනි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අතුරු යෝජනාවට තමුන්නාන්සෙ ඉඩ දෙන්නෙ නැත්නම් මා මොනව කරන්නද? මෙය මුළු ලංකාවටම බල පාන ප්‍රශ්නයක් නිසා අනෙක් ප්‍රදේශ ගැනත් රජයෙ සැලකිල්ල යොමු විය යුතුයි. නොයෙක් ප්‍රශ්න සම්බන්ධයෙන් අපි ඕනෑතරම් යෝජනා ඉදිරිපත් කර තිබෙනව. 1965 අප්‍රේල් මාසයෙදි ඉදිරිපත් කරන ලද මගේ යෝජනා මේ න්‍යාය පත්‍රයෙහි තිබෙන නමුත් තවම ඒව මතු වුණේ නෑ. මෙවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් අප යෝජනා ඉදිරිපත් කරනතුරු රජය බලා සිටිනවයයි කියතොත් එය එතරම් සතුටුදායක උත්තරයක් නොවෙයි. හැම ප්‍රදේශයකටම පොදුවෙ ප්‍රයෝජනවත් වන ප්‍රතිපත්ති ආණ්ඩුව විසින් ඇති කළ යුතුයි. මේ යෝජනාවට අපගේ අනුමැතිය දෙන අතර, ජල ගැලීම් රත්නපුරයට පමණක් සීමා වූ දෙයක් නොවන නිසා, අවුරුදුපතා ගංවතුරෙන් විපතට පත් වන ජනතාව සඳහා උස්බිම්වල නිවාස යෝජනා ක්‍රම ඇති කිරීමට රජය ක්‍රියා කළ යුතු බව ප්‍රකාශ කරනව.

අ. භා. 3.02

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවෙන් රජයේ සේවකයන්ගේ නිවාස පහසුවත් සාමාන්‍ය ජනතාවගෙ පහසුවත් යන කරුණු දෙකක් බලාපොරොත්තු වෙනව. මේ කරුණු දෙක අමාත්‍යාංශ දෙකකට අයිතියි. රජයේ සේවකයන්ගේ නිවාස යෝජනා ක්‍රම පිළිබඳ කට යුතු මගෙ අමාත්‍යාංශයට අයිති නැහැ. ඒ වුණත් රත්නපුර ප්‍රදේශයේ රජයේ සේවකයන්ගේ පහසුව තකා එහි නිවාස යෝජනා ක්‍රමයක් ඇති කළයුතුය යන කරුණ ගැන මෙම යෝජනාව ඉදිරිපත් කළ රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආටිගල මයා.) සමග මම එකඟ වෙනව. රජයට අයත් නිවාස රත්නපුර නගරයෙහි තිබෙන්නෙ කීපයක් පමණක් බව මම දන්නව. රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි, සුරාබදු දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, සමූපකාර දෙපාර්තමේන්තුව, රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව ආදී ආයතනවලට අයත් රජයේ කාර්යාල මහත් රාශියක් තිබෙන රත්නපුර නගරයට මාරු වී යන රජයේ සේවකයින් සඳහා එහි නිවාස යෝජනා ක්‍රමයක් අවශ්‍යමයි. රජයේ සේවකයන්ගෙ නිවාස යෝජනා ක්‍රම සම්බන්ධ කටයුතු බාර අමාත්‍යාංශය මේ ගැන කටයුතු කරනවා ඇතැයි අපි විශ්වාස කරනව.

සාමාන්‍ය ජනතාවට අවශ්‍ය නිවාස යෝජනා ක්‍රම ඇති කිරීමේ කටයුත්ත මගෙ අමාත්‍යාංශයටයි බාරව තිබෙන්නෙ. එහෙත්, පළාත් පාලන අමාත්‍යාංශයෙන් මෙවැනි නිවාස යෝජනා ක්‍රම ඇති කිරීමේ පිළිවෙළකුත් ක්‍රියාත්මක වෙනව. එම නිසා, රත්නපුර නගරයට අවශ්‍ය නිවාස යෝජනා ක්‍රම ඒ අංශයෙන් සකස් කර ගන්නට පුළුවනි. එය පළාත් පාලන ඇමතිතුමාගෙ කල්පනාවට භාජන වී තිබෙන බව අප දන්නව.

මගේ අමාත්‍යාංශය හැම විටම බලාපොරොත්තු වන්නෙ ජනතාවට අවශ්‍ය නිවාස සපයා දීමයි. මෙම නිවාස තට්ටු නිවාස, තනි නිවාස යනුවෙන් කොටස් දෙකකට බෙදෙනව. තට්ටු නිවාස කුලියට දීමටත් තනි නිවාස කුලියට සින්න වීමේ ක්‍රමයට දීමටත් අප නිවාස යෝජනා ක්‍රම ඇති කර තිබෙනව. මේ සැම නිවාස යෝජනා ක්‍රමයක් යටතේම නිවාස සෑදීමට බලාපොරොත්තු වෙන්නෙ ගංවතුරට යට නොවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

සැපදායක ප්‍රදේශවලයි. අපේ දෙපාර්තමේන්තුව මඟින් තවත් නිවාස යෝජනා ක්‍රමයක් පිළියෙල කර තිබෙනවා.

මාතර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා ආණ්ඩුව පෞද්ගලික ඉඩම් හිමියන්ට යටත්ව ඉඩම් පවරා ගන්නෙ නැත කියා. ඒකට පිළිතුරක් විශයෙන් මා එක් කාරණයක් ඉදිරිපත් කරන්නට සතුටුයි. ප්‍රයෝජනයට ගන්නෙ නැති හිස් ඉඩමක් තිබෙනවා නම් ඒ ඉඩම් අයිතිකරු ඒ ඉඩම විකුණන්ට අකැමැති වුණත් ඔහුට වෙනත් ඉඩම් තිබෙනවා නම් ගෙවල් සෑදීමේ යෝජනා ක්‍රමයක් උඩ කීප දෙනෙකු එකතු වී ඒ ඉඩම රජයට පවරා ගෙන ඒ අයට ලබා දෙන්නය කියා ඉල්ලීමක් කළොත් පළමු වෙන් වටිනාකමෙන් සියයට දහයක් ගෙවා ඒ ඉඩම් අත්පත් කරගෙන ඉඩම් ඉල්ලූ අයට බෙදා දීමේ ක්‍රමයක් තිබෙනවා. නිවාස දෙපාර්තමේන්තුව මඟින් අද ලංකාවේ ඉඩම් මහත් රාශියක් ඒ අන්දමට අත්පත් කරගෙන බෙදා දී තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එහෙම ඉල්ලුව. නමුත් ලබා දුන්නෙ නැහැ.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

ඔය කියන්නෙ එක ප්‍රශ්නයක් ගැන වෙන්න ඇති. ඔය ප්‍රශ්නය ගැනම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා නම් මට ඒ සම්බන්ධ ලිපි ගොනු ගෙනැවිත් සෑහෙන පිළිතුරක් දෙන්ට තිබුණා.

ඒ අන්දමට නිවාස දෙපාර්තමේන්තුව මඟින් ඉඩම් රාශියක් අත්පත් කරගෙන බෙදා දී තිබෙනවා. ඒ සෑම ඉඩමකම නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස දෙපාර්තමේන්තුව මඟින් නිවාස සෑදීමට වුවමනා නම් ඒ විධියටත්, ඉල්ලුම්කරුවන්ට තමන්ට වුවමනා හැටියට නිවාස සාදා ගැනීමට වුවමනා නම් ඒ විධියටත්, නිවාස තනා තිබෙනවා.

රත්නපුර නගරය සඳහා නිවාස යෝජනා ක්‍රම

අවසාන විශයෙන් රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව මගේ අමාත්‍යාංශය සම්පූර්ණයෙන් පිළිගන්න බව ප්‍රකාශ කරනවා.

අ. භා. 3.7

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමත් මේ යෝජනාව යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම රජයේ සේවකයන්ට නිවාස සැපයීම පිළිබඳ ප්‍රශ්නය දැන් උග්‍ර වී තිබෙනවා. මේ ප්‍රශ්නය අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි. අපේ කාලෙත් මේ ප්‍රශ්නය තිබුණා. නමුත් මෑත කාලයක සිට පනවා තිබෙනඑක්තරා නීතියක් නිසා රජයේ සේවකයන්ට නිවාස සම්බන්ධයෙන් තවත් දුෂ්කරතාවකට මුහුණපාන්නට සිද්ධ වී තිබෙනවා. ඒ නීතිය කුමක්ද? රජයේ සේවකයන්ට රජයේ නිවාසයක පදිංචි වී සිටිය හැක්කේ එක්තරා අවුරුදු ගණනක් පමණයි ඒ කාල සීමාවට වැඩියෙන් රජයේ සේවකයකු ඒ නිවාසයක පදිංචි වී සිටි යොත් ඒ නිවාසයෙන් පිට වන ලෙස ඔහුට බල කරන්ට පුළුවන්. රජයේ සේවකයකු එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මාරු කරන අවස්ථාවකදී නම් ඒ අන්දමේ නියමයක් කිරීම අසාධාරණ නැත කියා කල්පනා කරන්ට පුළුවන්. නමුත් එක් ස්ථානයකම යම් නිලධාරියකු සේවය කරනවා නම් අවුරුදු හතරක් පහක් රජයේ නිවාසයක පදිංචිව සිට ඒ නියමිත කාලසීමාව අවසානයේදී ඔහුට ඒ නිවාසයෙන් පිට වී යන ලෙස බල කිරීමත් පිට වී නොගියොත් ඔහුට විරුද්ධව දඩුවම් පැමිණවීමත්, එසේ නැත්නම් වැඩි කුලියක් අය කිරීමත්, එතරම් සාධාරණ ක්‍රියාවක්ය කියා මා කල්පනා කරන්නෙ නැහැ. ආණ්ඩුවේ සේවකයින්ට නිල නිවාස සැපයීමේ ක්‍රියා මාර්ගය අද සම්පූර්ණයෙන්ම නැතිවී තිබෙනවාය කියා මා කල්පනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිවාස කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ දැනගැනීම සඳහා රජයේ සේවකයන්ට නිවාස සැපයීමට අපේ කාලෙ තිබුණු යෝජනා කීපයක් ගැන මා මතක් කරන්ට සතුටුයි. ආණ්ඩුවේ සේවකයන්ට නිවාස සැපයීම සඳහා නිවාස අමාත්‍යාංශයත් මුදල් අමාත්‍යාංශයත් ඒකාබද්ධ වී පිළියෙළ කළ වැඩ පිළිවෙළක් තිබුණා. ආණ්ඩුවේ සේවකයන්ට නිවාස සාදා ගැනීමට ඉඩම් මිල දී ගැනීමට මුදල් අමාත්‍යාංශය එක්තරා අන්දමකින් ආධාර කළා. ඉඩමේ වටිනාකම භාණ්ඩාගාරයෙන් ගෙවීමටත් ඒ මුදල අවුරුදු කීපයක් තුළදී ආපසු අය කර ගැනීමටත් එක්තරා වැඩ පිළිවෙළක් තිබුණා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

දැනටත් ඒ වැඩ පිළිවෙළ තිබෙනව. භාණ්ඩාගාරය ඉඩමට ගෙවනව. නිවාස දෙපාර්තමේන්තුව නිවාසය සෑදීමට වුවමනා මුදල දෙනව.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ සමගම, අත්පත් කර ගන්නා ඉඩම්වල නිවාස සෑදීමටත් නිවාස දෙපාර්තමේන්තුවේ අරමුදලෙන් එක්තරා ප්‍රමාණයක් වෙන් කර තිබුණා. ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වෙනවාද කියා මා දන්නෙ නැහැ.

රජයේ සේවකයන්ට මුහුණ පාන්නට වන තවත් දුෂ්කරතාවක් තිබෙනව. විශේෂයෙන්ම සුළු සේවකයින් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මාරු කරන විට සමහර විට අළුත් ස්ථානයෙ නිල නිවාස නැහැ. අළුත් ස්ථානයෙ රජයේ නිවාසයක් නැතිකම නිසා මාරුවීම ලැබූ නිලධාරියාගේ අඹුදරුවන්ට මහත් දුෂ්කරතාවන්ට මුහුණ පාන්නට සිදු වෙනව. මහර බන්ධනාගාරයේ නිලධාරියෙක් හදිසියෙන්ම යාපනේට මාරු කළ අවස්ථාවක් ගැන මා දන්නව. නමුත් ඒ නිලධාරියාගේ පදිංචිය සඳහා යාපනේ රජයේ නිවාසයක් නැහැ. ඒ වාගේම අඹුදරුවන් සමග ගිහින් පදිංචි වීම සඳහා පෞද්ගලික නිවාසයක්වත් යාපනේ සොයා ගන්ට නැහැ. එම නිසා විශේෂයෙන්ම යම් යම් ස්ථානවල අනිවාර්ය වශයෙන්ම පදිංචි වී සිටිය යුතු රජයේ සේවකයින්ට සහනයක් සලසා දිය යුතු බව මා රජයට මතක් කරන්නට සතුටුයි.

තවත් යෝජනාවක් තිබුණා. ඒ යෝජනාව මොකක්ද? රජයේ සේවකයින් ගෙවල් කුලිය වශයෙන් එක්තරා ගණනක් ගෙවනව; තමන්ගේ ගෙවල් කුලී දීමනාවට තවත් සියයට හයක් එකතු කර ගෙවල් කුලිය වශයෙන් ගෙවනව. රජයේ නිවාස ඇමති අංශයට අර කොටස් ගෙවීමේ ප්‍රතිපත්තිය උඩම රජයේ නිවාස ගොඩනංවලා සේවකයන්ගෙන් ගෙවල් කුලී වශයෙන් ගෙවල් කුලී දීමනාවට සියයට හයක් එකතු අර අවුරුදු විස්සකින් විසි පහකින් රජය දුන් මුදල ආපසු ලබා ගන්න පුළුවනි. නිවාස අමාත්‍යාංශයෙන් ඉඩමක් ලබා ගෙන මුදල් අමාත්‍යාංශයට පවරා රජයේ සේවකයන්ගෙන් මාස්පතා කුලියක් අරගෙන ඒ ණය පියවා ගන්න පුළුවන්කම තිබෙනව. අද තිබෙන ප්‍රශ්නය රත්නපුරයට මෙන්ම රටේ වෙනත් බොහෝ පළාත්වලටත් පොදුවේ බල පාන එකක් නිසා ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ආරම්භ කර සාර්ථක ලෙස කටයුතු කිරීමට ක්‍රියා කරන ලෙස මාත් ඉල්ලා සිටිනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රත්නපුර නගරයේ මහා ලේකම් කාර්යාලයක් ගොඩනැංවීම

## රත්නපුර නගරයේ මහා ලේකම් කාර්යාලයක් ගොඩනැංවීම

*இரத்தினபுரிப் பட்டணத்திற்கு அரசாங்கப் பணி நிலயம்*

## SECRETARIAT FOR RATNAPURA TOWN

අ. භා. 3.13

**ආටිගල මයා.**

*(திரு. ஆட்டிகல)*

(Mr. Attygalle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නමින් තිබෙන මේ යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"සබරගමු පළාතේ අගනුවර වන රත්නපුර නගරයේ රජයේ කාර්යාල දැනට එකිනෙකට ඈත්ව පිහිටා තිබීමත්, සමහර කාර්යාල පෞද්ගලික කුලී ගොඩනැගිලිවල පිහිටා තිබීමත්, සමහර කාර්යාල පිහිටි ගොඩනැගිලි ඉතා අබලන් තත්ත්වයේ ඒවා වීමත් නිසා රාජකාරි වැඩවලට මෙන්ම මහජනයාටද විශාල අවහිරයක් ඇතිවී තිබෙන බැවින් රජයේ සියලුම කාර්යාල එකම ගොඩනැගිල්ලක පැවැත්වීම සඳහා රත්නපුර නගරයේ මහා ලේකම් කාර්යාලයක් ගොඩ නැංවිය යුතුයැයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

රත්නපුරය, සබරගමු පළාතේ අගනුවර් මෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයයි. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශ අටක් තිබෙනවා. ඒවාට වුවමනා කරන සෑම රජයේ දෙපාර්තමේන්තුවකම ශාඛා කාර්යාල පිහිටුවා තිබෙන්නේ රත්නපුරය නගරය තුළයි. නොයෙකුත් දෙපාර්තමේන්තුවලට අයිති රජයේ කාර්යාල රාශියක් රත්නපුර නගරයේ තැනින් තැන පිහිටා තිබෙනවා. මේ කාර්යාල වැඩි හරියක් තිබෙන්නේ ඉතා පැරණි, පෞද්ගලික, හොඳටම දුර්වල, ඉඩකඩ නැති, සැප පහසුකම් බොහොමයක් නැති ගොඩනැගිලි තුළයි. මේ ගොඩනැගිලි සඳහා විශාල මුදලක් කුලිය වශයෙන් ගෙවනවා. ඉඩකඩ මදි නිසත්, වෙනත් නොයෙක් අඩුපාඩුකම් නිසත්, මහජනයටත් වැඩ කරන සේවකයන්ටත් නොයෙක් කරදර වලට මුහුණ පාන්න සිදු වෙනවා. හුස්ම ගන්නත් ඉඩ මදි. වැසිකිළි පහසුකම් ආදියත් නැහැ. දෙපාර්තමේන්තු 12 කට පමණ අයිති කාර්යාල පිහිටුවා තිබෙන්නෙ ඔවැනි තත්ත්වයේ ස්ථානවලයි. මසක් පාසා, වර්ෂයක් පාසා විශාල මුදලක් වැය කරන්නෙ ගෙවල් කුලිය සහ වෙනත් කරුණුවලටයි. මේ කාර්යාල තිබෙන්නෙත් එකකට එකක් ඈතිනුයි. සමහර විට එක කාර්යාලයක සිට අනෙක් කාර්යාලයට හැතැප්මක් දෙකක් පමණක් නොව තුන හතරක් තරමත් තිබෙනවා. ඒ නිසා අවට ප්‍රදේශවලින් පැමිණෙන මහජනයාට බොහොම අමාරුකම් සහ කරදර ඇති වෙනවා. කාර්යාල කීපයක වැඩ තිබුණොත් කාර්යාලයෙන් කාර්යාලයට යන්න සිදු වුණාම දුර ප්‍රමාණය නිසා බොහෝ කාලයක් ගත වෙනවා. ඔය කරුණු නිසා දැන් තිබෙන තත්ත්වය ඉතාම අසතුටු දායකයි. තැනින් තැන පවත්වනු ලබන කාර්යාල සහ පෞද්ගලික ගොඩනැගිලි වෙනුවෙන් ගෙවන විශාල මුදල ඉතිරි කිරීම සඳහාත්, මහජන පහසුව සඳහාත් මේ කාර්යාල සියල්ලක්ම එකම ගොඩ නැගිල්ලක් තුළ පැවැත්වීම සඳහා මා මේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරනවා.

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.** (මුතූර් පළමුවන)

*(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

විසින් ස්ථිර කරන ලදි.

ஆமோதித்தார்.

*Seconded.*

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 3.15

**විජයසුන්දර මයා.**

*(திரு. விஜேசுந்தர)*

(Mr. Wijesundara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර නගරයේ මහා ලේකම් කාර්යාලයක් ගොඩනැංවීම සඳහා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරන ඉතා වැදගත් අවස්ථාවකදී මටත් ඒ ගැන කථා කරන්න ඉඩ ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. රත්නපුර නගරයට මහා ලේකම් කාර්යාලයක අවශ්‍යතාව ගැන අපි හොඳාකාර දන්නවා. එවැන්නක් ඉදි කිරීමෙන් පසු රත්නපුරයේ ජනතාවට රජයේ කාර්යාලවලින් කර ගැනීමට තිබෙන වැඩ කට යුතු කොයි තරම් පහසුවෙන් කර ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබේද යන්නත් අපි දන්නව. රත්නපුර කච්චේරි ගොඩනැඟිල්ල පෘතුගීසි බල කොටුවක් මත ඉංග්‍රීසීන් විසින් සාදන ලද්දක් වන අතර, මේ රටට නිදහස ලැබී ගත වූ පසුගිය කාලය තුළ මෙහි ඉඩ කඩ සැලසී ඇත්තේ වැඩිපුර කාමරය කින් පමණයි. ඊට වඩා දියුණුවක් මෙහි නැහැ. අද තිබෙන්නෙත් දැනට අවුරුදු තිහකට හතළිහකට පෙර තිබුණු කච්චේරි ගොඩනැඟිල්ලමයි. ඉඩම් සංවර්ධන, ගොවි ජන සේවා, ආහාර පාලන, ආදී කච්චේරි යට අයත් සියලුම දෙපාර්තමේන්තු ඒ ගොඩනැඟිල්ලේ පිහිටුවා තිබෙනවා. තව ද, රත්නපුර ගරු මන්ත්‍රීතුමා විසින් සඳ හන් කරන ලද පරිදි, එහි පිහිටුවා තිබෙ න දෙපාර්තමේන්තුවල ශාඛා කාර්යාල වලට ගොස් ඒම සඳහා මෝටර් රථය කින් ගියත් පැය තුනක් පමණ වන බව ඇත්තයි. මේ තත්ත්වය පළාත් වාසීන් ට ලොකු කරදරයක් වී තිබෙනවා. රත්න පුරයේ සහකාර පළාත් පාලන කොමසා රිස් කාර්යාල ගොඩනැඟිල්ල ඉතාමත්ම අබලන් තත්ත්වයක පවතිනවා. දිරාපත් වූ එය කොයි මොහොතේ කඩා වැටේදැයි කියන්න බැහැ. වාසනාවකට වගේ ආරෝග්‍යශාලාව වෙනත් ස්ථානයකට ගෙන යෑම නිසා පහසුවෙන් සෞඛ්‍ය කාර්යාලයක් ලබා ගන්නට පුළුවන් වුණා. එහෙත් බොහෝ කාර්යාල කුලී ගොඩනැඟිලිවල පවත්වා ගෙන යනවා. ඇත්තෙන්ම අද එහි පවතින කාර්යාල අතර කටයුතු කර ගන්නට සිදු වී තිබෙන්නේ තැපැල් මාර්ගයෙනුයි. ගොවි ජන සේවා කාර්යාලයේ සිට අධ්‍යාපන කාර්යාලයට නැත්නම් කච්චේරියට ලිපි යක් එවන්නට සිදු වී ඇත්තේ තැපැල් මාර්ගයෙනුයි. එසේ නැත්නම් කාර්යාල කාර්ය සහායක කෙනකුගේ මාර්ගයෙන් එවන්නට ඕනෑ. ඊට සෑහෙන වේලාවක් ගත වෙනවා. එහෙත් මහ ලේකම් කාර් යාලයක් තිබෙනවා නම් එහි ඇති කාර් යාල අතර ලිපි ගනුදෙනු පහසුවෙන් කර ගන්නට පුළුවනි. ඒ කාර්යාලයේ සිට මේ කාර්යාලයට කාර්යාල කාර්ය සහායක කෙනකුගේ මාර්ගයෙන් පහසුවෙන් ලිපි ගොනු ගෙන්වා ගන්නට පුළුවනි. මේ නිසා ආණ්ඩුවේ කටයුතු ඉක්මන් වෙන වා. මහ ලේකම් කාර්යාලයකින් බලාපො රොත්තු වන ප්‍රයෝජනය ඒකයි. එසේ හෙයින් මේ මහ ලේකම් කාර්යාලය ගොඩ නැඟීම රජයේ වැඩ කටයුතු ඉක් මන් කිරීමේ මාර්ගයක් වෙනවා. රත්න පුරය සඳහාත් අනුරාධපුරයට වගේම මහ ලේකම් කාර්යාලයක් ඇති කරන ලෙස ඉල්ලන අතරම, රත්නපුර උසාවිය ගැනත් අතිරේක වශයෙන් සඳහන් කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුප්‍රීම් උසාවි නඩු වාර රත්නපුරයෙහි පවත්වන විට පුදුමාකාර දෙයකට මුහුණ පාන්නට සිදු වෙනවා. සුප්‍රීම් උසාවිය එහි ගිය විට දිස්ත්‍රික් උසාවිය මහේස්ත්‍රාත් උසාවිය තිබෙන ස්ථානය වෙත යනවා. එවිට මහේස්ත්‍රාත් උසාවිය පවත්වන්නේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේ උඩ තට්ටුවේ තිබෙන "පබ්ලික් එකවුන්ට්ස් කොමිටි" කාමරයෙන් හතරෙන් පංගු වක් තරම් වූ ඉඩකඩ ප්‍රමාණයක් තුළයි. මේක මහ විහිළුවක්. සාක්කිකාරයන් පැමිණ සිටියදී නඩුකාර මහතාට එහි වැඩ කටයුතු කරගෙන යන්නට තබා හුස්ම ගන්නටත් අමාරුයි. මේ අවස්ථාවේදී මා එක සිද්ධියක් ගැන මතක් කරන්නට කැමතියි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා රැස්වීමක් රත්නපුර කච්චේරියේ පැවැත්වෙද්දී පොලිස් නිලධාරීන් කීප දෙනකු හා සුප්‍රීම් උසාවියේ සෝෂක තැන ඒ ස්ථානයට පැමිණ, සුප්‍රීම් උසාවියේ විනිශ්චයකාරතුමා ඒ කාරක සභාවේ සභි කයන් දෙදෙනකු කැඳවන බව දැනුම් දුන්නා. මේ අවස්ථාවේදී තරමක කලබල යක්ද ඇති වුණා. පසුව මෙය සාමදාන යෙන් බේරා ගන්නට පුළුවන් වුණා. තව පොඩ්ඩෙන් සුප්‍රීම් උසාවියට බාධා කිරීමේ චෝදනාව උඩ ඒ කාරක සභාවේ උදවිය හිර ගෙට යවන්නටත් ඉඩ තිබු ණා. ඒ නිසා උසාවි ඉඩපහසුකම්ද සලසන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.19

**කුලරත්න මයා.**

*(திரு. குலரத்ன)*

(Mr. Kularatne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාත් මෙම යෝජනාව ගැන වචන කීපයක් කියන්නට අදහස් කරනවා. රත්නපුරයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රත්නපුර නගරයේ මහා ලේකම් කාර්යාලයක් ගොඩනැංවීම

[කුලරත්න මයා.]

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා වේදී මෙම යෝජනාව ගැන නිතර සාකච්ඡා වී තිබෙනවා. රත්නපුර නගරය පිහිටා තිබෙන ආකාරය අනුව මහ ලේකම් කාර්යාලයක් සෑදීමට සුදුසු ඉඩමක් සොයා ගැනීම තරමක් අපහසු බව කියැවෙනවා. ගංවතුරෙන් යට නොවන ස්ථානයකයි, මෙමම ගොඩනැඟිල්ල සෑදිය යුත්තේ. කෙසේ වුවත් මෙම ප්‍රශ්නය විසඳිය යුතුයි. රත්නපුර නගරයෙන් සැතපුම් 72ක් දුර පිහිටි ලියන්ගහතොට සිටින අයටත් තමන්ගේ වැඩ කටයුතු සඳහා රත්නපුරයට එන්නට සිදු වෙනවා. ඔවුන් එන්නේ දවස් එකහමාරක් තිස්සෙයි. එසේ පැමිණෙන අයට තැනින් තැන පිහිටි ආණ්ඩුවේ කාර්යාල සොයා ගැනීම අමාරුයි. සමහර විට ආණ්ඩුවේ කාර්යාල 12ක් විතර කච්චේරියෙන් පිට තිබෙනවා. ඒ සමහර කාර්යාල පිහිටා තිබෙන්නෙ බස් යන පාරවල් අයිනෙ නොවෙයි; පාරට හුඟක් ඈතිනුයි. සාමාන්‍ය ගොවි ජනතාවට ගොවි ජන සේවා කාර්යාලය හොයා ගන්නට බැහැ. ඒ නිසා කාලයක සිටම මහ ජන මන්ත්‍රීවරුන් ප්‍රදේශයේ පළාත් පාලන ආයතනත් ඉල්ලා තිබෙනවා, "මහා ලේකම් කාර්යාලයක් පිහිටුවා රජයේ සෑම කාර්යාලයක්ම ඒ ගොඩනැඟිල්ලෙ පවත්වාගන යා යුතුය" කියා. මට මතක හැටියට ළඟදී දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවෙ යෝජනාවක් තිබුණා, මේ සඳහා වහාම ඉඩමක් අත්පත් කර ගත යුතුය කියා. දැනට ඒ සඳහා ඉඩමක් නිර්දේශ කරත් තිබෙනවා. රත්නපුර තැපැල් කාර්යාලය පිහිටා තිබෙන රජයේ ඉඩම, මේ හැම කාර්යාලයක්ම එක් කර මහා ලේකම් කාර්යාලයක් ගොඩ නැඟීම සඳහා සුදුසු බවට නිර්දේශ කර තිබෙනවා.

දිස්ත්‍රික් නිලධාරීන් සමහර විට දවස් දෙක තුන කාර්යාලවලින් බැහැරව තමන්ගෙ රාජකාරි කටයුතුවලට යනවා. ඒ අවස්ථාවල එම කාර්යාලවල පාලනය අඩපණ වෙනවා. ආහාර නිෂ්පාදනය ඉතා අවශ්‍ය දෙයක්. නමුත් එම කාර්යාලවල පාලනය කලින් සඳහන් කළ අන්දමට අඩපණ වීම නිසා සමහර විට අපට දුරකථන පණිවුඩයක්වත් ගන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එම කාර්යාල තිබෙන්නෙ මහජනයා ගැවසෙන තැන්වල නොවෙයි. ගෙවල් හිඟය නිසා ඉතාමත් දුෂ්කර තැන්වලයි, එම කාර්යාල පිහිටුවා තිබෙන්නෙ. මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දුන් පරිදි සමහර විට එසේ සිදු වී තිබෙන්නෙ නිලධාරීන්ට කිසිම පහසුකමක් නැති නිසා, නගරයට දුර නිසා, කරදර රාශියක් තිබෙන නිසා වෙන්නට පුළුවන්. මෙසේ කාර්යාල තැනින් තැන විසුරුවා හැර තිබීම නිසා ඒවායින් නියම සේවයක් ලබා ගන්නට බැරි වී තිබෙනවා. ඒ නිසා මේ කාල සීමාව තුළදීවත් කඩිනම් පියවරක් ගෙන රත්නපුර දිස්ත්‍රික්කයේ පාලනය විධිමත් කර ගැනීම සඳහා වහාම මහා ලේකම් කාර්යාලයක් රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එය ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 3.22

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව හොඳ, යහපත් යෝජනාවක් හැටියට රජය පිළිගන්නා බව මා කියන්නට කැමතියි. රත්නපුර නගරයට පමණක් නොව තවත් ප්‍රධාන නගර කීපයකටම මහා ලේකම් කාර්යාලවල අවශ්‍යතාව පවතිනවා. පසුගිය දවස්වල ගාල්ලේ මහා ලේකම් කාර්යාලයක් සෑදීමට සූදානමක් තිබුණත්, මුදල් තත්ත්වයෙ තිබෙන අමාරුකම නිසා එය කල් දැමීමට සිදු වුණා. අපේ පළාතේ—කුරුණෑගල—තිබෙන මහා ලේකම් කාර්යාලයත් ඉතා පැරණි ගොඩනැගිල්ලක්. කුරුණෑගල ගරු මන්ත්‍රීතුමා හිටියා නම් කියාවි කල්මුණේ, කිලිනොච්චි ආදී පළාත්වලින් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු බව, මහා ලේකම් කාර්යාලයක් සෑදීමට. මේ යෝජනාව යුක්ති සහගත එකක් බව, ප්‍රයෝජනවත් එකක් බව, පිළිගන්නවා. නමුත් මුදල් තත්ත්වයේ දුර්වලකම නිසයි, එම යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක් එක් නගරවල තිබෙන කාර්යාල සියල්ලම ඒ ඒ නගරවල මහා ලේකම් කාර්යාල පිහිටුවා එක්තැන් කිරීමට පුළුවන් නම් එයින් වැඩ කටයුතුවලට ලොකු පහසුවක් ඇති වන බව අප පිළිගන්නව. රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නොව අනෙක් දිස්ත්‍රික්කවලත්, අපේ මුදල් තත්ත්වය අනුව හැකි පමණ ඉක්මණින් මේ අඩුපාඩුව සපුරාලීමට රජය වීරිය කරන බව මා සඳහන් කරන්නට කැමතියි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## රත්නපුර නගරයට පොදු වෙළඳ පොළක්

*இரத்தினபுரி நகருக்கு பகிரங்கச் சந்தை*

## NEW MARKET FOR RATNAPURA TOWN

අ. භා. 3.24

**ආටිගල මයා.**
*(திரு. ஆட்டிகல)*
(Mr. Attygalle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නමින් තිබෙන ඊළඟ යෝජනාව මම ඉදිරිපත් කරනව:

"රත්නපුර නගරයේ දැනට තිබෙන පොදු වෙළඳ පළ නගර වැසියන්ගේ ප්‍රමාණයට කිසි සේත් නො සැහෙන පැරණි දිරාපත් එකක් බැවින් ද, බොහෝ වෙළෙඳ මහත්වරුන්ට තම තමන්ගේ වෙළඳ බඩු නගරයේ තැන් තැන්වල තබා ගෙන විකිණීමට සිදුවී ඇති බැවින් ද, එම හේතුව නිසා වාහන ගමනා ගමනයට සහ මහජන ගමනා ගමනයටද අවහිර සිදුවී ඇති බැවින් ද, නගරාලංකාරයට හානි සිදුවී ඇති බැවින් ද, හැකි තරම් ඉක්මනින් රත්නපුර නගරයේ සුදුසු ස්ථානයක පොදු වෙළඳ පළක් පිහිටුවිය යුතු යැයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රත්නපුරයේ තිබෙන වෙළඳපොළ පිහිටුවා තිබෙන්නෙ අවුරුදු 50 කට පමණ ඉහත සෑදු පොඩි ගොඩනැගිල්ලක. එළවලු වෙළෙන්දන්, මස් වෙළෙන්දන්, මාළු වෙළෙන්දන්, යන හැම වෙළෙන්දෙක්ම අද ඒ ස්ථානයෙ ඉන්නව. ඒ ගොඩනැගිල්ලෙ වහල පැත්තකින් කඩා වැටී, ඇතුළෙ ඉන්න අය කො[illegible]

අනතුරට පත් වේදැයි කියන්නට බැරි තත්ත්වයකයි, අද රත්නපුරේ වෙළඳ පොල තිබෙන්නෙ. එම නිසා නගරයේ වෙළෙන්දෝ පාර දෙපැත්තේ "පේව්මන්ට්" උඩ ඒ අයගේ බඩු තබාගෙන විකුණමින් සිටිය. එම මහජන ගමනා ගමනයට අවහිරයක් නිසා දැන් ඒකත් නවත්වා දමා තිබෙන හෙයින් ඒ වෙළඳුන් ලොකු කරදරයකට පත්වෙලා ඉන්නව. අවශ්‍ය නම් මේ සඳහා සුදුසු ස්ථානයකුත් අපට පෙන්වා දෙන්න පුළුවන්. එම නිසා මහනුවර වෙළඳපොළ සකස් වුණු ආකාරයටවත් රත්නපුරයට වෙළඳපොළක් ලබා දීමට ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනව.

**කුලරත්න මයා.**
*(திரு. குலரத்ன)*
(Mr. Kularatne)

**විසින් ස්ථිර කරන ලදී.**

*ஆமோதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ යෝජනාව සම්බන්ධයෙන් පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා වෙනුවෙන් වචන දෙක තුනක් කියන්ට කැමතියි. අද රත්නපුර මන්ත්‍රීතුමා (ආටිගල මයා.) ගෙදරින් දොට්ට බැහැලා තිබෙන්නෙ සුභ නැකතකින් වන්ට ඕනෑ. එතුමා ඉදිරිපත් කළ සෑම යෝජනාවක්ම රජය පිළිගත් අතර ඒවාට විරුද්ධ පාර්ශ්වයේ ද සහයෝගය ලැබුණ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ක්‍රියාවෙ යෙදෙයිද කියන එකයි, ප්‍රශ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*

(Mr. S. de S. Jayasingha)

ඒ හැටියටම ක්‍රියාවේ යෙදෙනව. සෑම දෙයක්ම පොරොන්දු වුණු හැටියටම ඉෂ්ට වෙනව. මේ යෝජනාව මීට අවුරුදු ගණනාවකට පෙර රත්නපුර පළාත් ආණ්ඩු සභාව මගිනුත් ඉදිරිපත් කර තිබුණා. රත්නපුර නගරයට පොදු වෙළඳපොළක් අවශ්‍ය බව අපි පිළිගන්නව. දැන් තිබෙන වෙළෙඳපොළ ඉතා පැරණි එමෙන්ම දැන් තත්ත්වය අනුව ප්‍රමාණවත් නොවන එකක් බව අප දන්නව. මේ සම්බන්ධයෙන් රත්නපුර පළාත් ආණ්ඩු සභාව මගින් පළාත් පාලන අමාත්‍යාංශයේ සංවර්ධන ණය අරමුදලෙන් රුපියල් ලක්ෂ 3 ක ණය මුදලක් ඉල්ලා තිබෙනව. එය දැන් අනුමත කර තිබෙනව පමණක් නොව පළාත් පාලන අංශයේ නගර නිර්මාණ ශිල්පීන් විසින් දැනටමත් ඒ සඳහා සැලසුම් පවා සකස් කර අවසානයි. එම නිසා මේ යෝජනාව අපි ඉතා සතුටින් පිළිගන්න බව ප්‍රකාශ කරන්ට කැමතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## රත්නපුර නගරයට මධ්‍යම බස් නැවතුම් පළක්

### இரத்தினபுரி நகருக்கு மத்திய பஸ் நிலையம்

### CENTRAL BUS STAND FOR RATNAPURA TOWN

අ. භා. 3.28

**ආටිගල මයා.**

*(திரு. ஆட்டிகல)*

(Mr. Attygalle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව මම ඉදිරිපත් කරනව:

"පළාත් කිහිපයක් ඔස්සේ විහිදී, ඇති මාර්ග රාශියක ධාවනයේ යෙදෙන බස් රථවලට මධ්‍ය ස්ථානයක් වන රත්නපුරයේ වර්තමාන බස් නැවතුම්පළ බස් වලට හෝ ඒවයේ ගමනාගමනය කරන මගීන්ට කිසිසේත් ප්‍රමාණවත් නොවන නිසාත් එකී බස් නැවතුම්පළ කුඩා ගංවතුරකින් පවා යටවන පහත් ස්ථානයක පිහිටීම නිසා ඇති වී තිබෙන දුෂ්කරතාවය මග හැරවීම සඳහා වහාම රත්නපුර නගරයේ යෝග්‍ය ස්ථානයක අංග සම්පූර්ණ මධ්‍යම බස් නැවතුම් පළක් ඇති කළ යුතු යයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට පවතින බස් නැවතුම්පොළ ඉතා පැරණි කුඩා එකක්. එය ඉතාම පහත් ස්ථානය කයි පිහිටා තිබෙන්නෙ. මේ බස් නැවතුම් පොළට පැමිණෙන මගීන්ට නොයෙක් කරදරවලට මුහුණ පාන්ට සිදු වෙනව. කොළඹ, බදුල්ල, බණ්ඩාරවෙල, කතරගම, හම්බන්තොට මාර්ගවල මධ්‍යස්ථානයක් වශයෙන් රත්නපුර බස් නැවතුම්පොළ සලකන්න පුළුවනි. ඒ ස්ථානයේ බස් නවතා තැබීමටවත්, මගීන්ට හරිහැටි බස් රථයකට නගින්නටවත් පුළුවන්කමක් නැහැ. එය සකස් කර තිබෙන්නෙ කිසිම සැලැස්මක් අනුව නොවෙයි. රත්නපුරයේ අනෙක් සෑම ප්‍රසිද්ධ ස්ථානයක් වගේම මේ ස්ථානයත් ඉතාම අබලන්, දුර්වල, අයෝග්‍ය තත්ත්වයකයි තිබෙන්නෙ. එම නිසා මේ ගැන වහා කටයුතු කිරීම රත්නපුර පළාත් වාසීන්ගේ සතුටට හේතු වන බව මා මෙහිදී ප්‍රකාශ කරන්ට කැමතියි. මේ බස් නැවතුම්පොළ වැඩි දියුණු කිරීමට ඒ ස්ථානයේ තව ඉඩ කඩ තිබෙනව. ඒ ස්ථානය සුදුසු නැහැ කියනවා නම් වෙනත් සුදුසු ස්ථාන පෙන්නා දෙන්ට අපට පුළුවන්. ජනසතු සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා රත්නපුර නගරයට පැමිණි අවස්ථාවේ ඒ සඳහා සුදුසු ස්ථානයක් අපි එතුමාට පෙන්වා දුන්න. එහෙත් ඒ පිළිබඳව තවම කිසියම් පියවරක් ගෙන ඇති බවක් පෙනෙන්නට නැහැ. එම නිසා නොපමාව රත්නපුරයට සුදුසු බස් නැවතුම්පොළක් ලබා දීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනව.

**කුලරත්න මයා.**

*(திரு. குலரத்ன)*

(Mr. Kularatne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ යෝජනාව මම ස්ථිර කරනව. රත්නපුර නගරයට මේ පහසුකම ලබා දීමට ලංකා ගමනාගමන මණ්ඩලයට මෙපමණ කාලයක් ගතවීම පුදුමයට හේතුවක්. බොහොම කාලයක සිට මේ බස් නැවතුම්පොළ පවත්වාගෙන එන්නෙ ගඟේ ඉවුරකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්දකට වරක් හෝ දෙවරක් ගංවතුරෙන් යට වන මේ ස්ථානයේම ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බස් නැවතුම්පොළ දිගටම පවත්වාගෙන යෑම පුදුමයට කරුණක්. එම නිසා හැම ආයතනයකින්ම කරන ඉල්ලීම් ඉටු කිරීමට කිසිම ලෑහැස්තියක් නැතිව සිටින මෙවැනි අවස්ථාවකදී මේ මණ්ඩලය මගින් නව බස් නැවතුම්පොළක් සාදා දීමට සෑහෙන ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන ලෙස කළ ඉල්ලීම ඉටු කිරීමට මේ නගර සභාව ලෑහැස්තිවී සිටිනවා. ඒ කරුණ සම්බන්ධයෙන්වත් කන් නොදී සිටීම පුදුමයට කරුණක්. දෙපාර්තමේන්තුවලට වඩා මණ්ඩලවලින් වැඩ කර ගැනීම පහසුයි. ඒ නිසා රත්නපුර නගරයට නව බස් නැවතුම්පොළක් වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 3.31

**විජයසුන්දර මයා.**
(திரு. விஜேசுந்தர)
(Mr. Wijesundara)

රත්නපුරයට මධ්‍යම බස් නැවතුම් පොළක් සැපයීම පිළිබඳව වූ මේ යෝජනාව ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී බස් සේවාව හරියාකාර පවත්වා ගෙන යෑම ගැන වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. බස් සේවාව හරියකාර පවත්වා ගෙන නොයන්නේ නම් බස් නැවතුම් පොළවලින් වැඩක් නැහැ. අද බස් සේවාව පවත්වා ගෙන යන අන්දම ඒ තරම් සතුටුදායක යයි කියන්නට පුළුවන්කමක් නැහැ. ඊයේ උදේ කාලයේදී "ඩබල් ඩෙකර්" බස් රථයක් කොල්ලුපිටියේදී පාරෙන් ඉවතට පැන විශාල අනතුරකට පත්වූ බව තමුන්නාන්සේටත් ආරංචි ඇති. දැනට ප්‍රවාහණ නිලධාරීන් ඒ ගැන පරීක්ෂණ පවත්වා ගෙන යනවා. ඒ කෙසේ වෙතත් බස්වල කාර්මික දෝෂයන් නිසා —බස් රථය හරියාකාර පරීක්ෂා නොකිරීම නිසා—අනතුරට භාජන වන බස් රථ සංඛ්‍යාව එන්න එන්නම වැඩි වෙනවා. සේවයේ තිබෙන බස් රථවලින් 1/4 ක් ගරාජ්වලය කියා ප්‍රවෘත්ති පත්‍රවල පවා තිබෙනවා. ලංගම සභාපතිවරයා අද කෙසේ ප්‍රකාශ කළත් බස් රථවලින් 1/4 ක් ගරාජ් කර තිබෙනවාය කියා සඳහන් වී තිබුණේ "දිනමිණ" පත්‍රයෙහි මිසක් අපේ ප්‍රවෘත්ති පත්‍රයක නොවන බව කියන්න කැමතියි. ලංගම සභාපතිවරයා බස් සේවය ගැන කොතරම් උනන්දුවක් දක්වනවාද කියතොත් අගලවත්තේ මැතිවරණ දිනයේදීත් බස් සේවාව ගැන පරීක්ෂා කර බැලීම සඳහා අගලවත්ත ප්‍රදේශයේ සංචාරයකත් යෙදුණා. එමෙන්ම තවත් අධ්‍යක්ෂවරයකු වන ජිනදාස නියතපාල මහතාත් රැස්වීම්වල කථාකරමින් ඔහු සමග සංචාරයේ යෙදුණා. ඒ නිසා ඒ මහත්වරුන්ගේ කාලය දේශපාලන කටයුතුවලටම මිඩංගු වෙනවාද එහෙම නැතිව ලංගමයේ කටයුතුවලට මිඩංගු කරනවාද කියා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා වත් පරීක්ෂා කර බලනවා නම් හොඳයි කියා මා හිතනවා.

මේ යෝජනාව යටතේ මේ කරුණු සඳහන් කිරීමට මට සිදු වුණේ බස් අනතුරු දිනෙන් දිනම වැඩි වන නිසයි. ලංගම සභාපතිවරයා එක්සත් මොටර් සේවක කම්කරු සංගමයට තර්ජනයක් කර තිබුණා "මට උගන්වන්න එන්න එපා" කියල. අද උදේ ප්‍රවෘත්ති පත්‍රයක මා දැක්ක. එමෙන්ම ඔහු කියා තිබුණා ඔහුට ජාතික ප්‍රවාහන සේවක සංගමයේ සහයෝගය තිබෙනවාය කියල. එහෙත් ඔහුට අස් වෙන්නය, විශ්‍රාම ගන්නය, කියල තර්ජනය කර තිබුණේ එක්සත් මෝටර් සේවක කම්කරු සංගමය නොවෙයි. එම තර්ජනය කර තිබුණේ මහජන එක්සත් පෙරමුණට සම්බන්ධ යයි ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණු කම්කරු සංගමයක් විසිනුයි. එවැන්නක් කළත් එය සාධාරණයි. මා එසේ කියන්නේ බස් සේවාව ඉතාම අඩපන තත්ත්වයකට පත් වී තිබෙන නිසයි. මේ විධියට ගියොත් තව මාස ගණනක් යන්නට පෙර අපේ රටේ මහජනතාව, "හැතැප්ම දෙකක තුනක ගමනක් බස් රියකින් යනවාට වඩා පයින් යන එක හොඳයි, බස් සේවයෙන් වැඩක් නැහැ" කියා එවැනි ගමන් පයින්ම යෑමට සූදානම් වන්නට පුළුවන්. එමෙන් ම බස් සේවය අඩපන වීම නිසා "හයරිං කාර්"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

හිමියන්ට හා පෞද්ගලික බස් හා වෑන් රථ හිමියන්ට අවස්ථාවක් උදා වී තිබෙනව. ඒ නිසා මේ රටේ තිබෙන ඉතාම ශ්‍රේෂ්ඨ වස්තුවක් වන මේ ජනසතු බස් සේවය ආරක්ෂා කිරීමට එම අංශය භාර ඇමතිවරයාත් දැන් මේ ගරු සභාවේ සිටින පාර්ලිමේන්තු ලේකම්තුමාත් උනන්දුවක් නොගත්තොත් හෙට අනිද්දා මේ බස් සේවාව ප්‍රපාතයකට වැටෙන්නට පුළුවන්. ඒ නිසා කොතරම් දුරට දේශපාලන බලපෑම් තිබුණත්, කොතරම් දුරට කෙරුම්කාරයින්ගේ බලපෑම් ඇති වුණත්, වහාම මේ ගැන පරීක්ෂා කර බලා මෙය සුද්ධ කර නොදැම්මොත් එය ජනතාවට කරන ලොකු අපරාධයක් හැටියට සලකා රත්නපුරයට නව මධ්‍යම බස් නැවතුම් පොලක් ලබා දෙන අතරම ලංගමය සම්පූර්ණයෙන්ම සුද්ධ කර නියම මහජන සේවයක් ඇති කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 3.34

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
**(Mr. Welagedera)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. රත්නපුරයට නව බස නැවතුම්පොලක් අවශ්‍ය බව මා පිළිගන්නව. ඒ පළාත හා එම බස් නැවතුම්පොළ බැලීමට මා ගිය අවස්ථාවේදී මා දැක්ක එම බස් නැවතුම්පොල තිබෙන්නෙ විතුරට යට වන ස්ථානයක බව බස් නැවතුම්පොලක් හදා දෙන්නට සුදුසු ස්ථානයක් සොයා දෙන්නය කියා මා ඒ අවස්ථාවේදී එතුමාගෙන් හා නිලධාරි මහත්වරුන්ගෙන් ඉල්ලීමක් කළා. අපට සුදුසු ඉඩමක් පෙන්නූ හැටියෙ එය ඉක්මණින් කරන්ට බලාපොරොත්තු වෙනව.

කිරිඇල්ලෙ ගරු මන්ත්‍රීතුමා අගල වත්ත ගැන එහෙම කිව්ව. ඒ සඳහන් කරන ලද සිද්ධින් කිසිවක් මා දන්නෙ නැහැ. මම ඒවා ගැන සොයා බලනව. අපි මේ රටේ බස් සේවාව දියුණු කිරීමට සෑහෙන උත්සාහයක් දරා තිබෙනව. 1965 මාර්තු මාසෙ අපි මෙම බස් සේවාව භාර ගත්තා විට පාරෙ වැඩ කරමින් තිබුණේ බස් දෙදහස් ගණනයි. දැන් ඒ

රත්නපුර නගරයට මධ්‍යම බස් නැවතුම්පළක්

ගණන හාරදහස් ගණනකට නැග තිබෙනව. [බාධා කිරීමක්] ගරාජ්වල තිබෙන ඒව හැරෙන්ට පාරෙ දුවන ඒව.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
**(Mr. Wijesundara)**

මහජනය පාරෙ රස්තියාදු වෙනව.

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
**(Mr. Welagedera)**

අද ඊට වඩා බස් තිබෙනා බව මහජනය පිළිගන්නව. 1965 මාර්තුවලට පෙර ඉංජිනේරු උපදෙස්වලට පවා විරුද්ධව කට යුතු කරමින් හදිසියෙන්ම බස් සේවා කීපයක් අබලන් පාරවල විවෘත කළා. දැන් එම බස් සේවාවන් නොනවත්වා පවත්වාගෙන යා යුතු වේලා තිබෙනව. ඒව කරන්ට යාමෙදි හදිසියෙම එම පාරවල දුවන බස් රථ අබලන් වෙනව. කෙසේ වෙතත් ඒ පාරවල් ක්‍රමක්‍රමයෙන් දියුණුවට පත් කරමින් මහජනතාවට හොඳ බස් සේවාවක් සලසා දීමටයි අපි නිතරම උත්සාහ දරන්නෙ. එම සේවාව ඔවුන්ට සැලසෙනව ඇති.

ලංගමයෙ ලොකු කුඩා සේවකයන් සැම දෙනාම අද එදාට වඩා විනීතව ක්‍රියා කරන බව කවුරුත් පිළිගන්නව. කිරිඇල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ වචනවලට පිළිතුරු දීම සඳහායි මෙම වචන ටික කියන්ට යෙදුණෙ. මේ යෝජනාව අපි ඉතා සන්තෝෂයෙන් පිළිගන්නව. අපි එය ක්‍රියාත්මක කරන්නට උත්සාහ දරන බව මතක් කරමින් මගෙ වචන ස්වල්පය අවසාන කරනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ප්‍රශ්නයක් අහන්ට තිබෙනව, බස් නැවතුම් පොළවල් සම්බන්ධයෙන්. සමහර ස්ථානවල පිහිටුවා තිබෙන මෙම ආවරණ සකස් කර තිබෙන්නෙ ඉහලට කොන්ක්‍රීට් බදාම ලෑල්ලක් පමණක් සවි කරලයි. එනිසා ඒවායෙ සිටින්නන්ට ඉරු එළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙන් පීඩාවක් නූනත් වැසි සුළං වලින් කරදර නොවිඳ සිටිම අමාරුයි. එම නිසා රත්නපුර බස් නැවතුම්පොළ සාදන විට වත් මෙම අඩුපාඩුව් සම්පූර්ණ කොට සාදන හැටියට මා ඉල්ලා සිටිනව. [බාධා කිරීමක්] ලංකාවෙ අනිකුත් ප්‍රදේශවල තියෙන බස් නැවතුම් පොළවලුත් ඒ තත්ත්වයෙමයි.

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
(Mr. Welagedera)
එම කාරණය මෙම යෝජනාවට අදාල නම් පිළිතුරු දිය හැකියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
අවශ්‍ය නැහැ.

අ. භා. 3.38

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)
මා නැගී සිටියෙ මෙම යෝජනාව අනුමත කරමින්ම වචන ස්වල්පයක් කතා කරන්ටයි. මට කරුණු ස්වල්පයක් කියන්ට තියෙනව, අකුරැස්ස බස් නැවතුම්පොළ සම්බන්ධව. ක්‍රීඩා භූමියක් නැති වීම නිසා—

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
ඒ සම්බන්ධව වෙනම යෝජනාවක් ගෙනෙන්න.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
දැන් බස් නැවතුම්පොළ සඳහා අරගෙන තියෙන්නෙ ක්‍රීඩා භූමියයි. ඒකයි මම කියන්නෙ. [බාධා කිරීමක්.] මීට මාස 2කට පමණ පෙර, පරණ බස් නැවතුම් පොළ අළුත්වැඩියා කරන තුරු තාවකාලික වශයෙන් එම බස් නැවතුම්පොළ ක්‍රීඩා භූමිය කරා ගෙන එන්ට ඕනෑය කියා තිරණය කොට කටයුතු කළා. ඊට පසුව ක්‍රීඩා භූමිය ස්ථිර වශයෙන්ම බස් නැවතුම් පොළ බවට පත් කරන්ට ඕනෑය කියමින් විශාල ප්‍රයත්නයක යෙදෙන බව පේනව පළාත් පාලන මණ්ඩලය පවා. ලංකා ගමනාගමන මණ්ඩලය ඊට කොතරම් දුරට සහභාගි වෙලා තියෙනවද කියන්ට මා දන්නෙ නැහැ. නමුත් මේ සම්බන්ධයෙන් පසුගිය දිනවල සාකච්ඡා ඇති වෙලා තිබෙනව.

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
(Mr. Welagedera)
ඒ පිළිබඳව පත්‍රයෙ දුටුව.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
එම ක්‍රීඩා භූමිය ප්‍රමාණවත් නොවන නිසා ඒ සඳහා අක්කර තුනක් අරගෙන අංග සම්පූර්ණ ක්‍රීඩා භූමියක් හැටියට පත් කරන බවට ක්‍රීඩා අංශය භාර ගරු ඇමතිතුමා පොරොන්දු වී තිබෙනව. නමුත් ඒ ඇමතිතුමා යටතෙම තියෙන බස් ව්‍යාපාරය සඳහා දැන් තියෙන අක්කර එකහමාරක් අල්ලාගෙන තිබෙනව. මූලික වශයෙන් මේ කටයුත්ත අයුතු අන්දමට කිරීමට සහභාගි වී තිබෙන්නේ පළාත් පාලන අමාත්‍යාංශය නිසා පළාත් පාලන අමාත්‍යාංශයට මේ ගැන කරුණු දන්වා තිබෙනව. බස් නැවතුම් පොළ පිළිබඳ ප්‍රශ්නයත් පැන නැගුණු නිසා අකුරැස්සේ බස් නැවතුම් පොළ පරණ තිබුණු තැනටම ගෙන දියුණු කිරීම සඳහා කටයුතු කරන ලෙස පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනව. ක්‍රීඩා භූමිය පිළිබඳ ප්‍රශ්නයත් ඒ අමාත්‍යාංශයටම අයිති නිසා ක්‍රීඩා භූමිය දියුණු කිරීම ගැනත් සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනව.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## රත්නපුර නගර සභාව සම්බන්ධයෙන් පවත්නා නොපනත් කම් ආදිය පිළිබඳ කොමිසම

## இரத்தினபுரி நகரசபையின் முறையற்ற செய்கைகள் முதலியன சம்பந்தமான ஆணைக்குழு

## COMMISSION ON MALPRACTICES, ETC., OF RATNAPURA URBAN COUNCIL

අ. භා. 3.40

**ආටිගල මයා.**

*(திரு. ஆட்டிகல)*

(Mr. Attygalle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නමින් ඇති ඊ ළඟ යෝජනාව න්‍යාය පත්‍රයෙහි සඳහන් වී තිබෙන්නෙ මේ විධියටයි :

"රත්නපුර පළාත් ආණ්ඩු සභාවේ වර්තමාන පාලනය පිළිබඳව ඇති නොයෙක් අන්දමේ අල්ලස්,, අධි භාරයන් හා නොපනත්කම් පිළිබඳ හැම අංශයකින්ම, ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විරුද්ධ පක්ෂයෙන්ද නැඟී තිබෙන චෝදනා ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාවක් පත් කළ යුතුයයිද,

(අ) එසේ පත් කෙරෙන කොමිෂන් සභාවකින් සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා අවසන් වන තුරුත්,

(ආ) රත්නපුර පළාත් ආණ්ඩු සභාවේ සීමා සංශෝධන ආදිය පිළිබඳ කටයුතු අවසන් වන තුරුත්,

(ඉ) යෝග්‍ය පරිදි නිවැරදි ඡන්ද ලැයිස්තුවක් පිළියෙළ කොට මැතිවරණයක් පැවැත් වීමට දින නියම වන තුරුත්,

රත්නපුර පළාත් ආණ්ඩු සභාව විසුරුවා හැර රත්නපුර පළාත් ආණ්ඩු සභාවේ පාලනය විශේෂ කොමසාරිස්වරයෙකු යටතට පත් කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට කල් දීල අවුරුදු එකහමාරක පමණ කාලයක් ගත වී තිබෙනව. ඒ අතරතුර කාලයේදී රත්නපුර පළාත් ආණ්ඩු සභාව විසුරුවා හැර ඒ පළාත් ආණ්ඩු සභාවේ පාලනය විශේෂ කොමසාරිස්වරයකුට භාර දී තිබෙනව. ඒ නිසා මේ යෝජනාව න්‍යාය පත්‍රයෙහි සඳහන් වී තිබෙන පිළිවෙළටම අද ඉදිරිපත් කරන්න මම අදහස් කරන්නෙ නැහැ. අල්ලස් දූෂණ අධිභාරයන් හා නොපනත්කම් පිළිබඳව නැඟී තිබෙන චෝදනා සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා කොමිසමක් පත් කිරීමත්, නගර සීමා සංශෝධනය කිරීමත්, ඡන්ද ලැයිස්තු නිවැරදිව පිළියෙල කිරීමත් කළ යුතුය කියා පමණයි, මම අද යෝජනාව ඉදිරිපත් කරන්නෙ.

මේ දූෂණ ක්‍රියා සම්බන්ධව සෙවීමට කොමිසමක් පත් කර ඒ කොමිසමේ වාර්තාව ඉදිරිපත් කළ යුතුය කියා පළාත් ආණ්ඩු සභාව වැඩි ඡන්දයෙන් යෝජනා ස්ථිර කර තිබෙනව. ඒ නිසා එය විශේෂයෙන් කළ යුතු දෙයක් බව මම ප්‍රකාශ කරනව.

**කුලරත්න මයා.**

*(திரு. குலரத்ன)*

(Mr. Kularatne)

**විසින් ස්ථිර කරන ලදී.**

*ஆமோதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

අ. භා. 3.43

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)

*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*

(Mr. W. P. G. Ariyadasa—Haputale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ වැදගත් යෝජනාව විවාදයට භාජන වන මේ අවස්ථාවේදී රත්නපුර නගර සභාවේ පමණක් නොව ලංකාවේ නොයෙක් නොයෙක් ප්‍රදේශවල ඇති වෙනත් නගර සභාවලත් සිදු වන දූෂණ ගැන කියන්න අපට සිදු වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

රත්නපුර නගර සභාව ගැන පමණයි, මේ යෝජනාව තියෙන්නෙ. ඒ නිසා කරුණා කර ඒ ගැන පමණක් කථා කරන්න.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

රත්නපුර නගර සභාව ගැන පමණක් කථා කරන ලෙස ගරු නියෝජ්‍ය කථානායකතුමා නියම කරනව. භාමුත් පළාත් පාලන ආයතන පිළිබඳව කථා කරන අවස්ථාවේදී යම්කිසි පළාත් පාලන ආයතනයක දූෂණයක් සිදු වෙනවා නම් ඒ දූෂණය ගැන කථා කරන්න ඉඩ තිබෙනවය කියා—මේ යෝජනාව යටතෙත් එසේ කථා කරන්න පුළුවන්කමක් තිබෙනවය කියා—මම හිතනව. ඒ කෙසේ වුනත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ නියමය අනුව මම ඒ සම්බන්ධව කීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. මෙම යෝජනාවෙන් ඉල්ලා තිබෙන අන්දමට රත්නපුර නගර සභාවේ නොමනා වැඩ පිළිවෙළ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන අතර වෙන යම් පළාත් පාලන ආයතනයකත් මේ විධියේ අයථා වැඩ කටයුතු සිදු වෙනවා නම් ඒ අයථා කටයුතු පිළිබඳවත් සලකා බලා කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනව. මගේ ඡන්දදායක කොට්ඨාශයෙ ප්‍රධාන නගරයේ තිබෙන නගර සභාව සම්බන්ධව මේ යෝජනාව උඩම කථා කරන්නට ඉඩක් නැති වීම ගැන මම කනගාටු වෙනව. එසේ ඉඩක් නැතත්, එහි පවතින දූෂණයන් ගැනද සොයා බලා කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

***Question put, and agreed to.***

පාතිමා මුස්ලිම් ගැහැණු ඉංග්‍රීසි පාසැල සඳහා ඉඩම් අත්කර ගැනීම හෝ පවරා ගැනීම

## පාතිමා මුස්ලිම් ගැහැණු ඉංග්‍රීසි පාසැල සඳහා ඉඩම් අත්කර ගැනීම හෝ පවරා ගැනීම

*பாத்திமா முஸ்லிம் பெண்கள் ஆங்கில பாடசாலைக்குக் காணி கொள்ளல் அல்லது உரிமையாக்கல்*

## FATHIMA MUSLIM GIRLS' ENGLISH SCHOOL: ACQUISITION OR VESTING OF LAND

අ. භා. 3.46

**ශ්‍රීමත් රසීක් ෆරීඩ්** (පත් කරන ලද මන්ත්‍රී—කාරක සභා නියෝජ්‍ය සභාපති)
*(ஸ்ரீமான் ரூசிக் பரீத்—நியமன அங்கத்தவர்—குழு உப அக்கிராசனர்)*
(Sir Razik Fareed—Appointed Member—Deputy Chairman of Committees)

I move,

"That this House is of opinion that the land and premises No. 155, Bandaranaike Mawatha on which the Fathima Muslim Girls' English School in the Colombo Central Electorate is situated should be acquired or vested in the Crown at the earliest opportunity."

I do not think many words are necessary to introduce this Motion. I had been the Manager of this school for a number of years and it is situated in an area where there are many slums. We have got even grown up Muslim girls attending this school and there are over 1,000 children in the school.

During the last regime when the schools were taken over, this very important school also was taken over but it received step-motherly treatment. It was neither vested nor was it taken over in such a way as to enable that Government or any future Government to effect improvements. Today it stands on a private land and the result is that no progress can be made in respect of the building.

The Parent-Teachers' Association had asked me to move this Motion and I am sorry that none of the hon. Members for Colombo Central are here. The Principal, Mrs. Rahim, is one of our most educated or cultured ladies and we are fortunate in having

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
PUBLIC LIBRARY
JAFFNA

[ශ්‍රීමත් රසීක් ෆරීඩ්]

a graduate in her. She has been putting pressure on the parents too and out of that pressure this Motion was placed in my hands.

Therefore, I move that the land on which this school stands be taken over by the Government. Unfortunately the ownership of the land is in the hands of Mr. and Mrs. Deraniyagala. I have spoken to them. Earlier they were not prepared to sell this land but now they have no objection to the land being acquired. At the time I gave notice of this Motion I thought they were unco-operative but fortunately when I spoke to them later they said, "All right, do not vest it, give us the money and acquire it."

Therefore, I move that the land on which this school stands be acquired or even be vested in the Government.

අ. භා. 3.50

**මොහමඩ් අලි මයා.**
*(ஜனுப் முகம்மது அலி)*
**(Mr. Mohamed Ali)**

கௌரவ உப சபாநாயகர் அவர்களே, கௌரவ நியமன அங்கத்தவர் அவர்களாற் பிரேரிக்கப்பட்ட இந்தப் பிரேரணையை ஆமோதித்து சில வார்த்தைகள் கூற ஆசைப் படுகின்றேன். பாத்திமா முஸ்லிம் பெண்கள் ஆங்கில பாடசாலை, கௌரவ நியமன அங்கத் தவர் அவர்கள் கூறியதுபோன்று, பல ஆண்டு களாக கொழும்பு நகரத்திலுள்ள முஸ்லிம் மங்கையர்களுக்குப் பல சேவைகளைச் செய் துள்ளது. கௌரவ நியமன அங்கத்தவர் இந்தப் பிரேரணையையிட்டுப் பேசும்போது, இப்பாடசாலை கல்வித்துறையில் நல்ல சேவை களைச் செய்திருந்தபோதிலும், அரசாங்கம் இவ்வளவு காலமாக இந்தப் பாடசாலை யைப் பாரமெடுக்காமல், வேறு விதத்திலும் நடவடிக்கைகள் எடுக்காமல் இருந்திருக்கின் றது என்பது எனது நினைவுக்கு வந்தது. இது விசனிக்கத்தக்க ஒன்ருகும். எனவே, இந்தப் பிரேரணையைப் பிரேரித்த கௌரவ நியமன அங்கத்தவர் அவர்களுக்கு எங்கள் சமுதாயத்தின் சார்பாக நன்றி கூறி, நான் இந்தப் பிரேரணையை ஆமோதிப்பதோடு இதனை அரசாங்கம் ஏற்றுக்கொள்ள வேண்டு மெனவும் கேட்டுக்கொள்கிறேன்.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
வினு எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

**සී. රාජදුරෙයි මයා.** (මඩකලපුව පළමුවන මන්ත්‍රී)
*(திரு. சீ. இராஜதுரை—மட்டக்களப்பு முதல் அங்கத்தவர்)*
**(Mr. C. Rajadurai—First Batticaloa)**

கௌரவ உப சபாநாயகர் அவர்களே, இந்தப் பிரேரணையின் மீது சில வார்த்தை கள் கூற நான் விரும்புகின்றேன்.

இந்தப் பாடசாலை அமைந்திருக்கின்ற தெருவிலே ஐந்து ஆண்டுகளுக்கு மேலாக வசித்தவன் என்ற ரீதியில் இந்தப் பாடசாலை யினுடைய நிலைமையைப்பற்றி நான் நன்கு அறிவேன். இப்பாடசாலையின் நிலைமையைப் பற்றி கௌரவ நியமன அங்கத்தவர் அவர் கள் மிக விளக்கமாக இங்கு எடுத்துக் கூறி ஞர்கள். இந்தப் பாடசாலைக்கு நிரந்தரமான கட்டடம் அவசியம் தேவையென்பதைச் சில ஆண்டுகளுக்கு முன்னர் அங்கு நடைபெற்ற நபிகள் நாயகம் அவர்கள் பிறந்த விழா வில் கலந்து, பேசச் சென்றிருந்தபொழுது நான் காணக்கூடியதாக இருந்தது. கொழும் பில், அதுவும் குறிப்பாக இஸ்லாமிய சகோ தரிகளுக்கு, மிக முக்கியத்துவம் வாய்ந்த இந்தப் பாடசாலையின் நிலைமையைக் கடந்த பல ஆண்டுகளாக அரசாங்கத்தின் கவனத் துக்குக் கொண்டுவந்தும் இன்னும் இது திருத்தப்படாத நிலையில் இருப்பதை எடுத் துக் கூறி, அவசியமாக இந்தப் பாடசாலை யைத் திருத்த வேண்டுமென்று பிரேரிப்பா ளர் கேட்டுக்கொண்டார். இந்தத் தெரு வில் பல ஆண்டு காலம் வசித்தவன் என்ற ரீதியிலும் இந்தப் பாடசாலையின் நிலைமை யைப் பற்றி நன்கு அறிந்தவன் என்ற ரீதியி லும், முக்கியத்துவம் வாய்ந்த இந்தப் பிரே ரணையை அரசாங்கம் ஏற்று, அத்தோடு நின்று விடாமல் இங்கு குறிக்கப்பட்டிருக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගවයින් සහ මීහරකුන් මැරීම තහනම් කිරීම

கும் வேண்டுகோள்களையும் நிறைவேற்றி வைக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## ගවයින් සහ මීහරකුන් මැරීම තහනම් කිරීම

### *மந்தைகள் கொலை செய்யப்படுவதைத் தடுத்தல்*

### PROHIBITION OF SLAUGHTER OF CATTLE

අ. භා. 3.53

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*
(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය නොමැතිවීම නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මා ඉදිරිපත් කර තිබෙන යෝජනාව මෙසේ යි :

> "අප රටේ ගොවිතැන් සාර්ථකව කරගෙන යාම වද, ගම්බද ගොවියාගේ ආදායම් මාර්ග වැඩි කර ගැනීම පිණිසද විපුල ප්‍රයෝජන ගෙන දෙන ගවයන් සහ මීහරකුන් මස් පිණිස මරණ නිසා අද ගම්බද ගොවියාට ගවයාගෙන් සහ මීහරකුන්ගෙන් ලබාගත් ප්‍රයෝජන ලබා ගැනීමේ අවස්ථාව ක්‍රම ක්‍රමයෙන් නැතිවී ගෙන යන බැවින් අප රටේ ගවයන් සහ මීහරකුන් මස් පිණිස මැරීම නීතිය මගින් විහාම තහනම් කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

අද ගම්බද ගොවීන්ට ට්‍රැක්ටර් යන්ත්‍ර නැත්නම් ගොවිතැන් කරන්ට බැරි තත්ත්වයක් ඇතිවී තිබෙනව. ඊට හේතුව මීහරකුන් සහ එළහරකුන් අධික වශයෙන් මස් පිණිස මරා දැමීමයි. ගවයින් හොර කම් කරගෙන ගිහිනුත් මස් පිණිස මරනව. ඇත්ත වශයෙන්ම අද අපේ ප්‍රදේශවල හරක් හොරකම් කොයි තරම් වැඩිවී තිබෙනවාද කියා කියනවා නම් පොලීසියට වත් ඒවා මැඩ පැවැත්වීමට බැරි තරම් තත්ත්වයක් ඇතිවී තිබෙනව. ගොවිතැනට ගවයාගෙන් සහ මීහරකාගෙන් ලැබෙන විපුල ප්‍රයෝජනය කුමක්ද කියා අප කවුරුත් දන්නව. නමුත් අද ගොවිතැන් කරන ප්‍රදේශවලින් ගවයින් සහ මීහරකුන් සම්පූර්ණයෙන්ම වඳවේගෙනයි යන්නෙ.

මේ රටේ ගොවිතැන ගැන ආණ්ඩුව විශාල උනන්දුවක් දක්වනවාය කියනව. ඒවාගේම මේ ආණ්ඩුවේ පරමාර්ථය විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමය කියනව. නමුත් ගොවිතැනට මීහරකුන් නැතිව ට්‍රැක්ටර් යෙදීමෙන් ඒ පරමාර්ථ දෙකම ඉෂ්ට වෙන්නෙ නැහැ. ට්‍රැක්ටර්වලින් කුඹුරු ගොවිතැන් කිරීම අසාර්ථක බව අද ඔප්පුවී අවසානයි. එමනිසා මේ රටේ කුඹුරු ගොවිතැන සාර්ථක කර ගන්නට නම් ගවයින් සහ මීහරකුන් වැඩි වැඩියෙන් ඇති කරන්නට වුවමනා කරනව. මේ රටේ ගවයින්ගේ සහ මීහරකුන්ගේ සංඛ්‍යාව වැඩි කරන්නට වුවමනා කරනව. එසේ නොකළොත් කුඹුරු ගොවිතැන දියුණු කිරීමට ආණ්ඩුව දරන උත්සාහය සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙනවාට කිසිම සැකයක් නැහැ. ට්‍රැක්ටර් යන්ත්‍රවලින් මේ රටේ කුඹුරු දියුණු කරන්ට බලාපොරොත්තු වුණොත් කවදාවත් අපේ විදේශ විනිමය ආරක්ෂා කරගන්ට පුළුවන් වෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිරි ආහාර සඳහාත් අද විශාල මුදලක් අපේ රටින් පිටරටට ඇදී යනව. විශේෂයෙන්ම අද හැම මාර්ගයකින්ම විදේශ විනිමය ආරක්ෂා කර ගන්ටයි ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නෙ. මගේ මේ යෝජනාවේ සඳහන් වන අන්දමට ගවයින් සහ මීහරකුන් මැරීම තහනම් කළොත් අද කිරි ආහාර සඳහාත් මේ රටින් ඇදී යන විශාල මුදල ඉතිරි කර ගන්ට අවස්ථාව ලැබෙනව. මේ රටේ කිරි ආහාර සුලබවීම ජාතියේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය වීමට හේතු වෙනව.

අවසාන වශයෙන් මේ රටේ ගොවිතැන සාර්ථකව කරගෙන යෑම පිණිසත් පිටරට ඇදී යන විදේශ විනිමය ඉතිරි කර ගැනීම පිණිසත් ගොවියාගේ ප්‍රයෝජනය පිණිසත් මා මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ක්‍රියාත්මක කරන මෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.56

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)

*(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)*

(Mr. Leelartane Wijesinghe—Polonnaruwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කිරීමටයි මා නැගී සිටින්නෙ. ඇත්ත වශයෙන්ම මේ රටේ ගව සම්පත ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. අද විශාල වශයෙන් ගොවිතැන් කරන ප්‍රදේශවලින් මීහරකුන් හොරකම් කරනව. නොයෙකුත් උපක්‍රමවලින් හොරකම් කරනව. ඒවාගේම විශාල වශයෙන් මීහරකුන් මසට විකුණනව. අද අපේ ප්‍රදේශවල මීහරකුන් නැතිකම නිසා ගොවිතැන් කරන්ට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනව. ට්‍රැක්ටර් මගින් ගොවිතැන් කරන්ට බලාපොරොත්තු වුණත් එය සාර්ථක වන බවක් පෙනෙන්නට නැහැ. සාමාන්‍ය ගොවීන්ට ට්‍රැක්ටර් යන්ත්‍රයක් ගන්නට තරම් වත්කමක් නැහැ. ඒ අතර මුදල් තිබෙන ලොකු ලොකු මුදලාලිල ට්‍රැක්ටර් යන්ත්‍ර අරගෙන මුදල් හම්බ කිරීමේ ව්‍යාපාර ගෙන යනව. මේ තත්ත්වය නිසා අද සාමාන්‍ය ගොවියා විශාල කරදරයකට වැටී තිබෙනවා. එක් අතකින් ගවයින් සහ මීහරකුන් වඳවිගෙන යනව. අනෙක් අතින් ට්‍රැක්ටර්වලින් ගොවිතැන් කිරීම අසාර්ථක වී තිබෙනව. එමනිසා රටේ ගොවිතැන දියුණු කිරීමට නොහැකිවී තිබෙනවා. අඩු වශයෙන් කුඩා අත් යන්ත්‍ර ට්‍රැක්ටර් බහුල වන තුරුවත් මේ රටේ මීහරකුන් මැරීම සම්පූර්ණයෙන්ම නතර කිරීම ඉතා මත් කාලෝචිත බව ප්‍රකාශ කරමින් මා ඉතා සන්තෝෂයෙන් මේ යෝජනාව ස්ථිර කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*



## රක්ෂා සැපයීම

### *தொழில் வழங்கத் திட்டங்கள்*

### SCHEMES FOR PROVISION OF EMPLOYMENT

අ. භා. 3.58

**එස්. බී. ලේනව මයා.** (කැකිරාව)

*(திரு. எஸ். பி. லேனவ—கக்கிராவ)*

(Mr. S. B. Lenawa—Kekirawa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනව :

"රක්ෂා නොමැති සහ තම තමන්ගේ පවුල් නඩත්තු කර ගැනීමට තරම් ඉඩම් හෝ ආදායමක් නොමැති ජනතාවට හැකි පමණ තම තමන්ගේ පළාත්වලම රක්ෂා සපයනු වස්, ලංකාවේ සියලුම පළාත්වල දැනට නවබුන් වී ඇති වැව්, අමුණු, ඇල, දොල ආදී ජලාස එක එක ජලාසය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය අනුව වෙන් වෙන්ව ඉහත සඳහන් අය යොදා සුදුසු වේතනයක් ගෙවා ප්‍රතිසංස්කරණය කොට එහි ඇති ගොඩ සහ මඩ (කුඹුරු) අස්වද්දා ඊට සරිලන නිවාස, පාසැල්, රෝහල්, සමුපකාර කඩ, වැසිකිළි ආදී ගොඩනැගිලි සහ ළිං හා පාරවල් ද ඒ අය ලවාම ඉදි කරවා එසේ සකස් වූ ගොඩ මඩ ඉඩම් සහ නිවාස ආදී දේපල එම ජනතාව අතර සින්නක්කර බෙදා දීමට, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

මම ඒ යෝජනාව ස්ථිර කරනව.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

The Sitting is suspended for half an hour. The Hon. Deputy Chairman of Committees will then take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30ට කාරක සභා නියෝජ්‍ය සභාපති නැන්පත් ශ්‍රීමත් රාසික් ෆරීඩ් මැතිතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. குழு உப அக்கிராசனர் [சேர் ருசிக் பரீத், ஓ. பி. ஈ.] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. සිවසිතම්පරම් මයා. (වවුනියා)
(திரு. ரி. சிவசித்தம்பரம்—வவுனியா)
(Mr. T. Sivasithamparam—Vavuniya)

I am very happy to speak on the Motion brought by the hon. Member for Kekirawa which deals with a matter concerning agrarian areas like my electorate.

The hon. Member's Motion is that all construction work and maintenance of minor irrigation works, including anicuts and dams, should be handed over to the unemployed people of the district so that they would be provided with employment. His Motion also suggests that after restoration the land should be handed over to cultivators and peasants for their occupation, and that houses and other buildings as may be required for each such community should be provided.

Now, before we proceed to get the minor irrigation works—minor irrigation tanks, dams and anicuts—restored and the cultivation done by the unemployed in those districts, there is a very important point to be straightened out. Hitherto the practice of the Commissioner of Agrarian Services in the matter of the restoration of minor irrigation works in the various districts has been that all works costing less than Rs. 7,500 have been handed over to rural development societies, multi-purpose societies, and cultivation societies the moment the bill of quantities, the estimate and the proposal have been approved by the Assistant Commissioner of Agrarian Services of the district. Under that system, there was no delay in getting the work done. For any work exceeding Rs. 7,500 and up to Rs. 12,000 the practice was to refer the estimates, bill of quantities and the proposal to the local irirgation authorities, the Irrigation Engineer or the Sub-Divisional Officer, whoever was the authority responsible for approving the work, and then allow the work to be done.

Last week, a circular has been sent by the Commissioner of Agrarian Services to the various Assistant



Commissioners of Agrarian Services in the various districts that the proposals, plans and estimates for all works costing Rs. 5,000 and over should be sent to the head office and that the work could be started only after obtaining approval from the head office.

Now, Sir, this is something that is very funny and peculiar. Today the various Government departments are decentralizing their activities in order to expedite their work. But here we see that the process of decentralization is being reversed. The Commissioner of Agrarian Services wants all estimates and proposals to be sent to the head office for approval.

In areas like my electorate, where there are a number of minor tanks, dams and streams, paddy cultivation and the cultivation of subsidiary food crops are being stepped up. This new arrangement that has been laid down by the Commissioner of Agrarian Services is going to create a bottle-neck. That is clear.

I have made investigations and inquiries and I find that there are in the head office two retired irrigation engineers who are older than yourself, Sir. They have to scrutinize the estimates and proposals sent by the twenty-two districts to the Island. This procedure is not going to hasten the pace of work or help us at all. I ask whether these two irrigation engineers who are at the head office can deal with these estimates and proposals expeditiously. Is it the position that the technical officers who are stationed in the different districts are incompetent to scrutinize these estimates and proposals ? Is it necessary that they should go to these two retired Irrigation engineers at the head office for approval ?

The present procedure is going to slow down the cultivation of paddy and subsidiary food crops. It should be done away with. If this is going to continue there will be heaps of files and plans and proposals and estimates in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. සිවසිත්තම්පරම් මයා.]

the Department of Agrarian Services but no real work will be done on the land itself. I feel that this is some sort of sabotage activity on the part of certain interested persons in the Department of Agrarian Services. They want to prejudice the work of the National Government on these matters and to impede cultivation work.

This is a matter that should be brought to the notice of the Minister and I emphasize that the procedure that was followed in the past should be reverted to.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## උප තැපැල් කාර්යාලවල ශ්‍රේණිය උසස් කිරීම

*உப தபால் நிலையங்களைத் தரமுயர்த்துதல்*

UP-GRADING OF SUB-POST OFFICES

අ. භා. 4.39

**ලේනව මයා.**

*(திரு. லேனவ)*

(Mr. Lenawa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නමින් න්‍යාය පත්‍රයේ සඳහන් වී තිබෙන මේ යෝජනාව මම ඉදිරිපත් කරනවා :

" උප තැපැල් කාර්යාල උසස් කිරීමේදී, ' කාර්යාලවල ගණුදෙනු සහ ලිපි හුවමාරු ප්‍රමාණවත් නොවන නිසා රජයට ලාභ නොලැබෙන බැවින් ඒවා උසස් කිරීම සුදුසු නැත ' යන තැපැල් දෙපාර්තමේන්තුව දැනට අනුගමනය කරන ප්‍රතිපත්තිය අත්සිටුවා, රටේ සංවර්ධනය ඉක්මන් කරවා ඒ මගින් විශේෂයෙන් නොදියුණු ගැමි ජනතාවගේ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමට හැකිවන පරිදි රජරට හා ලංකාවේ අනිකුත් නොදියුණු පළාත්වල දැනට ඇති සියලුම ' බී ' ශ්‍රේණි සහ ' සී ' ශ්‍රේණි උප තැපැල් කාර්යාල පිළිවෙලින් ' ඒ ' සහ ' බී ' ශ්‍රේණි වලට උසස් කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි. "

රජ රට ගැමි ජනතාවගේ දියුණුවට හාත්පසින්ම බාධාකරව තිබෙන්නේ හරියාකාර තැපැල් සේවයක් නොමැති නමයි. තැපැල් දෙපාර්තමේන්තුවෙන් ආදායමක් නැති නිසා තැපැල් කන්තෝරු උසස් කිරීමට බැහැ කියන කතාව පුදුමයට කාරණයක්. හරියාකාර ගොඩනැගිලි නැතිව, වුවමනා තරම් ගුරුවරුන් නැතිව ළමයින්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න බැහැ. ඒ කාරණය කවුරුත් පිළිගන්නවා. ඒ වගේම තැපැල් කාර්යාලවලින් හරියාකාර වැඩ නොකෙරෙනවා නම් යම්කිසි ප්‍රදේශයක දියුණුව නොසිදු වන බවත් අප පිළිගන්න ඕනෑ. ඒ නිසයි මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ. මා මීට වඩා ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ.

**සුගතදාස අරඹවල මයා.** (අක්මීමන)

*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*

(Mr. Sugathadasa Arambawela—Akmeemana)

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ස්ථිර කරමින් වචන කිහිපයක් කථා කරන්න කැමතියි. මෙය කාලෝචිත වැදගත් යෝජනාවක් බව පළමුවෙන්ම සඳහන් කරන්න පුළුවනි. ගම්බද "සී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලවලින් වැඩි වැඩක් කෙරෙන්නෙ නැහැ කියන එකයි මගේ හැඟීම. ඒවායින් කෙරෙන්නෙ මුද්දර විකිණීමත්, රුපියල් දහයකට වඩා වටිනාකමින් අඩු මනිඕඩර් නිකුත් කිරීම වැනි දේවල් පමණක් බව පෙනී යනවා. විදුලිපත් භාර ගැනීම, ලොකු මනිඕඩර් මාරු කිරීම ආදි කිසිම දෙයක් නොකෙරෙන නිසා ගම්බද ප්‍රදේශවල ජනතාවට කරදර රාශියකට මුහුණ පෑමට සිදු වන බව කියන්න පුළුවනි. මෙය භාර ගත් පසු මෙහි වැදගත්කම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වනු පිණිස එක් කරුණක් මතක් කරන්න කැමතියි. මින් පසු අලුතින් පටන් ගන්න සියලුම උප තැපැල් කන්තෝරු අඩු වශයෙන් "බී" ශ්‍රේණියේ ඒවාවත් විය යුතුය යනු මගේ හැඟීමයි. ඒ වගේම දැනට තිබෙන "සී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාල "බී" ශ්‍රේණියට උසස් කරන අතර දැනට "බී" ශ්‍රේණියේ තිබෙන ඒවා "ඒ" ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කරනවා නම් හොඳයි. මම මේ යෝජනාව ස්ථිර කරමි.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.43

**රාජදුරෙයි මයා.**

*(திரு. இராஜதுரை)*

(Mr. Rajadurai)

கௌரவ அக்கிராசனரவர்களே, கெக்கிராவப் பிரதிநிதி (திரு. எஸ். பி. லேனவ) அவர்களுடைய இப் பிரேரணையை ஆதரித்துப் பேசுவதற்கு நான் முன்வருகின்றேன். உப தபால் நிலையங்கள் தரமுயர்த்தப்படும் முறை மிக மோசமாக இந் நாட்டில் கடைப்பிடிக்கப் பட்டு வருகிறது. உப தபால் நிலையங்களின் வருமானம் போதவில்லை என்ற காரணத்தால் உப தபால் நிலையங்களின் தரத்தை உயர்த்த முடியாது என்று தபால் பகுதியினர் பல காலமாகப் பெருத்த முட்டுக்கட்டை போட்டுக்கொண்டு வருகிறார்கள். இதன் மூலம் இந்த நாட்டில் வாழும் இலட்சக் கணக்கான கிராம மக்கள் தபால் வசதி பெற முடியாத நிலையில் இருக்கிறார்கள்.

இது ஒரு பொதுப் பிரேரணை என்ற காரணத்தினால், என்னுடைய தொகுதியைப் பற்றியும் ஓரிரு உதாரணங்களைக் கூற விரும்புகிறேன். மண்முனை மேற்கு காரியாதிகாரி பிரிவில் ஏராளமான கடிதங்கள் உரிய காலத்தில் பட்டுவாடா செய்யப்படுவதில்லை. தொழில் இலாகாவால் வேலைக்கு வருமாறு அழைக்கப்படுகிறவர்களுக்கு வரும் கடிதங்கள் உரிய காலத்தில் பட்டுவாடா செய்யப்படுவதில்லை. அங்குள்ள பிரதான ஆஸ்பத்திரியில் நோயாளர்கள் இறந்துவிடும் சந்தர்ப்பங்களில், இறந்த நோயாளர்களின் இனத்தவர்களுக்கு அனுப்பப்படும் தந்திகள்கூட உரிய காலத்தில் பட்டுவாடா செய்யப்படுவதில்லை. இதற்கெல்லாம் கூறப்படும் காரணம் உப தபால் நிலையங்களைத் தரமுயர்த்த வருமானம் போதவில்லை என்பதுதான். இந்தக் காரணத்தை வைத்துக்கொண்டு இந்த நாட்டில் குடியியல் உரிமைகளை அனுபவிக்க வேண்டிய மக்களுக்கு இச்சிறு வசதியைக் கூடச் செய்து கொடுக்காமல் விடுவது தவறாகும்.

உப தபால் நிலையங்கள் தரமுயர்த்தப் படாத காரணத்தினால் கிராமப்புறங்களில் பெருந்தொகையான மக்கள் சொல்லொணாத் துன்பங்களை அனுபவித்துக் கொண்டிருக்கிறார்கள். கௌரவ கெக்கிராவப் பிரதிநிதியுடைய பிரேரணையை அரசாங்கம் தனிப்பட்ட ஒருவரது பிரேரணையென்று கருதாமல், எல்லாத் தொகுதிகளுக்கும் பொதுவான பிரேரணை எனக் கருத வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன். உப தபால் நிலையங்கள் தரமுயர்த்தப்பட்டால்தான் கிராம மக்கள் தங்களுக்கு அனுப்பப்படும் கடிதங்களையும் தந்திகளையும் உரிய காலத்தில் பெறக்கூடிய நிலை ஏற்படும். கடந்த பல ஆண்டுகளாக நடைமுறையில் இருந்துவரும் உப தபால் நிலையங்களைத் தரமுயர்த்தும் கொள்கையில் மாற்றங்களைக் கொண்டு வந்து கிராமப்புறங்களிலிருந்து மற்றவர்களுக்கும், மற்ற இடங்களில் இருந்து கிராமப்புறங்களுக்கும் அனுப்பப்படும் தபால், தந்தி, மணியோடர் முதலியவற்றை அவரவர்கள் உரிய காலங்களில் பெறக்கூடிய வசதியைச் செய்ய வேண்டும். எனவே, உப தபால் நிலையங்களைத் தரம் உயர்த்தும் நடவடிக்கைகளில் புதிய மாற்றங்களைக் கொண்டுவர வேண்டும் என்று கேட்டு, கௌரவ கெக்கிராவப் பிரதிநிதியுடைய பிரேரணையை ஆதரிக்கிறேன்.

අ. භා. 4.46

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)

*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)*

(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තැපැල් කාර්යාල උසස් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව ගැන මාත් වචන කීපයක් කථා කරන්නට අදහස් කරනවා. බණ්ඩාරවෙල පිහිටි උප තැපැල් කාර්යාලවලින් සේවයක් සිදු වෙතත් ඒ සමහර තැපැල් කාර්යාල "සී" ශ්‍රේණියේ ඒවා නිසා මුදල් තැන්පත් කිරීම මුදල් ආපසු ලබා ගැනීම ආදී කටයුතුවලට එන මහජනයාට ලොකු කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. "සී" ශ්‍රේණියේ තැපැල් කාර්යාලයකින් ලබා ගන්නට පුළුවන් වන්නේ රුපියල් 10 ක මුදලක් පමණයි. "බී" ශ්‍රේණියේ තැපැල් කාර්යාලයකින් නම් රුපියල් 150ක් ලබා ගන්නට පුළුවනි. මේ රටේ තිබෙන "සී" ශ්‍රේණියේ තැපැල් කාර්යාල පුළුවන් තරම් ඉක්මනින් "බී" ශ්‍රේණියට උසස් කරන ලෙස ඉල්ලන අතරම එය ගම්බද ප්‍රදේශවල මහජනයාට කරන ලොකු සේවයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අප්පුහාමි මයා.]

හැටියටද සඳහන් කරන්නට පුළුවනි. “ සී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාල වැඩි වශයෙන් තිබෙන්නේ ගම්බද ප්‍රදේශවලයි. සමහර “ සී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාලවල හොඳට ආදායම ඇතත් ඒවා “ බී ” ශ්‍රේණියට උසස් කර නැහැ. බණ්ඩාරවෙල කොට්ඨාශයේ “ සී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාල කීපයක්ම තිබෙනවා. ඒවා “ බී ” ශ්‍රේණියට උසස් කිරීමට තරම් සුදුසුකම් ලබා තිබෙද්දීත් එසේ කර නැහැ. “ සී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාල “ බී ” ශ්‍රේණියට උසස් කර පුළුවන් තරම් ඉක්මනින් මුදල් තැන්පත් කිරීම මුදල් මාරු කර ගැනීම වැනි කටයුතු සඳහා වැඩි වැඩියෙන් මහජනයාට පහසුකම් සලසන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අතරම දැනට “ බී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාලද “ ඒ ” ශ්‍රේණියට උසස් කළ යුතු බවත් එසේ කිරීමෙන්ද මහජනයාට ලොකු සේවයක් සිදු වන බවත් මතක් කරන්නට කැමතියි. “ සී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාල “ බී ” ශ්‍රේණියට උසස් කරන අතරම “ බී ” ශ්‍රේණියේ තැපැල් කාර්යාල “ ඒ ” ශ්‍රේණියට උසස් කළ යුතුයි. දුරකථන පහසුකම් තිබෙන්නේ “ බී ” ශ්‍රේණියේ සමහර තැපැල් කාර්යාලවල පමණයි. මේ නිසා “ බී ” ශ්‍රේණියට උසස් වීම් ලැබ ඇති සමහර තැපැල් කාර්යාලවලට ආදායම් ලැබෙන මාර්ගයක් නැතිව ගොස් තිබෙනවා. ඒ අතර ඒ තැපැල් කන්තෝරු පිහිටි ප්‍රදේශවල ජනතාවට ලොකු පහසුවක්ද නැති වී ගොස් තිබෙනවා. මෙම අඩුපාඩුවද වහා සපුරලිය යුතුයි. අවසාන වශයෙන් කැකිරාවේ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. ලේනව මයා.) විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගම්බද ප්‍රදේශවලට බලපාන වැදගත් යෝජනාවක් හෙයින් එය අනුමත කරන බව ප්‍රකාශ කරමින් එය ඉක්මනින් ක්‍රියාවේ යොදවන ලෙස රජයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 4.49

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்க)*
(Mr. Leelaratne Wijesinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උප තැපැල් කාර්යාලවල ශ්‍රේණිය උසස් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මාත් වචන සවල්පයක් කථා කරන්නට කැමතියි. රජරට ප්‍රදේශය දැනට අවුරුදු විසිපහක තිහක සිට දියුණු වෙමින් එනවා. නොයෙකුත් තැන්වල තැපැල් කාර්යාල පිහිටුවා තිබෙන බවත් ඇත්තයි. මේ තැපැල් කාර්යාලවල ශ්‍රේණිය උසස් කළත් ඒවායින් ලැබෙන සේවයේ වෙනසක් නැත්නම් එම උසස් කිරීමෙන් වැඩක් නැහැ. ශ්‍රේණිය උසස් වන විට ඒවායින් ලැබෙන පහසුකම්ද වැඩි විය යුතුයි· පොළොන්නරුව ප්‍රදේශයේ තැපැල් කන්තෝරු ගණනාවක් පිහිටුවා ඇතත් ඒවා බොහොමයක් නොතකා හැර දමා තිබෙන නිසා සැතපුම් විසිපහක් තිහක් මග ගෙවා සමහර ජනපදවාසීන්ට තැපැල් කාර්යාලයකින් කරවා ගත යුතු යම් යම් වැඩ කරවා ගැනීම සඳහා පොළොන්නරුවට එන්නට සිදු වී තිබෙනවා. විදුලි පණිවුඩ පහසුකම් සැලසීම ජනපදවාසීන්ට විශේෂයෙන්ම බලපාන බව කියන්නට කැමතියි. ලංකාවේ නොයෙකුත් ප්‍රදේශවලින් ගිය අයයි, ඒ ජනපදවල පදිංචි වී සිටින්නේ. ඒ අයට දුර බැහැර සිටින තමන්ගේ නෑදෑයන් විසින් මරණයක් හෝ වෙන යම් හදිසි කරුණක් සම්බන්ධයෙන් එවනු ලබන විදුලි පණිවුඩ ලැබෙන්නට දවස් තුනක් විතර ගත වෙනවා. විදුලි පණිවුඩ ලැබෙන්නෙත් ලියුම් ලැබෙන වේගයෙන්මයි. ළඟදී අම්බලන්ගොඩ මාදම්පෙ කෙනකුගෙ පියා අන්තරා වී, ඒ පිළිබඳ විදුලි පණිවුඩය ලැබී යන විට මිනිය භූමදාන කර දවස් දෙකක් පසු වී තිබුණා. මටත් මේ ගැන දැනුම් දුන්න. මා කීව “ මා මොනව කරන්නද, මෙන්න මේ විධියෙ කටයුතු ආණ්ඩුවෙන් සිද්ධ වන නිසා නියම විධියෙ විදුලි පණිවුඩ පහසුකම් තැපැල් කන්තෝරුවලට නොලැබෙන නිසා ඉතාමත් කණගාටුදායක තත්ත්වයක් උදා වී තිබෙනව, පුළුවන් විධියකින් අපි මේ ගැන මොනව හරි කරමු ” කියා.

පොළොන්නරුව, පැල්පගම, පලුගස් දමණ කාලිංග-ඇල, කෝනගම, වැලිකන්ද ආදි ප්‍රදේශවල තැපැල් කන්තෝරු ගණනාවක් අවුරුදු 15 ක් තිස්සෙ විදුලි පණිවුඩ පහසුකම් ඉල්ලා සිටියත්, තාමත් ලබා දී නැහැ. ඒ නිසා කැකිරාවෙ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. ලේනව මයා.) මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන දියුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන රජ රට වාසීන් වෙනුවෙන් ස්තුති වන්ත වන අතරම, ඒ ප්‍රදේශයේ තැපැල් කන්තෝරුවලට විදුලි පණිවුඩ පහසුකම් ලබාදෙන හැටියට ඉල්ලා සිටිනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි; කවුවන් විල, කන්දගොඩැල්ල, පඹුරාණේ, සුංගවිල ආදි ප්‍රදේශවල ජනපදවාසීන් වන, නමුන් නාන්සෙගෙ හිතවත් දුප්පත් අහිංසක මුස්ලිම්වරුන් අද ඉතාමත් කාලකන්නි විධියට කැලෑවල ජීවත් වෙනව. ඔවුන්ට තැපැල් පහසුකම් තබා කිසිම විධියක පහසුකමක් ලබාදී නැහැ. ඒ මිනිසුන් කැලෑවලට දමා ජීවත් කරවීමටයි, ලෑස්ති වී තිබෙන්නෙ. අපේ ලංකාවට මෙය නින්දාවක්. මේ දියුණු වන ලෝකයේ පුංචි ලංකාව ඇතුළේ දවසින් දවස මේ විධියට තැපැල් පහසුකම් එක පැත්තකට පමණක් යවනවා නම්, නගර වාසීන්ට පමණක් ඒවා සීමා කරනවා නම් ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුව රැස් වී යෝජනා සම්මත කිරීමෙන් වැඩක් වේ යැයි, මේ ගරු සභාවට නම්බුවක් වේ යැයි මා නම් හිතන්නෙ නැහැ.

පසුගිය පළමු වන දා පොළොන්නරුවේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාව රැස් වුණා. මම ඒ කාරක සභාවෙ සභාපති තුමාට විදුලි පණිවුඩයක් මඟින් දන්වා යැව්ව, "මේ කාර්යාලවලට තැපැල් පහසු කම් ලබා නොදුන් නිසා මේ සභා රැස් වීමට එන්නට මා කැමති නැහැ, මා එය වර්ජනය කරනවා" කියා. ඇත්ත වශ යෙන්ම මගේ බලවත් කණගාටුව පළ කරන අතර මේ යෝජනාව ඉතා ඉක්ම ණින් ක්‍රියාත්මක කරන හැටියට මේ ගරු සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනව. නමුන්නාන්සෙට ස්තුතියි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*



## කම්කරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

## *தொழிற் சட்டங்களைத் திருத்துதல்*

## REVISION OF LABOUR LEGISLATION

අ. භා. 4.54

**කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)

(*திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி*)

(Mr. K. P. Ratnam—Kilinochchi)

கௌரவ அக்கிராசனர் அவர்களே, பின்வரும் பிரேரணையை நான் மகிழ்ச்சியுடன் பிரேரிக்கிறேன் :

" தோட்டத் தொழிலாளர்களுட்பட சகல தரங்களையும் சேர்ந்த தொழிலாளர்களினதும் உரிமைகளைப் பாதுகாக்கும் நோக்கமாகவும் எல்லா விதமான கைத் தொழிற் பிணக்குகளையும் விரைவாகத் தீர்த்துவைக்கும் பொருட்டு சக்திமிக்க அமைப்பொன்றினை நிறுவும் நோக்கமாகவும் காலத்திற் கொவ்வாதனவும் பழமை வாய்ந்தனவுமான இந்நாட்டின் தொழிற் சட்டங்களைத் திருத்தியமைப்பதற்கு உடனடியாய் நடவடிக்கைகள் எடுக்கப்படவேண்டுமென இச்சபை கருதுகிறது. "

தொழிற் சங்கங்களில் ஈடுபட்ட கௌரவ உறுப்பினர்களுக்குத் தொழிலாளர்கள் படும் கஷ்டங்கள் நன்கு தெரியும். இங்கு பல தொழிற் சங்கத் தலைவர்கள் இருக்கிறார்கள். அவர்களுக்கு நான் இந்தக் காலத்தில் தொழி லாளிகள் அனுபவிக்கும் இன்னல்களை விரி வான முறையில் எடுத்துரைக்க வேண்டிய அவசியமில்லை. [இடையீடு] ஒரேயொருவர் மாத்திரம் இப்போது இங்கு இருக்கின்றார் என்று கௌரவ நல்லூர்ப் பிரதிநிதி (வைத் திய கலாநிதி ஈ. எம். வீ. நாகநாதன்) சொல் கின்றார். இப் பிரேரணை விவாதிக்கப்படும் பொழுது ஏனைய தொழிற் சங்கத் தலைவர்கள் இங்கு இல்லாதிருப்பது துக்கப்படத் தக்க தாகும்.

நான் இங்கு சிறப்பாகத் தோட்டத் தொழி லாளர்கள் என்று குறிப்பிட்டிருக்கிறேன். தோட்டத் தொழிலாளர்களின் நலன்களைப் பாதுகாக்கத் தக்கதாக இப்போதிருக்கும் சட்டங்கள் அமையவில்லை. ஒரு தோட்டத் தொழிலாளியை சிறியதொரு குற்றத்தைச் சாட்டி, தோட்ட முதலாளி நினைத்த நேரத் தில் நீக்கிவிடக்கூடிய நிலையில் இந்தக் காலச்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

சட்டங்கள் அமைந்திருக்கின்றன. நான் ஒரு தோட்டத்துக்குச் சென்றபோது, ஒரு சிறிய குற்றம் செய்துவிட்டதாகச் சொல்லி இருபத்து நான்கு மணித்தியாலத்துக்குள் தொழிலாளர்களைத் தோட்டத்திலிருந்தே அப்புறப்படுத்திவிட்ட அளவுக்கு நிலைமை இருந்ததை அறிந்தேன். அவ்வித அதிகாரம் தோட்ட முதலாளிமார்களுக்கு இருக்கின்றது. இந்த இருபதாம் நூற்றுண்டில், சமதர்மம் பேசும் இக் காலத்தில், இலங்கையிலும் ஒரு சமதர்ம ஆட்சி நடக்க வேண்டுமென்று கூறப்படும் இந்தக் காலத்தில், தொழிலாளர்கள் எதேச்சாதிகாரமாக நடத்தப்படுவதை நாம் பொறுக்க முடியாது. எனவே, அவர்களுக்கு நியாயம் கிடைக்கத் தக்கதாகவும் அவர்களின் உரிமைகள் பாதுகாக்கப்படக் கூடியதாகவும் இப்பொழுதுள்ள சட்டங்கள் திருத்தப்படவும் புதிய சட்டங்கள் வகுக்கப்படவும் வேண்டும்.

எனக்குத் தெரியும், தொழிற்சங்கத் தலைவர்களுக்குக் கூடத் தெரியும், ஒரு தொழிலாளி, முதலாளியுடன் பிணக்குண்டு வழக்குக் கொணர்ந்தால் அதற்கு ஒரு முடிவு காண இத் தொழில் நீதிமன்றங்கள் இரண்டு, மூன்று ஆண்டுகள் எடுக்கின்றன. ஓர் ஏழைத் தொழிலாளி இந்தக் கால எல்லைக்குள் எந்த விதமான வருவாயுமின்றி உத்தியோகம் கிடைக்குமோ கிடைக்காதோ, நஷ்ட ஈடு கிடைக்குமோ கிடைக்காதோ என்று கவலையுடன் ஏங்கி, ஏங்கிக் கஷ்டப்படுவதை நாம் காண்கின்றோம். இந்நிலை வருந்தத் தக்கது. இதனை நாம் இவ்விதமே விட்டுவிட்டால் எங்கள் கடமையை நாங்கள் நல்ல முறையிற் செய்யாதவர்களாகிறோம். இந்தச் சபை அவ்வித குறையை நீக்கமுயலவில்லை என்பதையும் அது காட்டுகின்றது.

எனவே, ஒரு தொழிலாளிக்கு இரண்டு மூன்று மாதங்களில் நியாயம் கிடைக்கக் கூடிய முறையிலே இத் தொழில் நீதிமன்றங்கள் அமையவேண்டும். அவை அப்படி இயங்க முடியாவிட்டால் ஒரு சக்தி வாய்ந்த நீதிமன்றத்தை நாம் உருவாக்கவேண்டும். எனக்குத் தெரியும் பல இடங்களில் தொழிலாளர் பலர் வருடக்கணக்காக வருந்திக் கொண்டிருக்கிறார்கள். பல ஆண்டு காலமாக நியாயம் வழங்கப்படாத தொழிலாளிகள் எங்களிடம் வந்து முறையிடுகின்றார்கள். எனவே, அவர்களுக்கு விரைவில் விமோசனம் கிடைக்கக் கூடிய முறையில் நடவடிக்கைகள் எடுக்க வேண்டியது மனிதாபிமானமுள்ள ஒவ்வொருவரதும் கடமையாகும். அத்துடன் தொழிற் சட்டங்களை விரிவாகத் திருத்தியமைத்து தொழிலாளர்களுக்கு உடனுக்குடன் நீதி கிடைக்கக்கூடியதாகவும் அவர்களின் உரிமைகளைப் பாதுகாக்கக்கூடியதாகவும் விரைவிலே நடவடிக்கை எடுக்கப்படவேண்டும்.

**රාජදුරෛයි මයා.**
(திரு. இராஜதுரை)
(Mr. Rajadurai)

கௌரவ அக்கிராசனர் அவர்களே, கிளிநொச்சிப் பிரதிநிதி அவர்களது இந்தப் பிரேரணையை ஆமோதிப்பதில் நான் மகிழ்ச்சியடைகிறேன். தொழிலாளர்களுடைய குறைகளைப் பற்றி இந்தச் சபையிலே பேசுவதற்கு ஏராளமான அரசியற் கட்சிகள் இருந்த போதிலும் உண்மையில் தொழிலாளர்களுடைய குறைகள் உரிய காலத்தில், உரிய நேரத்தில் தீர்க்கப்படுவதாகத் தெரியவில்லை. சிறிய குற்றங்கள்—அவைகள் குற்றங்கள் என்று நினைப்பதற்குக்கூட முடியாதவை—உருவாக்கப்பட்டு, தொழிலாளர்கள் தண்டிக்கப்படும்போது, அவர்கள் தங்கள் முறைப்பாட்டைச் செய்து, தண்டனையிலிருந்து விடுபட முடியாதவாறு இன்றைய சட்டங்கள் அமைந்திருக்கின்றன. குறிப்பாக ஏகாதிபத்திய காலத்தில் கடைப்பிடிக்கப்பட்ட தொழிற் சங்க நீதிகள் இன்றும் அமுலிலிருக்கின்றன என்பது வெளிப்படை.

இந்தச் சட்டங்கள் தொழிலாளர்களுக்குப் போதிய பாதுகாப்பை அளிக்கவில்லை. நிரபராதிகளான தொழிலாளர்கள் கடுமையாகத் தண்டிக்கப்படின் தண்டனையிலிருந்து அவர்களுக்கு இச்சட்டங்கள் விமோசனம் அளிக்கவில்லை. எனவே இச்சட்டங்கள் மாற்றியமைக்கப்படல் வேண்டும் என்று இந்தச் சபையிலே பல தடவைகள் வற்புறுத்தப்பட்ட போதிலும் இவ்விடயத்தில் புரட்சிகரமான மாற்றங்கள் ஏற்படவில்லை.

தொழில் நீதிமன்றங்களுக்குச் செய்யப்படும் முறைப்பாடுகளை விசாரணை செய்யவும் விளங்கவும் தீர்ப்பைப் பெறவும் பல வருடகாலம் செல்கின்றது. இந்த இடைக்காலத்தில் தொழிலாளர் குடும்பங்கள் நடுத்தெருவில் அலையவேண்டிய நிலை ஏற்படுகின்றது. அன்றாடம் உணவுகூட கிடைக்காத நிலையில்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அவர்கள் கஷ்டப்படுகிறுர்கள். இது வேண்டுமென்றே அவர்களுக்கு இழைக்கப்படும் கொடுமையாகும்.

தொழிலாளர்கள், தாம் தண்டிக்கப்பட்ட நிலையைத் தொழில் நீதிமன்றங்களுக்கு கொண்டு செல்லும்பொழுது குறைந்தது 2, 3, 5 மாதங்களுக்குள்ளாக விசாரணை செய்து தீர்ப்பு வழங்க வேண்டியது நீதி மன்றங்களின் கடமையாகும். ஆனல் தொழில் நீதிமன்றங்கள் தொழிலாளர்களை இழுத்தடித்து அவர்களைப் பல வருட காலத்துக்கு அலுக்க வைத்து, அவர்களுடைய குடும்பங்களைப் பட்டினிபோட்டு, வழக்கிலிருந்து தாங்களாகவே வாபஸ் வாங்கிக்கொண்டு ஓடக் கூடிய நிலைக்கு அவர்களைக் கொண்டுவந்து விடுகின்றன.

இந்தப் பிரேரணையைப்பற்றி நான் கூறக் கூடியது என்னவென்ருல், இன்று நடைமுறையில் இருக்கும் சட்டங்களில் மாற்றங்களைக் கொண்டுவந்து தொழிலாளர்களுக்கு உண்மையான பாதுகாப்பு அளிக்கவும், அவர்களுடைய குறைகள் குறைந்த காலத்துக்குள் விசாரிக்கப்பட்டு அவர்களுக்குத் தீர்ப்பு வழங்கத் தக்கதாக இம் மன்றங்களின் சட்டங்களில் மாற்றங்களைக் கொண்டு வரவும் வேண்டும் என்பதுதான். இந்தப் பிரேரணையை நான் ஆதரித்து ஆமோதிக்கின்றேன்.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මන්නාරම-කොළඹ උඩරට, පහතරට බෙදුම් පාර

*மன்னர்—கொழும்பு மலைநாடு—கீழ்நாடு எல்லைப்பாதை*

## MANNAR-COLOMBO UP-COUNTRY AND LOW-COUNTRY BOUNDARY ROAD

අ. භා. 5

**ජේ. එල්. සිරිසේන මයා.** (බිංගිරිය)

*(திரு. ஜே. எல். சிறிசேன—பிங்கிரிய)*

**(Mr. J. L. Sirisena—Bingiriya)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, න්‍යාය පත්‍රයේ මගේ නමින් තිබෙන යෝජනාව මම ඉදිරිපත් කරනව. ඒ මෙසේ යි :

" ඕලන්ද කාලයේ පටන් මන්නාරමේ සිට කොළඹ දක්වා ඇති උඩරට, පහත රට බෙදුම් පාර නොහොත් රට මැද පාර සංවර්ධනය කොට වාහන ගමනාගමනය සඳහා සුදුප තත්ත්වයකට පැමිණ වීමට සැලැස්මක් උඩ ක්‍රියා කිරීමට රජය වහාම පියවර ගත යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙම පාර ඉතාම වැදගත් පාරක්. ඕලන්දක්කාරයින්ගේ කාලයේ සකස් කළ මෙම පාරෙන් ඒ කාලයේ ප්‍රයෝජන ගෙන තිබෙනව. දැනටත් පාර කඩින් කඩ පාවිච්චි වන අතර කඩින් කඩ පාවිච්චි නොකිරීම නිසා කැලෑවට ගිහින් තිබෙනව. විශේෂයෙන්ම පුත්තලමේ සිට කොළඹ එන්ට තිබෙන පාරේ දුදුරු ඔයෙන් මෙහා යම් යම් කොටස් තවමත් බර වාහන යාමට පාවිච්චි වන අතර, නාත්තන්ඩිය ඡන්ද කොට්ඨාශයට අයත් තුත්තිරිපිටිය කියන ප්‍රදේශයේ සමහර ස්ථානවල පාර පෙනෙන්ටවත් නැහැ. ඉන් ඔබ්බට කොච්චිකඩේ ප්‍රදේශයට එන තුරු බොහෝ තැන්වල පාර දකින්ටවත් නැහැ. කොච්චිකඩේ පසු වුණාම මීගමුවට එන තුරු පාරෙ සමහර තැන් දැනටත් පෙනෙන්ට තිබෙනව. මීගමුවෙන් මෙහා කටුනායක, සීදූව, ආදී ප්‍රදේශවල පාර දිගටම දැනටත් පෙනෙන්ට තිබෙනවා. රට මැද පාර කියන මේ පාර අවසාන වෙන්නෙ කොළඹ " බේස් ලයින් " පාර කියන පාරට සම්බන්ධ වීමෙන්. මෙම පාර සංවර්ධනය කර යථා තත්ත්වයට පත් කිරීම මොන රජයකට වුණත් අවුරුදු දෙක තුනකින්, නැත්නම් අවුරුදු හතරකින් පහකින් කරන්ට පුළුවන් යයි මා හිතන්නෙ නැහැ. මේ පාර දියුණු කරන්ට වැඩ පටන් අරගෙන අවුරුදු 10 ක් 15 ක් ගත වන්ට පුළුවනි, පාරේ සංවර්ධන කටයුතු නිමාවට පත් කරන්න. ඒ නිසයි මම මගේ යෝජනාවේ සඳහන් කළේ සැලැස්මක් අනුව මේ පාර දියුණු කිරීමට දැන් සිටම පියවරක් ගන්න කියා.

උඩරට පහතරට බෙදුම් පාර යයි මේකට නම් කර තිබෙන්නෙ ඕලන්දක්කාරයින් විසින් උඩ රට පහත රට වෙන් කරන මායිම වශයෙන් මේ පාර සලකනු ලැබූ නිසයි. මේ පාරත් සමග මේ පාරට ඉතා කිට්ටුවෙන් ඕලන්දක්කාරයින් විසින් කපන ලද ඇළක් ද තිබෙනව. ඒ ඇළත් කොළඹ සිට පුත්තලමට කෙළින්ම වැටී තිබෙනව. මෑතක් වන තුරුම මේ ඇළේ පාරු මගින් බඩු එහා මෙහා ගෙන යාම සිදු වුණා. එහෙත් දැන් නම් බොහොම කලාතුරකින් තමයි, මේ ඇළ ඔස්සේ බඩු පටවාගෙන යන පාරුවක් දකින්නට ලැබෙන්නෙ. ඇළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මයා.]

පාවිච්චියට ගැනීම අඩු වීමත් සමගම දැනට තිබෙන කොළඹ-පුත්තලම පාරේ වාහන ධාවනය බොහෝ සෙයින්ම වැඩිවී තිබෙනව. මෙම පාරේ දැනට ධාවනය කරන වාහන ප්‍රමාණය දෙස බැලුවාම, ඒ සඳහා පාර ප්‍රමාණවත් නොවන බව කියන්ට පුළුවනි. තව අවුරුදු කීපයකින් තත්ත්වය මීටත් වඩා උග්‍ර වන්ට ඉඩ තිබෙනව. එම නිසා මේ උඩරට පහත රට බෙදුම් පාර සංවර්ධනය කළොත් දැනට කොළඹ-පුත්තලම පාරේ පවතින වාහන තදබදය මග හැරෙනවා පමණක් නොව, ඒ අවට ප්‍රදේශත් ඉතා ඉක්මණින් දියුණු තත්ත්වයකට පත් කරන්ට පුළුවන්කම ලැබෙනව.

මෙම පාර සෑදීමේදී දඳුරුඔය හරහා පාලම් ගණනාවක් දමන්නට සිදු වෙනව. මෙම පාරට ඔයවල් කීපයක්ම අහුවෙනව. කොච්චිකඩෙත් පාලමක් තනන්නට වෙනව. ඒ නිසා මෙ පාර සංවර්ධනයට විශාල මුදලක් වියදම් කිරීමට සිදු වෙනව. මේ සම්බන්ධව රජය යම් පියවරක් ගන්නවා නම් අවුරුදු පතා යම් මුදල් ප්‍රමාණයක් නොකඩවාම වෙන්කර පාර සංවර්ධනයට සූදානම් වුණොත් අවුරුදු 10කින් පමණ මන්නාරමේ සිට කොළඹට මේ පාර සංවර්ධනය කරන්නට පුළුවන් වෙනවා ඇති. විශේෂයෙන්ම පුත්තලමේ සිමෙන්ති කම්හලක් ආරම්භ කර වැඩ කරගෙන යන නිසාත්, අනික් පැත්තෙන් වන්නතිවිල්ලු ආදී ප්‍රදේශවල පොල් ආදී වගාවන් කර ගෙන යන නිසාත් මෙවැනි පාරක් පටන්ගෙන දියුණු කිරීම අත්‍යවශ්‍ය වෙනවා ඇති. ඒ පළාත්වල වාසයට යන ජනතාවගේ ප්‍රයෝජනය හා එම ඉඩම්වල නිපදවන නිෂ්පාදන නගරයට ගෙන ඒම සඳහාත් මෙවැනි පාරක් අවශ්‍ය වෙනව. ඒ නිසා මෙම පාරේ අවශ්‍යතාව ගැන ඒතරම් දුරට කරුණු ඉදිරිපත් කිරීමට වුවමනාවක් නැහැ. මේ පාර දියුණු කළොත් මා සඳහන් කළ විධියේ ප්‍රයෝජන රාශියක් ඇති වෙනව. මෙය ඒ ප්‍රදේශයට හෝ එක ඡන්ද කොට්ඨාශයකට පමණක් සීමාවන එකක් නොවෙයි. මන්නාරමේ සිට කොළඹට කියන විට විශාල ප්‍රදේශයක් අයිති වෙනව. ඒ අනුව මෙය මුළු මහත් රටටම ප්‍රයෝජනයක් වන නිසා මා මෙම යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

විසින් ස්ථිර කරන ලදී.
*ஆமோதித்தார்.*
*Seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මාතර තොටමුනේ ගල්පරය ඉවත් කිරීම
### *மாத்தறை தொட்டமுனேயிலுள்ள கற்பாறை களை அகற்றுதல்*
### REMOVAL OF THE REEF AT MATARA TOTAMUNE

අ. භා. 5.6

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව මේ ගරු සභාව ඉදිරියේ තබන්නට අවසථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. යෝජනාව මේකයි:

"මාතර තොටමුණේ ධීවර කාර්මිකයන්ගේ යාන්ත්‍රික බෝට්ටු නිල්වලා ගංමෝයෙන් මුහුදට ඇතුළු කිරීමේදී මුහුදු වෙරළේ ඇති ගල්පරයේ හැපී සිදුවන අලාභ හානි වළක්වා, ධීවර කර්මාන්තයට අනදීමක් වශයෙන් එම ගල්පරය ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙම යෝජනාව මා සභාව ඉදිරියේ තබනව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාතර තොටමුන ධීවර කාර්මිකයින්ගේ ප්‍රදේශයක්. තොටමුනේ ඇති මේ ගල්පරය ධීවර කාර්මිකයින්ට විශාල අමාරුවකට හා කරදරයකට හේතු වී තිබෙනව. නිල්වලා ගං මෝයේ නවත්වා තිබෙන ධීවර බෝට්ටු මුහුදට ගැනීමේදී ඒවා මෙම ගල්පරයේ හැපීම නිසා එම බෝට්ටුවලට බොහෝ සෙයින් අලාභහානි සිදු වෙනව. ඒ නිසා මාළු ඇල්ලීමට ගත කරන කාලයට වැඩි කාලයක් බෝට්ටු අලුත්වැඩියා කිරීම සඳහා ගත කිරීමට ඔවුන්ට සිදු වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයක් තිස්සේ ඒ ප්‍රදේශයේ වසන ධීවර කාර්මිකයින්ගේ උද්ඝෝෂණය වී තිබෙන්නේ ඔවුන්ට කරන ලොකුම සේවය නම් එම ගල්පරය ඉවත් කිරීමයි කියන එකයි. එමෙන්ම එය සුළු වියදමකින් කරන්නට පුළුවන් දෙයක්. එම ගල්පරය ඉවත් කළොත් ගං මෝයේ නවත්වා තිබෙන ධීවර බෝට්ටු මුහුදට ගෙනයෑමට අපහසුකම් ඇතිවන්නේ නැහැ. මෙම යාන්ත්‍රික බෝට්ටු තුවාල වී අලුත්වැඩියා කරන්නට සිදු වුණොත්, අමතර කොටස් ලබාගැනීමේ අපහසුව නිසා බලවත් අමාරුවකට පත්වන්නට සිදු වෙනව. මේ කාලයේ හැටියට ඒවා ලබාගැනීමට කළුකඩයේ පිහිට සෙවීමට ඔවුන්ට සිදු වෙනව. ඒ නිසා ඒ පළාතේ ධීවර කාර්මිකයින් වෙනුවෙන් කරන්නට තිබෙන ඉතාම ලොකුම සේවය මේ ගල්පරය ඉවත් කිරීම බව ගරු ධීවර ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. ගරු ඇමතිතුමා මේ ගැන කල්පනා කර බලනවා නම් මෙය ඉතාම සුළු කාලයකින් අඩු වියදමකින් කරන්නට පුළුවන් දෙයක් බව පෙන්වා දෙන්නට ඕනෑ. අඩි 30 ක් පමණ පළලට මෙම ගල්පරය කඩා දමනව නම් එමගින් බෝට්ටු ආදිය මුහුදට ඇතුළු කර ගෙන ගොස් දුප්පත් ධීවර කාර්මිකයන්ට තමන්ගෙ රැකියාව කරගන්ට නිසියාකාර ඉඩ සැලසෙනව. එමගින් පොදු ජනතාවටත් පෝෂ්‍යදායී ආහාරයක් සපයන්ට හැකි වෙනව.

මා වැඩිය කතා කරන්ට අදහස් කරන්නෙ නැහැ. ගරු ඇමතිතුමාගෙ කාරුණික අවධානයට මෙම කාරණය යොමු කරවමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

**විසින් ස්ථිර කරන ලදී.**

*ஆமோதித்தார்.*

*Seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question proposed.*

අ. භා. 5.12

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

I would like to read a statement of the department's views on this matter.

මේ ගල්පර ඉවත් කිරීම පිළිබඳ විමර්ශන පළමු වරට 1956 දී ඉටු කරන ලදී. ඒ අවස්ථාවේදී මෙවැනිම ඉල්ලීම් ගණනාවක් පිළිබඳව විමර්ශන පවත්වමින් සිටි වරාය කොමසාරිස්ගෙන්, මාතර තොටමුනේ ගල්පර ඉවත් කිරීම ඔහුගේ ප්‍රමුඛත්ව ලැයිස්තුවෙහි අන්තර්ගත කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීය.

1961 පෙබරවාරි මාසයේදී මේ කරුණ ඔහුගේ සැලකිල්ලට නැවතත් යොමු කරවා, බාධා රහිත යාත්‍රා මාර්ගයක් ඇති කිරීම පිණිස මුහුදේ ගල්පර ඉවත් කිරීමේ හැකියාව පිළිබඳව විමර්ශන පවත්වන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටින තුරු ඔහු ඒ පිළිබඳව කිසිවක් නොකොට තිබිණ. එම මුදල් වර්ෂය තුළ කිසිම කටයුත්තක් කිරීමට නොහැකි බැව් ඔහු දැන්වීය. එසේ වුවද, 1961 දෙසැම්බර් මාසයේ දී විමර්ශනයක් පැවැත්වූ අතර 1962-63 මුදල් වර්ෂය තුළ කිසිම දෙයක් කිරීමට නොහැකි බැව් නැවතත් දන්වන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් මත, මෙම දෙපාර්තමේන්තුවෙන් සැපයෙන අරමුදලින් මේ අන්දමේ කටයුතු ඉටු කිරීමට වරාය කොමසාරිස් (වරාය ඉංජිනේරු මගින්) එකඟ වූයේ නමුත්, කාර්ය මණ්ඩලයේ සහ උපකරණවල ඌනතාව නිසා තවත් දුරට එම කටයුතු කිරීමට නොහැකි බැව් ඔහු මෑතකදී දැන්වීය.

වරාය කොමසාරිස්ගේ දළ ඇස්තමේන්තු අනුව වැඩය නිම කිරීම සඳහා දළ වශයෙන් රු. 100,000ක මුදලක් අවශ්‍ය විය. දෙපාර්තමේන්තු සම්මත වැය 6, උප ශීර්ෂ 10, යටතේ 1963-64 මුදල් ප්‍රතිපාදනය, උප ශීර්ෂයේ අන්තර්ගත වැඩ සියල්ලම සඳහා රු. 40,000 ක් පමණක් වූයේය.

මුහුදේ ගල් හෝ ගල්පර හෝ ඉවත් කිරීමට පෙර අනුගමනය කළ යුතු සාමාන්‍ය ක්‍රියා පිළිවෙළ වූකලී වරාය ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වෙරළාරක්ෂක ශාඛාවේ අනුමැතිය ලබා ගැනීමයි. වෙරළ සේදී යාම පිළිබඳ විෂය, ඉහතදී ප්‍රසිද්ධ වැඩ පිළිබඳ අමාත්‍යාංශයට සහ පළාත් පාලන අමාත්‍යාංශයට භාර දී තිබී වරාය කොමිෂන් සභාවට පවරා ඇත්තේ මෑතකදීය.

That is the position, Sir. The latest report we have received from the department is that the removal of the rocks and reefs at Matara Totamune will be most useful but a careful study is necessary so as to make certain that the removal of these rocks and reefs does not aggravate coastal

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

erosion. Mechnized boats operating from the Matara area will be able to find safe anchorage within the river provided arrangements are also made to keep the mouth of the river open. This combined study may take some time, and in view of the reluctance of the Port Commissioner to undertake works of this nature for the department, it is suggested that a request be made to the Ministry of Nationalized Services to undertake this work and other similar works required for the fishing industry. If the cost of investigations is to be met from Fisheries Department funds, provision in the Fisheries Department estimates would also have to be increased proportionately. In the alternative, the Fisheries Corporation can be asked to carry out this investigation since other areas similar to Matara Totamune are being studied by the corporation. The provision of Rs. 2,500,000 in the 1965-66 estimates of the department for investigation and construction of anchorage has now been transferred to the corporation.

That is the position. We do not want to undertake this work without investigating further because the removal of the rocks and reefs may bring about other complications.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## සමහර විශ්‍රාමිකයන් ආදායම් බද්දෙන් නිදහස් කිරීම

## இளைப்பாற்றுச் சம்பளம் பெறுவோர் சிலரை வருமான வரியிலிருந்து விலக்குதல்

## EXEMPTION OF CERTAIN PENSIONERS FROM INCOME TAX

අ. භා. 5.16

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි)
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Uduppiddi)

The next Motion stands in the name of the hon. Appointed Member (Sir Razik Fareed). Under Standing Order No. 39 (2), I have been authorized by him to move this Motion and I take pleasure in doing so. I move,

"That this House is of opinion that the pensioners who draw under Rs. 300 on an aggregate per mensem should not be considered for purpose of Income Tax."

It is not necessary for me to make a very long speech on this matter as hon. Members of the House are only too well aware that the pension granted to public servants is an amount that they themselves have been contributing towards the Pension Fund over a large number of years—25 to 30 years—out of the salary they have been paid. A small portion of their salary accumulates to their account and ultimately it is paid to them as pension when they retire at the age of 60 or so. Therefore, it is rather hard on them that after they have retired they should be asked to pay something out of that as income tax. I have, therefore, pleasure in moving the Motion standing in the name of the hon. Appointed Member.

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

In supporting what I believe is the intention of the hon. Mover of this Motion, I must confess that, though I support it, I anticipate certain difficulties in regard to implementation for the reason that what is contemplated in this Motion is the exemption of the pensioner from tax and not the exemption of the pension.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The difficulty is one of formulation, I trust you will appreciate the difficulty there is for the reason that though the pensioner draws Rs. 300 as pension he may have a considerable income from other sources, in which event it is not proposed, I believe, that he should not pay income tax or that he should be exempted from paying income tax because he happens to be a pensioner. That, I believe, is not your intention or the intention of the hon. Mover of the Motion. Therefore, there is a little difficulty in formulation.

But I take it for granted that the intention is that where the pension is the sole income of the pensioner, and that pension is less than Rs. 300 per month, it should be exempt from tax. Understanding the Motion in that light, I have great pleasure in supporting it.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**

*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*

(Mr. Deputy Chairman of Committees)

Motion No. 61.

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)

*(ஜனுப் எம். அப்துல் பாக்கீர் மாக்கார்—வேருவலை)*

(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

Sir, there is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබුයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறை வெண் இருந்ததனல்—

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

## ලංකාවේ වරලත් තක්සේරු කරුවන්ගේ ආයතනයක් පිහිටුවීම

## இலங்கையில் தத்துவம் பெற்ற மதிப்பீட்டாளர் நிலைய மொன்றினை நிறுவுதல்

## ESTABLISHMENT OF AN INSTITUTE OF CHARTERED VALUERS OF CEYLON

අ. භා. 5.20

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

I move,

"That this House is of opinion that necessary steps should be taken without delay for the establishment of an Institute of Chartered Valuers of Ceylon."

I had originally intended to place before this honourable House a series of facts in regard to this matter which, I think, are not generally known. However, since it is the desire of the House, I gather, to finish as large a number of these Private Members' Motions as possible today, I shall be very brief.

The present position regarding valuers is the very meagre provision that is made in the Land Acquisition Act. In the Land Acquisition Act there is Section 56 which reads as follows:

"56. (1) After such date as may be appointed by the Minister by notice published in the Gazette, the opinion, regarding the value of any land which is to be acquired under this Act, of any person other than a person who is or is deemed to be a registered valuer, shall not, at any proceedings before the board, be regarded as the opinion of an expert.

(2) For the purposes of sub-section (1), every valuer of the Valuation Department of the Government shall be deemed to be a registered valuer.

(3) In this section, "registered valuer" means a valuer registered in accordance with such regulations as may be made under section 63 for the registration of valuers."

And Section 63 says that among other things the Minister may make regulations for the purpose of (*g*), that is, for the registration of valuers. Now, this is all that is there. All these years this Section of the Land Acquisition Act has remained in abeyance.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

There has been no attempt at setting up a proper body for the purpose of examining the qualifications, prescribing courses of study, and registration of valuers. There are registered valuers in accordance with the regulations, but for the purposes of such registration, to ensure that a valuer is trained, that he is given a certificate on the basis of proper standards, there is no organization set up.

Sir, this is a very sad state of affaris, and I think all hon. Members of this House who realize the plight of people who have to sell land or have to acquire any property or have to make a declaration before the Commissioner of Income Tax in regard to value, will sympathize with my desire to see that a proper organization is set up in order to ensure that proper standards and proper systems of training are established in this country.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)
(டாக்டர் ஈ. எம். வீ. நாகநாதன்—நல்லூர்)
(Dr. E. M. V. Naganathan—Nallur)

An independent body.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்஬ா)
(Mr. Bernard Soysa)

An institute like the Institute of Chartered Accountants of Ceylon.

Every enligtened country has some kind of organization for this purpose. Great Britain, whose pattern we follow in most things yet, has an institute of surveyors and valuers. I have decided to separate the surveyors out because I think it is desirable that they should have a separate institute of their own.

Valuation in this country is rapidly developing into something which does not affect land alone, and we come up against this problem of valuation in a number of spheres. The first is in regard to the local government ratings. The Colombo Municipal Council has an assessor's branch which does the assessment of annual values for the purpose of the levying of rates. The other local authorities that do not have the capacity to have an assessor's branch have to go to the Government Valuation Department for the purpose of valuing built-up areas.

Now this is not very satisfactory because you find that a variety of standards operate ranging from the Colombo Municipal area right down to built-up areas, say, in Maharagama or some place like that.

Certain local authorities have recently developed the practice of appointing valuers who have gone through a course at the Ceylon Technical College Department. I do not call it a college any more ; it is called the Technical College Department ; I do not know why, but it is treated as a department. There is a course of training which was begun by the Technical College some years ago. The Chief Government Valuer is an unofficial lecturer at the Technical College. A series of lectures had been arranged in consultation with the Education Department some years ago and that is all the training that is provided. I am aware of the fact that the Chief Government Valuer and, subseqently, officers of the Valuation Department who have acted as lecturers have done a good job. But whether the standards that these students can reach are adequate is a different question altogether.

I am aware of the fact that some local authorities obtain the services of these people for the purpose of assessment for the levy of rates. Some of them are paid so low, the remuneration received by them is so low, that there is a strong temptation to do that which is not right. This is a very strong temptation.

That is why I want to see that pofessional valuing is placed on an honourable basis that it is regarded

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

as a proper profession like Accountancy or Law or any other profession of that kind, and that professional standards operate in this sphere ; and for that purpose that those who seek to become valuers are given the necessary training in all branches of valuing. There should be a body for the purpose of enforcing proper ethical standards in regard to the conduct of valuers.

Then, in regard to municipal ratings, everybody knows that the Municipal Assessor's Branch has a number of very highly qualified persons. The Municipal Assessor himself and his deputy are qualified people. Under them there are a number of persons who do this assessment year after year in order to achieve administratively the quinquennial assessment in Colombo. But the principles of valuation followed by the department are not known—this is a kind of mysterious professional secret—with the result that you find today the annual values shooting up—Goodness knows for what reason! The melancholy situation in Colombo is that the totality of annual values that existed 15 years ago is equal to the total sum of the rates levied in the City of Colombo today. That is what has happened on the consolidated rate of 30 per cent that is levied in Colombo. That is the miserable situation to which the people are reduced. Rent restriction has become completely nullified as a result of the operation of arbitrary standards in valuation.

The second area in which this problem crops up is in regard to assessment for wealth tax and assessment for the payment of death duty There, the Chief Government Valuer is responsible. There is sometimes an advantage in obtaining a lower valuation in the payment of death duties but sometimes it is not so advantageous. Where the property is alienated soon after the payment of death duties a person is called upon to pay a fairly large percentage as a capital gain. Therefore, from that point of view it is desirable to see that an accurate valuation is arrived at. From the point of view of the Minister of Finance, of increasing his revenue, of seeing to it that the Inland Revenue Department functions properly, it is necessary to see that a proper valuation is placed on property both in regard to the payment of death duties as well as in regard to the payment of wealth tax.

The last field in which this matter comes up is in regard to valuation for the purpose of alienation either as a result of government acquisition or as a result of private sale. That is why I say that the provisions of the Land Acquisition Act are insufficient for the purpose, because, property today, with the development of a number of industrial concerns, is no longer land alone. There are industrial establishments that have to be valued ; there are commercial establishments that have to be valued. And a number of these matters come up in relation to the operation of the company law.

Therefore, to treat valuation purely as something incidental to land acquisition by government is no longer a realistic assessment of the problem. That is why I think it is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

necessary that we should have a proper system of valuation in this country and a proper scheme for the training of valuers—training as well as conferment of degrees and certificates—and, last of all, the enforcement of proper ethical standards and professional standards in regard to valuation. I think that, outside the purview of government, with government assistance, just as we set up an Institute of Chartered Accountants in order to remedy the position in regard to Accountancy in this country and the practice of Accountancy as a profession, it is ancillary and very necessary that an independent branch known as Valuation should also be established on the same footing. I think nobody would quarrel with the suggestion that an Institute of Chartered Valuers be created without any further delay. I recommend this Motion to the House.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
**විසින් ස්ථිර කරන ලදී.**
*ஆமோதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මාතර නගරයට පුරහලක්

*மாத்தறை நகரத்துக்கு நகர மண்டபம்*

## Town Hall for Matara Town

අ. භා. 5.33

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, දකුණු පළාතේ දෙවන අගනුවර වන මාතර උගතුන්ගේ නිජ භූමියක් බව, කවියන්ගේ නිජ භූමියක් බව, කලාකාමීන්ගේ නිජ භූමියක් බව තමුන්නාන්සේ දන්නව. එවැනි ප්‍රදේශයක ජනතාවගේ සංස්කෘතික ජීවිතය උසස් කර ගැනීමට පුරහලක් නැත්නම් එය කෙතරම් අඩුපාඩුවක්ද යන්න තමුන්නාන්සේට තේරෙනවා ඇති. ඉතාමත්ම අවශ්‍ය ඒ නගරාංගය සම්පූර්ණ කර ගැනීම සඳහා මම මේ යෝජනාව ඉදිරිපත් කරනව :

"රුහුණේ දෙවන අග නගරය වන මාතරට පුරහලක් නැති කමින් දහස් සංඛ්‍යාත ජනකායකගේ සංස්කෘතික හා සාමාජික කටයුතුවලට අවහිර වන හෙයින් එම නගරයෙහි පුරහලක් තැනවීමට අවශ්‍ය සියළු ආධාරෝපකාර මාතර නගර සභාවට දීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය වහාම ක්‍රියා කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරනාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

**විසින් ස්ථිර කරන ලදී.**
*ஆமோதித்தார்.*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ගුරු වැටුප්

*ஆசிரியர்களின் சம்பளம்*

## Teachers' Salaries

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, ලංකාවට නිදහස ලැබී දීර්ඝ කාලයක් ගත වී තිබුනත් සිංහල භාෂාවෙන් වැඩ කරන උදවියට තවම සාධාරණය ඉෂ්ට වී නැති බව තමුන්නාන්සේ දන්නව. ඉංග්‍රීසි ගුරුවරුන්ට එක වැටුප් ක්‍රමයකුත්, සිංහල ගුරුවරුන්ට වෙනත් වැටුප් ක්‍රමයකුත් තිබෙන බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේ දන්නව. අධිරාජ්‍යවාදි යුගයේදී මේ වගේ තත්ත්වයක් තිබුනට කමක් නැහැ. නමුත් නිදහස් යුගයේ මේ විධියේ තත්ත්වයක් තිබීම සිංහල භාෂාව ටත්, සිංහල උගතාටත් අගෞරවයක්. ඒ නිසා මම මේ යෝජනාව කෙටියෙන් ඉදිරි පත් කරනව :

"භාෂා භේදයෙන් තොරව සියලු ගුරුවරුනට සමාන වැටුප් ගෙවිය යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

අද භාෂා භේදයක් නැති නිසා මේ වැටුප් භේදය තිබීම ඉතාමත් අසාධාරණ බැවින් දූන් මේ ගරු සභාවේ සිටින මේ මුදල් ඇමතිතුමා මේ යෝජනාව පිළිගෙන ක්‍රියාත්මක කරනවා ඇතැයි මම බලා පොරොත්තු වෙනව.

අ. භා. 5.35

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரீ. பி. எம். ஹேரத்—வலப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, මාතර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ඉතා සන්තෝෂයෙන් ස්ථිර කරන අතර ඒ සම්බන්ධව වචන ස්වල්පයක් කථා කිරීමට මම අදහස් කරනව. භාෂා භේදය අනුව ගුරුවරුන්ට වැටුප් ගෙවීමේ ක්‍රමය කාලාන්තරයක් තිස්සේ පැවත එන නමුත් අද භාෂා භේදය බොහෝ අංශවල නැති වී තිබෙනව. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්, පාඨශාලා පරීක්ෂකවරුන්, පළමු වැනි පන්තියේ විද්‍යාලයාධිපතිවරුන්, දෙ වැනි පන්තියේ විද්‍යාලයාධිපතිවරුන්, තුන් වැනි පන්තියේ විද්‍යාලයාධිපති වරුන්, විශේෂ ශ්‍රේණීවල ගුරුවරුන් එසේම ජ්‍යෙෂ්ඨය සමත් ගුරුවරුන් ආදීන් සම්බන්ධයෙන් භාෂා භේදය අනුව වැටුප් ගෙවීමේ ක්‍රමය නැති කරල තියෙනව. ඒ අයට සමාන වැටුප් ගෙවනව. නව මත් භාෂා භේදය අනුව වැටුප් වෙනස පවතින්නේ සිංහල පුහුණු ගුරුවරුන් හා ඉංග්‍රීසි පුහුණු ගුරුවරුන් අතරත් සිංහල අවසාන ගුරු සහතික පත්‍රය දරණ ගුරු වරුන් හා ඉංග්‍රීසි අවසාන ගුරු සහතික පත්‍රය දරණ ගුරුවරුන් අතරත් පමණයි. ඒ නිසා මේ යෝජනාව බොහොම පහසු වෙන් ඉෂ්ට කරන්න පුළුවන්කම තිබෙන බව මම ප්‍රකාශ කරන්න සතුටුයි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා පසුගිය කාලයේ විශේෂ ප්‍රවෘත්ති පත්‍ර නිවේදනයක් නිකුත් කළා, ගුරුවරුන්ගේ වැටුප් සම කරන්නට බලාපොරොත්තු වෙනවාය, ඒ සඳහා කොමිටියක් පත් කරනවය කියා. ඒ කොමිටියට කුමක් වුනා ද, ඒ කොමිටියේ වාර්තාවට කුමක් වුනා ද කියා අපි තවමත් දන්නෙ නැහැ. භාෂා භේදයෙන් තොරව වැටුප් ගෙවිය යුතු බව විල්මට් පෙරේරා කොමිෂන් සභා වෙනුත් නිර්දේශ කර තිබෙනව. සෑම අතින්ම සාධාරණ ඉල්ලීමක් මේ කරන්නෙ. මේ සඳහා විශාල මුදලක් වියදම් වෙන වාය කියන්න පුළුවන්. යුක්තිය ඉෂ්ට කිරීම සඳහා කොයි තරම් මුදල් වියදම් වුනත් යුක්තිය ඉෂ්ට කළ යුතුයි. මේ තරම් වැදගත්කමක් නැති දේවලට අපේ භාණ්ඩාගාරය මුදල් වියදම් කරන අවස්ථා වක ඉංග්‍රීසි පුහුණු ගුරුවරුන් සහ සිංහල පුහුණු ගුරුවරුන් සම්බන්ධයෙනුත්, ඉංග්‍රීසි අවසාන ගුරු සහතික පත්‍රය දරණ ගුරුවරුන් සහ සිංහල අවසාන ගුරු සහතික පත්‍රය දරණ ගුරුවරුන් සම්බන්ධයෙනුත් ඇති වැටුප් පරතරය නැති කර මේ රටේ සිංහල ගුරුවරයාට යුක්තිය ඉෂ්ට කිරීමට රජයේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## තැපැල් මාර්ගික ගුරු පුහුණු ක්‍රමයක්

## ஆசிரியர்களுக்குத் தபால் மூலம் பயிற்சித் திட்டம்

## POSTAL TRAINING SCHEME FOR TEACHERS

අ. භා. 5.38

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ යෝජනාව මෙයයි :

"දැනට සේවයෙහි යෙදී සිටින නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගුරු අභ්‍යාස විදුහල් මගින් ගෙන යන වැඩ පිළිවෙළ ප්‍රමාණවත් නොවන බව පෙනී යන හෙයින්, අමතර පියවරක් වශයෙන් තැපැල් මාර්ගික ගුරු පුහුණු ක්‍රමයක් වහාම ආරම්භ කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

අද අපේ දරුවන්ගේ අධ්‍යාපනය බාරව නුපුහුණු ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් මේ රටේ සිටිනව. මෙවැනි කනගාටුදායක තත්ත්වයක් පවතින්නේ අපේ රටේ පමණයි. ලෝකයේ දියුණු රටවල නුපුහුණු ගුරුවරුන් ගුරු සේවයට බඳවා ගන්නෙ නැහැ. සෝවියට් දේශය වැනි සමාජවාදී රටවල, ගුරුවරුන් වශයෙන් පුහුණුවක් නොලැබූ අයට ගුරු පත්වීම් දෙන්නෙ නැහැ. අභ්‍යාස විද්‍යාලවල ක්‍රමානුකූලව පුහුණුවක් ලැබූ මනෝ විද්‍යාව පිළිබඳව විශෙෂ දැනීමක් ඇති අය පමණයි එවැනි රටවල පාඨශාලාවලට ගුරුවරුන් වශයෙන් බඳවා ගනු ලබන්නෙ. එහෙත් අපේ රටේ මෙපමණ කලක් ගතවීත් නුපුහුණු ගුරුවරුන්ගේ සංඛ්‍යාව අඩු කරන්නට තව මත් පුළුවන් වී නැහැ. එන්න එන්නම නුපුහුණු ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි වේගෙන යද්දී, මේ රජය විසින් ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්නා පිළිවෙළ නිසා දැන් මේ ප්‍රශ්නය තවත් උග්‍ර වී තිබෙනව. එයින් මිදෙන්නට නම් ගුරුවරුන් පුහුණු කිරීම වහාම ආරම්භ කළ යුතුයි. ඒ සඳහා සෑහෙන ගුරු අභ්‍යාස විද්‍යාල පිහිටුවීමට නියම අන්දමේ වැඩ පිළිවෙළක් තවම ඇති කර නැහැ. අපේ රටේ අධ්‍යාපනයට විශාල පහරක් වී තිබෙන මේ නුපුහුණු ගුරු ප්‍රශ්නය විසඳීම සඳහා රජය වහාම පියවර ගත යුතුයි. තැපැල් මාර්ගික ගුරු පුහුණු ක්‍රමයක් ඇති කරන ලෙස මා යෝජනා කරන්නේ ඒ සඳහා නිසි මාධ්‍යයක් වශයෙනුයි.

මහා බ්‍රිතාන්‍යය වැනි රටවල මේ තැපැල් මාර්ගික ගුරු පුහුණු ක්‍රමය ක්‍රියාත්මක කොට සාර්ථක ප්‍රතිඵල ලබා තිබෙන බව ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් අපට දැන ගන්න ලැබී තිබෙනව. අපේ රටෙත් එවැනි ක්‍රියා මාර්ගයකින් නියම ප්‍රතිඵල ලබන්නට බැරිකමක් නැහැ. නුපුහුණු ගුරු වසංගතය සම්පූර්ණයෙන්ම නැති කොට, මේ රටේ අධ්‍යාපනය උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා ගුරුවරුන් අධ්‍යාපනය දීමේ කාර්යය හරියාකාර ඉෂ්ට කළ හැකි තත්ත්වයක සිටිය යුතුයි. නියම විධියට ගුරුවරුන් පුහුණු කිරීම ඊට අවශ්‍ය එකම මාර්ගය බව සලකා මේ යෝජනාව බාර ගන්නා මෙන් මා රජයෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 5.40

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මාතර ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් ඒ සම්බන්ධව වචන කීපයක් කිව යුතුව තිබෙනව. නුපුහුණු ගුරුවරුන්ගේ ප්‍රශ්නය දෙස බලන විට මෙසින් විශාල පාඩුවක් සිදුවී තිබෙන්නෙ සිංහල ශිෂ්‍ය ශිෂ්‍යාවනට බවයි පෙනී යන්නෙ. නුපුහුණු ගුරුවරුන් වැඩි වශයෙන් සිටින්නෙ සිංහල ගුරු ගණයෙයි. දෙමළ භාෂාවෙන් උගන්වන පුහුණු ගුරුවරුන්ගේ සියයට ගණන, සිංහල භාෂාවෙන් උගන්වන පුහුණු ගුරුවරුන්ගේ සියයට ගණනට වඩා හතර ගුණයකින් පමණ වැඩි බව අප දන්නව. ගුරුවරුන් 10 දෙනෙක් සිටින ගම්බද සාමාන්‍ය සිංහල පාසලක පුහුණු ගුරුවරුන් එක්කෙනකුවත් හොයා ගන්න අපහසු තත්ත්වයක් තියෙන්නෙ. පුහුණු ගුරුවරුන් හිඟවීමේ ප්‍රතිඵලය අධ්‍යාපනය පහත් තත්ත්වයකට වැටීමයි. ශිෂ්‍යයගෙ වයස අවුරුදු 14 දී හෙවත් කණිෂ්ඨ පංක්තියෙදී ඔහුගෙ මානසික තත්ත්වය මැන බලා සුදුසු අධ්‍යාපන අංශයකට බෙදා වෙන් කිරීමේ වැඩ පිළිවෙළක් තමා සකස් කරන බව ගරු අධ්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පන ඇමතිතුමා ධවල පත්‍රිකාවක් මගින් අපට කියා සිටිය. ලබන අවුරුද්දෙ කෙසේ හෝ එය ක්‍රියාත්මක කරන බව එතුමා දැන් කියාගෙන යනව. ඇත්ත වශයෙන්ම එය කරන්නට රජය බලාපොරොත්තු වෙනව නම්, ජ්‍යෙෂ්ඨය සමත් තරුණ තරුණියන් පාඨශාලාවලට පත් කර ඔවුන්ගේ මාර්ගයෙන් ඒ බෙදීම කලොත් මේ රටේ දරුවන්ගේ තත්ත්වය සම්පූර්ණයෙන්ම, ඉතාමත් භයානක තත්ත්වයකට වැටෙනව. එයින් බේරීම සඳහා, මාතර ගරු මන්ත්‍රීතුමා (බී. වයි. තුඩාවේ මයා) විසින් ඉදිරිපත් කර තිබෙන මේ වැදගත් යෝජනාව වහාම බාර ගන්නා ලෙස මම ඉල්ලා සිටිනව.

එක් එක් අධ්‍යාපන අංශවලට ළමයින් බෙදා වෙන් කිරීම සඳහා ළමයින් තෝරා ගැනීමට ඔවුන්ගේ හැකියාවන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ගුරුවරුන්ට තිබිය යුතුයි. ඒ අවබෝධය ලබා ගැනීම සඳහා ගුරුවරුන්ට ‍යම විධියෙ පුහුණුවක් දිය යුතුයි. අද තාත්ත්වයෙ හැටියට ගුරු අභ්‍යාස විද්‍යාල මගින් පමණක් මෙය හරියාකාර ඉෂ්ට කරන්නට පුළුවන්කමක් නැහැ. අද ගුරුවරුන් හැට හැත්තෑ දහක් සිටිනව. එම නිසා, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ යෝජනාව ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන්න එතුමා බලාපොරොත්තු වෙනව නම්, මේ තැපැල් මාර්ගික ගුරු පුහුණු ක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් මාතර ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත් සන්තෝෂයෙන් ස්ථිර කරනව.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**එම්. සිවසිතම්පරම් මයා.**

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

Mr. Deputy Chairman, while supporting the Motion——

**අබ්දුල් බකීර් මාකර් මයා.**

*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*

(Mr. Abdul Bakeer Markar)

Sir, before the hon. Member starts may I point out that there is no Quorum ?

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**

*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*

(Mr. Deputy Chairman of Committees)

The hon. Member has already started.

**එම්. සිවසිතම්පරම් මයා.**

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

While supporting the Motion of the hon. Member for Matara (Mr. Tudawe), I regret to say that the hon. Member for Walapane (Mr. T. B. M. Herath), speaking in support of the Motion, which is a good one, introduced his usual refrain of more Tamils and less Sinhalese getting benefits.

I am sure everyone would like to see that every teacher in this country is a trained teacher. We are sorry to hear that there are not many Sinhalese trained teachers in this country. But why compare that with the percentage of Tamil trained teachers ?

Our objective should be that every teacher, irrespective of the medium in which he teaches, should be a trained teacher, particularly having regard to the fact that a large number of pupil teachers with only the S.S.C. or the G.C.E. certificate have been taken in by the Education Department. It is absolutely essential that they should be trained within a period of two or three years. This cannot be done with the existing training colleges or even by doubling the present number of training colleges. It may, therefore, be necessary to introduce some system of postal training as envisaged in the Motion.

In this connexion I would like to draw the attention of the Hon. Minister of Education, who is unfortunately not present, to the fact that under the new dispensation trained teachers who qualify themselves as graduates are not paid the higher salary that is paid to graduate teachers. Previously it was not so. A teacher who qualified as a graduate was immediately paid the higher salary, but during the last one or one

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

and a half years the practice of the department has been that even if a teacher obtains the higher graduate qualification he is not paid the higher scale of salary. This practice is a disincentive to teachers to qualify themselves.

As I said earlier, I support this Motion, for our objective should be that every teacher should be a trained teacher and not merely a teacher with the S.S.C. or G.C.E. certificate.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**අබ්දුල් බකීර් මාකර් මයා.**

(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கர்)

(Mr. Abdul Bakeer Markar)

May I now point out that there is no Quorum ?

මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට ගණපූර්ණයක් නොමැති වූයෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

சபை கணிக்கப்பட்டு நிறைவெண் இன்மையால், பிரிவு மணி அடிக்கப் பணிக்கப் பட்டது.

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

පසුව ගණපූර්ණයක් නොතුබූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව අ. භා. 5.46 ට, 1967 ජූනි මස 4 වනදා, අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.

பின்னர் நிறைவெண் இல்லாமல் இருந்ததனால் குழுக்களின் உப அக்கிராசனர் நிலையற் கட்டளை இல. 11 இன்படி வினாவின்றிச் சபையை ஒத்தி வைத்தார்.

இதன்படி, பி. ப. 5.46 க்கு, சபை அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க, 1967 ஜூன் 4 ஆம் தேதி ஞாயிற்றுக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

*Later, a Quorum not being present,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 5.46* P.M. *until 2* P.M. *on Sunday, 4th June 1967, pursuant to the Resolution of the House this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org